# දහම් පාසල් අවසාන සහතික පත්‍ර

## විභාගය - 2013(2014)

ලකුණු දීමේ පටිපාටිය

# (01) බුද්ධ චරිතය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**2557 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2013 (2014)**

# 01 - බුද්ධ චරිතය

## ලකුණු දීමේ පටිපාටිය හා යෝජිත ආදර්ශ පිළිතුරු

### ලකුණු දීමේ පටිපාටිය

මේ ප්‍රශ්න පත්‍රයට නියමිත මුළු ලකුණු 100 කි.

එක් ප්‍රශ්නයක් සඳහා නියමිත ලකුණු 20 කි.

එක් ප්‍රශ්නයක (අ),(ආ),(ඉ),(ඊ) යනුවෙන් කොටස් හතරක් ඇත. මේ සඳහා පිළිවෙලින් ලකුණු 04,04,06,06 වශයෙන් දිය යුතු වේ.

ප්‍රශ්න පත්‍රය කොටස් III කින් සමන්විත වේ. මේ කොටස් තුනම නියෝජනය වන සේ අපේක්ෂකයන් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.

මේ අනුව ලකුණු 20 x 5 = 100 වේ.

## යෝජිත ආදර්ශ පිළිතුරු

## I කොටස

01. (අ) බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව සියල්ලට අධිපති මහාබ්‍රහ්මයා ය. මහා බ්‍රහ්මයා විසින් සමාජය මවන ලද ආකාරය ඍග් වේදයේ 10 වැනි මණ්ඩලයේ සඳහන් වේ. ඒ අනුව මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බමුණෝ උපන්හ. බාහුවෙන් ක්ෂත්‍රියයෝ පහළ වූහ. කලවයෙන් වෛශ්‍යයෝ උපන්හ. දෙපතුලින් ශුද්‍රයෝ පහළ වූහ. මෙසේ මහා බ්‍රහ්මයා මුල් කොටගෙන සමාජ ප්‍රභවය සිදු විය. *(ලකුණු 04 යි)*

(ආ) බ්‍රාහ්මණ වර්ණයට හිමි ස්වධර්ම ලෙස මනුස්මෘතියේ සඳහන් වන්නේ, ඉගෙනීම, ඉගැන්වීම, යාග කිරීම, යාග කරවීම, දන් දීම, දන් පිළිගැනීම යන කටයුතු යි.

*(ලකුණු 04 යි)*

(ඇ) බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව වර්ණධර්ම ප්‍රධාන ඉගැන්වීමකි. ඒ අනුව බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යැයි සමාජය ප්‍රධාන කුල හතරකට බෙදිනි. මේ අනුව සමාජය තුළ කුල භේදය පදනම් කොට මිනිසාගේ උසස් බව හෝ පහත් බව තීරණය විය. උසස් යැයි සම්මත කුලවල උපන් මිනිස්සු සමාජයේ වැඩි වරප්‍රසාද හිමිකර ගත්තෝය. පහත් යැයි සම්මත වූ කුලවල ජනයාට ඇතැම්විට මූලික මිනිස් අයිතිවාසිකම් පවා අහිමි විය.

බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර ඒ ඒ කුල වලට හිමි ස්වධර්ම වෙන් වෙන්ව දක්වා තිබේ. ඒ අනුව උසස්ම කුලය වූ බ්‍රාහ්මණ වර්ණයට ඉහළම වරප්‍රසාද හිමි විය. ඔවුහු වරප්‍රසාද ලත් පරම පූජනීය පුද්ගලයෝ වූහ. සමාජ සංවිධානය තුළ ආර්ථික කටයුතු මෙහෙය වීම ද කුල ක්‍රමය තුළම සිදු විය. මේ ආකාරයට වර්ණ ධර්ම හා ස්වධර්ම සමාජ විෂමතාවලට හේතු වූ අයුරු විස්තර කර තිබීම ප්‍රමාණවත් වේ. *(ලකුණු 06 යි)*

(ඈ) වර්ණ ධර්ම හා ස්වධර්ම වලට පදනම වූ නිර්මාණවාදී බ්‍රාහ්මණ චින්තනය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන බුදුසමය අග්ගඤ්ඤ සූත්‍රයේ දී සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවයත් විකාශයත් ඓතිහාසිකව පටිච්චසමුප්පාද සිද්ධාන්තය අනුව සිදු වූ බවත් පෙන්වා දෙයි

- මානව වර්ගයාගේ ඒකත්වය ජීව විද්‍යාත්මක පදනමකින් වාසෙට්ඨ සූත්‍රයේ දී පැහැදිලි කොට ඇත.

යථා එතාසු ජාතිසු - ලිංගං ජාතිමයං පුථු
එවං නත්ථි මනුස්සෙසු - ලිංගං ජාතිමයං පුථු

- තෘණ හා වෘක්ෂලතා ආදී උද්භිද ජාතීන්ට ද සිවුපාවුන්, පක්ෂීන්, මත්ස්‍යයන් වැනි සතුන්ට ද ස්වජාතිමය ලක්ෂණ, ස්වජාතිමය ලිංග ඇත. එහෙත් මිනිසුන් අතර එසේ වෙන් වෙන්ව හඳුනාගත හැකි ස්වජාතිමය ලක්ෂණ, ස්වජාතිමය ලිංග නොපෙනෙන බවත් ඉගැන් වේ.
- අස්සලායන සූත්‍රයේ දී විශ්ව ගත අනෙක් මිනිසුන්ගේ උපත සිදුවන ආකාරයටම බමුණු [illegible] බමුණන් මහ බඹුගේ මුඛයෙන් උපන් බව පැවසීම අර්ථ ශූන්‍ය බවත්, එය මහ බඹුට කරන අවමානයක් බවත් පෙන්වා දී තිබේ.

- වර්ණ භේදයකින් තොරව කර්මවල ඵල විපාක ලැබෙන බව වරක් බුදු රජුන් මධුර රජතුමාට කළ ප්‍රකාශනයෙන් පැහැදිලි වේ.

වසල සූත්‍රයේ දී
නජච්චා වසලෝ හොති - නජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො
පුද්ගලයෙකුගේ හොඳ නොහොඳ තීරණය වන්නේ ඔහුගේ ක්‍රියාවෙන් මිස උපතින් නොවන බව දක්වා තිබේ.
මෙම කරුණු අතරින් සමබරව පිළිතුරු සකස් විය යුතු වේ. (ලකුණු 06 යි)

02. (අ) රාජාණ්ඩු පාලන ක්‍රමය,
සමූහාණ්ඩු පාලන ක්‍රමය හෙවත් ගණ තන්ත්‍ර පාලන ක්‍රමය (ලකුණු 04 යි)

(ආ) මගධ රාජධානිය, කෝසල රාජධානිය, වත්ස රාජධානිය හා අවන්ති රාජධානිය (ලකුණු 04 යි)

(ඉ) මගධ රාජ්‍යයෙහි අගනුවර වූයේ රජගහ නුවර යි. පළමුව බිම්බිසාර රජතුමා එහි පාලකයා විය. ඔහුගේ ඇවෑමෙන් අජාසත්ත රජ විය.විශාල රාජධානියක් වූ මගධය උතුරින් ගංගා නම් ගඟින් ද නැගෙනහිරින් චම්පා නදියෙන් හා වින්ධ්‍යා කඳු වැටියෙන් ද බටහිරින් සෝණ නදියෙන් ද සීමා වූවකි. බුද්ධ කාලයේ පැවති සොළොස් මහා ජනපද අතර පැවති අංග ජනපදය ද ඇතුළත් වූයේ මගධ රාජ්‍යයට යි. විශාලත්වයෙන් යොදුන් තුන් සියයක් වූ එහි ගම් අසූ දහසක් පැවති බව සඳහන් වේ. හැම අතින්ම සමෘද්ධිමත් වූ මගධ රාජ්‍යය ගිජ්ජකූට, ඉසිගිලි, වේභාර, වේපුල්ල හා පාණ්ඩව යන පස්වැදෑරුම් මහා පර්වතවලින් ස්වභාවිකවම ආරක්ෂා වූවකි.
බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූයේ ද මගධ රාජ්‍යයේ වන අතර බුදු සසුනේ පළමු ආරාම පූජාව වූ බිම්බිසාර රජුගේ වේළුවනාරාම පූජාව ද සිදු වූයේ මගධයේ දී ය. (ලකුණු 06 යි)

(ඊ) බුද්ධකාලීනව පැවති සමූහාණ්ඩු නවයකි.
1. ශාක්‍යයන්ගේ කපිලවස්තුව
2. ලිච්ඡවීන්ගේ වේසාලිය
3. මල්ලයන්ගේ කුසිනාරාව සහ පාවා නුවර
4. භග්ගයන්ගේ සුංසුමාරගිරිය
5. බුලීවරුන්ගේ අල්ලකප්පය
6. කාලාමයන්ගේ කේසපුත්තය
7. කෝලියන්ගේ රාම ග්‍රාමය
8. මෞර්යයන්ගේ පිප්ඵලී වනය
9. විදේහයන්ගේ මිථිලාව යනු යි.

සප්ත අපරිහානීය ධර්ම,
1. නිතර රැස්වීම
2. සමගිව රැස්ව, සමගිව කටයුතු කොට සමගිව විසිර යෑම.
3. නොපැනවූ නීති නොපැනවීම හා පැනවූ නීති නොකැඩීම.
4. වැඩිහිටියන්ට ගරු කිරීම හා ඔවුන්ගේ උපදෙස් පිළිපැදීම.
5. කුල කාන්තාවන් ආරක්ෂා කිරීම.
6. පූජනීය ස්ථානවලට කඩ නොකොට අවශ්‍ය වතාවත් කිරීම.
7. ගුණවත් රහතුන්ට සිය රාජ්‍යයෙහි නිසි රැකවරණ සැලසීම.
මෙම අපරිහානීය ධර්ම රාජ්‍ය පාලනයෙහි වැදගත් වන ආකාරය දක්වා තිබිය යුතු වේ. (ලකුණු 06 යි)

03. (අ) පරිබ්‍රාජක, අචේලක, ආජීවක, ජටිල, නිගණ්ඨ ආදි කණ්ඩායම් අතරින් හතරක් අපේක්ෂා කෙරේ. *(ලකුණු 04 යි)*

(ආ)

- පූර්ණකස්සප
- මක්ඛලිගෝසාල
- අජිතකේශකම්බල
- පකුධකච්චායන
- සංජය බෙල්ලට්ඨිපුත්ත
- නිගණ්ඨනාථපුත්ත යනු යි.

*(ලකුණු 04 යි)*

(ඉ) මෙතුමා පරම අවිහිංසාවාදී ධර්මයක් ඉගැන්වූ ශාස්තෘවරයා ය. දුෂ්කර ව්‍රත රැකීමෙන් සියලු කර්ම ගෙවා අවසන් කොට කේවලත්වය නම් වූ විමුක්ති සුවය විඳ ගැනීමට උගන්වයි. මෙතුමාගේ ඉගැන්වීම අංග හතරකින් යුක්ත ශීල සංවරයකි.

1. සියලු සිසිල් දිය පාවිච්චි කිරීමෙන් වැලකුණේ වෙයි (සබ්බ වාරි වාරිතො)
2. සියලු සංවරයෙන් යුක්ත වූයේ වෙයි (සබ්බ වාරියුතො)
3. සියලු වැළකිය යුතු පවින් වැළකුණේ වෙයි (සබ්බ වාරිධුතො)
4. සියලු පව්කම් විඳ නිම වූ විමුක්තියෙන් යුක්ත වූයේ වෙයි. (සබ්බ වාරි පුතො) යනු යි.

*(ලකුණු 06 යි)*

(ඊ) බුද්ධ කාලීන භාරතීය ආගමික හා දාර්ශනික ඉගැන්වීම් අන්තවාද හා දෘෂ්ටිවාද නියෝජනය කොට ඇත. ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් අතර පූර්ණකාශ්‍යප අකිරිය වාදියෙකි. කුසලාකුසල කර්ම ප්‍රතික්ෂේප කරයි. මක්ඛලිගෝසාල නියතිවාදියෙකි. සත්වයාගේ කෙලෙසීමට හෝ පිරිසිදු වීමට හේතු ප්‍රත්‍යයක් නැති බව කියයි. අජිත කේශකම්බල භෞතිකවාදියෙකි. කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක නැතැයි කියයි. පකුධකච්චායන අකිරියවාදියෙකි. එමෙන්ම භෞතිකවාදියෙකි. සංජයබෙල්ලට්ඨිපුත්ත අමරාවික්ඛෙපවාදියෙකි. නිගණ්ඨනාතපුත්ත පරම අවිහිංසාවාදියෙකි. දැඩි ව්‍රත චර්යා මගින් ආත්මය තාපනය කළයුතු බව කියයි.

එහෙත් බුදුසමය අන්තවාදී හා දෘෂ්ටිවාදී ඉගැන්වීම් බැහැර කරයි. අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානු යෝගය බැහැර කරන අතර අංග අටකින් යුක්ත, ශික්ෂා තුනකින් යුක්ත මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් නිවන් ලැබිය හැකි නිර්වාණ මාර්ගය පෙන්වා දී ඇත.

මෙහිදී මධ්‍යම ප්‍රතිපදාව නිර්වාණ මාර්ගය ලෙස දක්වා තිබීම ප්‍රමාණවත් වේ.

*(ලකුණු 06 යි)*

## II කොටස

04. (අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය

- සත් පියුම් පිට ගමන් කිරීම.
- අග්ගොහමස්මි ලෝකස්ස........... ගාථාව ප්‍රකාශ කිරීම.
- ඉපදී දින හතෙන් මව කළුරිය කිරීම ආදී කරුණු වැදගත් වේ.

නම් තැබීම

- සුතට උගත් පඬිවරුන් අට දෙනෙකු සහභාගි වීම.
- ඉන් හත් දෙනෙකු ගිහිගෙයි විසුවොත් සක්විති රජ වන බවත්, පැවිදි වුවොත් බුදු වෙන බවත් ප්‍රකාශ කිරීම.
- කොණ්ඩඤ්ඤ බමුණා ඒකාන්තයෙන් ම බුදු වෙන බව ප්‍රකාශ කිරීම ආදී කරුණු ඇතුළත් වී තිබීම.

වප් මඟුල් උත්සවය

- කිරි මවුවරුන්ගේ රැකවරණය මැද සිටි සිදුහත් කුමරු සියල්ලන් වප් මඟුල් උත්සවය නරඹද්දී භාවනානුයෝගිව සිටීම
- සුද්ධෝදන රජුගේ දෙවැනි වර නමස්කාර කිරීම ආදී කරුණු වැදගත් වේ.

විවාහය හා ශිල්ප දැක්වීම

- ශාක්‍ය ඥාතීන් ඉදිරියේ සඟු ශිල්ප, දුනු ශිල්ප ප්‍රදර්ශනය කිරීම.
- සියලු ඥාතීන් විශ්මයට පත් වීම.
- සුප්පබුද්ධ රජු සිය දියණිය වූ යශෝධරාව කුමරුට විවාහ කර දෙන්නට ඉදිරිපත් වීම.
- සොළොස් වැනි වියේ සිටි සිදුහත් කුමරුගේ අභිෂේකයත් යශෝධරා කුමරිය විවාහ කර ගැනීමත් එකම දින සිදු වීම වැදගත් කරුණු වේ.

*(ලකුණු 04 යි)*

(ඈ) බාධක මැඩගෙන ක්‍රියා කිරීම, අධිෂ්ඨානය, ධෛර්ය ඇතිව ක්‍රියා කිරීම, වීර්යයෙන් ක්‍රියා කිරීම
බාධක ජය ගැනීමට ඉවසීමෙන් කටයුතු කිරීම
කරුණාව, දයාව ආදී මානුෂීය ගුණාංග ඇතිව ජීවත් වීම ආදී කරුණු ය.

*(ලකුණු 04 යි)*

(ඉ)

| | | | |
|---|---|---|---|
| | මහල්ලෙක් | - | උපන් සත්ත්වයා මහළු බවට පත් වීමෙන් ජරාවට පත්වන බවත් |
| | ලෙඩෙක් | - | නිරන්තරයෙන් ලෙඩ රෝග (ව්‍යාධි)වලට ගොදුරුවන බවත් |
| | මළ මිනියක් | - | අනුක්‍රමයෙන් මරණයට (මරණ) පත්වන බවත් |
| | පැවිදි රුවක් | - | ජීවිතයේ යථාර්ථය තේරුම් ගෙන ගමන් කිරීමට (ජරා - ව්‍යාධි - මරණ වලින් තොරවූ) සැනසීමේ මගක් ඇති බවත් ප්‍රකාශ වේ. |

*(ලකුණු 06 යි)*

(ඊ)

- චතුරංග සමන්නාගත වීර්යයෙන් කටයුතු කිරීම
- මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් සත්‍යාවබෝධය ලැබීම කෙටියෙන් විස්තර විය යුතු වේ. *(ලකුණු 06 යි)*

05. (අ) දුක්ඛ ආර්ය සත්‍යය
දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය යනු යි. *(ලකුණු 04 යි)*

(ආ) ප්‍රභේද තුනකි.
කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනු යි. *(ලකුණු 04 යි)*

(ඉ) ශරීරයට අධික ලෙස දුක් පීඩා දෙමින් විමුක්තිය සෙවීම අත්තකිලමථානුයෝගය ලෙසත්, අධික ලෙස සැප සම්පත් විඳිමින් ජීවත් වීම කාම සුඛල්ලිකානුයෝගය ලෙසත් එම අන්ත දෙක අනාර්ය, හීන, ග්‍රාම්‍ය වූවක් බවත් දක්වමින් බුදුසමය බැහැර කරයි.
(ලකුණු 06 යි)

(ඊ) මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් නිවන් අවබෝධ කළ හැකි ය. ඒ සඳහා ත්‍රිශික්ෂාවකින් හා අංග අටකින් යුක්ත ප්‍රතිපදාවක යෙදිය යුතු වේ. එය ගිහි-පැවිදි භේදයකින් තොරව අනුගමනය කළ හැකි ආර්ය මාර්ගයකි. එහි වැදගත්කම විස්තර විය යුතු වේ.
(ලකුණු 06 යි)

06. (අ) පස්වග මහණුන් වහන්සේ ත්,
යසකුල පුත්‍රයාගේ යහළුවන් පනස් හතර දෙනාත්, යසකුල පුත්‍රයාත් වේ. (ලකුණු 04යි)

(ආ) චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන ද්වෙ අගමිත්ථ.
" මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස ගම් නියම් ගම් හි හැසිරෙව්, දෙදෙනෙක් එකමග නොයව් " යනුවෙනි.
(ලකුණු 04 යි)

(ඉ) උරුවෙල් දනව්වෙහි උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප යැයි තුන් බෑ ජටිලයෝ සිය පිරිස සමග විසූහ. ඔවුහු ජනතාව අතර සම්භාවනාවට පාත්‍ර වූහ. බුදුරදුන් අනුක්‍රමයෙන් ජටිල ප්‍රධානීන් දමනය කළහ. ඔවුන් දමනය කිරීම සඳහා බුදුරදහු ඍද්ධි ප්‍රාතිහාර්ය ද පෑහ. අනතුරුව පන්සියයක් පිරිස සමග උරුවෙල කාශ්‍යප ද තුන්සියයක් පිරිස සමග නදී කාශ්‍යප ද දෙසියක් පිරිස සමග ගයා කාශ්‍යප ද බුදුරදුන් වෙත ගොස් එහි භික්ෂු පැවිදි උපසම්පදාව ලැබූහ. (ලකුණු 06 යි)

(ඊ) පළමු රහත් සැට නම අමතා බුදුරදුන් කළ අනුශාසනාව වූ චරථ භික්ඛවෙ චාරිකං...............යන අනුශාසනාවත්, එය වර්තමාන ලෝකයට අදාළ වන ආකාරයත් දක්වා තිබීම අවශ්‍ය වේ. (ලකුණු 06 යි)

07. (අ) භද්දිය අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත යන කුමාරවරු ද උපාලි කපුවා ද වේ.
( ලකුණු 04 යි)

(ආ)

- ශාක්‍යයන්ගේ මානය බිඳීම (යමක මහා ප්‍රාතිහාර්ය පෑමෙන්) චතුරංග සමන්නාගත වීර්යයෙන් කටයුතු කිරීම
- රජ ගෙදර දී දහම් ඇසීමෙන් සුදොවුන් රජු සකදාගාමී වීම හා මහා ප්‍රජාපතීගෝතමිය සෝවාන් වීම.
- යශෝදරාවට චන්නකින්නර ජාතකය දේශනා කිරීම හා යශෝදරාවට පැවිදි වීමේ අදහස පහළවීම.
- නන්ද කුමරුගේ පැවිද්ද සිදුවීම.
- රාහුල කුමරුගේ පැවිද්ද සිදුවීම.
- මහා ධම්මපාල ජාතකය ඇසූ පියරජු අනාගාමී වීම. ආදී කරුණු අතරින් හතරකි.

(ලකුණු 04 යි)

(ඉ) රජගහනුවර සිටුවරයාගේ මිත්‍රයෙකු වූ සුදත්ත සිටුවරයා සැවැත්නුවරට ගොස් ජේත නම් කුමාරයාගේ විශාල උද්‍යානය කහවනු අතුරා මිලට ගෙන එහි සියල්ලෙන් සපිරි මහා ජේතවනාරාමය ඉදිකරවිය. බුදුරදහු රජගහනුවරින් විශාලාවට වැඩමවා එහි දෙසතියක් වැඩ සිට සැවැත්නුවර බලා භික්ෂු සංඝයා සමග වැඩම කළහ. මහත් ගෞරවයෙන් යුක්තව බුදුරදුන් පිළිගත් සුදත්ත සිටුවරයා තමා විසින් ගොඩනංවන ලද සුවිසල් ජේතවනාරාමය බුදු පාමොක් මහා සංඝයාට පූජා කළේය.

බුදුරදහු සිය ජීවිතයේ වැඩි කාල පරිච්ඡේදයක් ගත කළේ සැවැත්නුවර ජේතවනාරාමයේ ය. එයට හේතුව වූයේ අනේපිඬු සිටුතුමාගේ ශ්‍රද්ධාසම්පන්නවය යි. තමන් වහන්සේ වෙත පිරිස් සමග පැමිණි බොහෝ භික්ෂූන්ට ආවාස පහසුකම් හා ප්‍රත්‍යය පහසුකම් නොඅඩුව පැවතිම, විශාල පිරිසකට රැස්විය හැකි ශාලා පහසුකම් තිබීම, දුර බැහැර සිට පැමිණි බොහෝ දෙනාට පහසුවෙන් බුදුරදුන් හමුවිය හැකි ස්ථානයක් වීම ආදිය නිසා බුදුසසුනේ සීඝ්‍ර ව්‍යාප්තියට ජේතවනාරාම පූජාව ඉවහල් වී තිබේ.

(ලකුණු 06 යි)

(ඊ) බුදුරදහු ආනන්දාවගේ මාතෘත්වයට කරන ලද ගෞරවයක් ලෙස ද බුද්ධියට කරන ලද උපහාරයක් ලෙස ද අෂ්ට ගරු ධර්ම පනවා මහාප්‍රජාපතී ගෝතමීය ප්‍රමුඛ කාන්තාවන් පන්සියයකට පැවිදි - උපසම්පදාව ලබා දුන්හ. මෙයින් ශාසනයේ කාන්තා පැවිද්ද ආරම්භ විය. මෙය බුදුරදුන්ගේ සහනශීලීත්වයේ ප්‍රතිඵලයක් වන අතර බුද්ධ ශාසනයේ ඉදිරි පියවරක් ද වී තිබේ. එසේම ඉතිහාසයේ කාන්තාවන් ලද විශිෂ්ට ජයග්‍රහනයක් ද වූයේ ය. කෙටියෙන් පැහැදිලි කිරීම ප්‍රමාණවත් වේ. (ලකුණු 06 යි)

## III කොටස

08. (අ) ශාසනය ආරම්භ වී කල් ගත වී තිබීම (රත්තඤ්ඤු මහත්තතා)
ශාසනය නොයෙක් අයුරින් පැතිර විපුල බවට පත් වී තිබීම (වෙපුල්ල මහත්තතා).
ශාසනයට නොයෙක් ලාභ සත්කාර ලැබීම(ලාභග්ග මහත්තතා).
ශාසනයේ උගතුන් බහුල වීම නිසා විවිධ මතවාද ඇති වීම(බාහුසච්ච මහත්තතා) යනු යි.

(ලකුණු 04 යි)

(ආ) බුද්ධත්වයෙන් නව වැනි වස බුදුරදහු කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වස් විසූහ. මෙම කාල පරිච්ඡේදයේ දී එහි වාසය කළ ධර්මධර භික්ෂුවක් හා විනයධර භික්ෂුවක් අතර ඇති වූ මතභේදයක් මුල්කොට භික්ෂූහු භේද වූහ. අනතුරුව දායකයෝ ද දෙපිරිසකට බෙදී මහත් අරගලයක් ඇතිකර ගත්හ. මෙය මුල් කොට බුදුරදුන් පාරිලෙය්‍ය වනයට වැඩම කිරීම හා කලහය සන්සිඳවූ ආකාරය මෙහි විස්තර විය යුතු වේ.

(ලකුණු 04 යි)

(ඉ)

- බුද්ධත්වයෙන් විසි වැනි වසරේ දී භික්ෂූන් උදෙසා විනය ශික්ෂාපද පැනවීම.
- උපෝසථ දිනයෙහි සංඝයා එක් රැස් වී ප්‍රාතිමෝක්ෂය උදෙසීමට නියම කිරීම.
- සංචාරක භික්ෂු ජීවිතය ආරාමික සංස්ථාවක් බවට පත්වීම.
- ආරාමික භික්ෂු සංස්ථාවේ පැවැත්ම උදෙසා වත් ඇතුළත් ඛන්ධක විනය පැනවීම.
- ආරාමික භික්ෂු සංස්ථාවේ පැවැත්මට ආචරිය, උපජ්ඣායක, සද්ධිවිහාරික, අන්තේවාසික යන වත් හඳුන්වා දීම ආදිය වේ.

(ලකුණු 06 යි)

(ඊ) බුදුරදුන්ගේ අනුශාසනය වූයේ
'සමග්ගා හොථ - මා විවදථ -සමගි වව් - විවාද නොකරව්' යන්න යි. මෙයින් සමගියෙන් වාසය කිරීම අගය කොට ඇත.

- එසේම ධම්මපදයෙහි
'සුඛා සංඝස්ස සාමග්ගී - සමග්ගානං තපො සුඛො'- සංඝයාගේ සමගිය සැපයකි.
- සමගි වූවන්ගේ තපස ද සැපයකි යනුවෙන් සමගිය තුළ සැපය ඇතැයි දේශනා කොට ඇත. එබැවින් ශාසනික අර්බුද සමනය කිරීමෙහි ලා මෙම දේශනා උපයෝගි වන අයුරු දක්වා තිබිය යුතු වේ.

(ලකුණු 06 යි)

09. (අ)

- සැරියුත් තෙරුන්, මුගලන් තෙරුන්, ආනන්ද තෙරුන්, මහාකාශ්‍යප තෙරුන් ආදී ශ්‍රාවකවරුන් අතරින් දෙදෙනෙකු.
- මහාප්‍රජාපතිගෝතමී තෙරණිය, ඛේමා තෙරණිය, උප්පලවණ්ණා තෙරණිය, පටාචාරා තෙරණිය, භද්දකච්චානා තෙරණිය ආදී තෙරණිවරුන් අතරින් දෙදෙනෙකු.

(ලකුණු 04 යි)

(ආ)

- සැරියුත් තෙරුන් - මහා ප්‍රාඥයන් අතර අග තැන.
  මුගලන් තෙරුන් - සෘද්ධිමතුන් අතර අග තැන.
  ආනන්ද තෙරුන් - උපස්ථායක, ධාරණ ස්මෘති ඇතියන්, වීර්යවන්තයන් අතර අග තැන
  මහාකාශ්‍යප තෙරුන් - ධුතවාදීන් අතර අග තැන.

- මහා ප්‍රජාපතිගෝතමී තෙරණිය - චිරරාත්‍රඥයන් අතර අග තැන.
  ඛේමා තෙරණිය - මහා නුවණැතියන් අතර අග තැන.
  උප්පලවණ්ණා තෙරණිය - සෘද්ධිමත් තෙරණියන් අතර අග තැන.
  පටාචාරා තෙරණිය - විනයධර තෙරණියන් අතර අග තැන.
  භද්දකච්චානා තෙරණිය - මහා අභිඥා නුවණ ඇතියන් අතර අග තැන.

(ලකුණු 04 යි)

(ඉ)

- 'යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ
  තෙසඤ්ච යො නිරෝධො- එවං වාදී මහාසමණො

  යම් ධර්මයක් හේතුන් ප්‍රභව කොට ඇත්තේ ය. එහි හේතුව තථාගතයන් වහන්සේ වදාරණ සේක. එහි නිරෝධය ද තථාගතයන් වහන්සේ ප්‍රකාශ කරති. බුදුහු එබඳු වාද ඇති කෙනෙකි' යන ගාථාව අසා උපතිස්ස පරිබ්‍රාජකයා හා කෝලිත පරිබ්‍රාජකයා යන දෙදෙනා සෝවාන් ඵලයෙහි පිහිටියහ.

- පසුව පරිබ්‍රාජකයන් ප්‍රමුඛ වූ 250 ක් පිරිස සමඟ බුදුරදුන් වෙත පැමිණි උපතිස්ස හා කෝලිත දෙදෙනා එහි භික්ෂු මහණ උපසම්පදාව ලැබූහ.
- උපතිස්ස - සැරියුත් නමින් ද කෝලිත මුගලන් නමින් ද ප්‍රකට වූහ.
- සැරියුත් තෙරුන් ධම්මසේනාපති තනතුරින් ද, දකුණත් සවු තනතුරින් ද, මහා ප්‍රාඥයන් අතර අග තනතුරින් ද පිදුම් ලැබූහ.

- මුගලන් තෙරුන්, වමත් සවු තනතුරින් ද, සද්ධිමත් භික්ෂූන් අතර අගතනතුරින් ද පිදුම් ලැබූහ.
- ගැඹුරු දහම් කොටස් සරල ලෙස විස්තර කිරීමේ විශේෂ හැකියාවක් සැරියුත් - මුගලන් දෙදෙනා වහන්සේ තුළම පැවතුණි.
- ත්‍රිපිටකයේ සූත්‍ර දේශනා අතර සැරියුත් - මුගලන් දෙදෙනා වහන්සේ විසින් දේශනා කළ සූත්‍ර රාශියක් තිබේ.
- භික්ෂු පිරිස් අතර සමගිය ආරක්ෂා කිරීමටත්, භික්ෂු පිරිස් අතර ප්‍රසාදය දිනා ගැනීමටත් අගසවු දෙදෙනා වහන්සේ සමත් වූහ.
- මේ කරුණු ඇතුළත් ව පිළිතුර සකස් විය යුතු වේ. *(ලකුණු 06 යි)*

(ඊ)

- මහාකාශ්‍යප මහරහතන් වහන්සේ හා ආනන්ද තෙරුන් විසින් සද්ධර්මයේ චිර පැවැත්ම උදෙසා ක්‍රියා මාර්ගයක් ගෙන තිබේ.
- සද්ධර්මය එක්රැස් කොට පළමු ධර්ම සංගායනාව පැවැත් වීම.
- සද්ධර්මය සූත්‍ර පිටකය ඇතුළත් කොට නිකාය වශයෙන් දීඝ, මජ්ඣිම, සංයුක්ත, අංගුත්තර, හා ඛුද්දක වශයෙන් කොටස් බෙදා දැක්වීම.
- එක් රැස් කළ සද්ධර්මයේ පැවැත්ම උදෙසා භාණ්ඩ සම්ප්‍රදායක් ගොඩ නැගීම.

- දීඝ නිකාය - ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍ය පිරිසට ද,
  මජ්ඣිම නිකාය - සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසට ද,
  සංයුක්ත නිකාය - මහා කාශ්‍යප තෙරුන් වහන්සෙට හා උන්වහන්සේගේ ශිෂ්‍ය පිරිසට ද,
  අංගුත්තර නිකාය- අනුරුද්ධ තෙරුන් ඇතුළු ශිෂ්‍ය පිරිසට භාරදුන් අතර, එම නිකායන්හි ආරක්ෂාවත් පැවැත්ම උදෙසා භාණක පරපුරක් ගොඩනැංවීම.
  ආදි කරුණු මෙහිලා වැදගත් වේ.

*(ලකුණු 06 යි)*

10. (අ) අනේපිඬු සිටුතුමා, චිත්ත ගහපති, උග්ගහ ගහපති, බිම්බිසාර රජ, පසේනදි කොසොල් රජු ආදීන්

විශාඛා උපාසිකාව, මල්ලිකා, සුප්පවාසා, සුජාතා, සාමාවතී බිසව ආදීන්

*(ලකුණු 04 යි)*

(ආ)

1. ඇතුළත ගිනි පිටතට නොදිය යුතු ය.
2. පිටත ගිනි කිසිවිටක ඇතුළට නොගත යුතු ය.
3. දෙන්නහුටම දිය යුතු ය.
4. නොදෙන්නහුට නොදිය යුතු ය.
5. දෙන්නහුට ද නොදෙන්නහුට ද දිය යුතු ය.
6. සුවසේ හිඳිය යුතු ය.
7. සුවසේ අනුභව කළ යුතු ය.

*(ලකුණු 04 යි)*

(ඉ) අනේපිඬු සිටුතුමා

- සැවැත් නුවර සුමන සිටුවරයාගේ පුතා සුදත්ත නම් විය. පියාගෙන් පසුව ඔහුට සිටු තනතුර ලැබුණේ ය.
- සැවැත් නුවර ජේත කුමාරයාගෙන් කහවනු අතුරා උද්‍යානය මිලට ගෙන ජේතවනාරාමය ගොඩ නැංවිය. එය බුදුරදුන් විෂයෙහි සැදැහෙන් පූජා කළ අතර බුදු සසුනේ උන්නතිය උදෙසා සිය ධනය කැප කළේ ය.
- මහ සඟන උදෙසා නිවසෙහි නිතර අසුන් පනවා තිබීමත්, නිතර දන් පැන් පූජා කිරීමත් විශේෂ වූවකි.
- අනාථයන් උදෙසා නොයෙක් දේ පරිත්‍යාග කළ හෙයින් සිටුවරයාට අනාථ පිණ්ඩික යැයි විශේෂණ නාමයක් එක් විය.
- මේ සිටුවරයාගේ කණිෂ්ඨ දියණිය වූ සුමනා දේවිය ද පියා අනුව යමින් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බොහෝ පිංකම් කළාය.
- අනේපිඬු සිටුතුමාගේ ජිවිතයේ අවසන් මොහොතෙහි සැරියුත් තෙරුන් වැඩම කොට ඔහුට දහම් දෙසීම ද වැදගත් වූවකි.

විශාඛා දේවිය

- විශාඛාව අංග රට භද්දිය නුවර මෙණ්ඩක සිටුවරයාගේ හා සුමනා දේවියගේ දියණිය යි. ඇය සත් හැවිරිදි වයසේ දී බුදුරදුන්ගෙන් බණ අසා සෝවාන් වූවාය.
- මිගාරමාතා නමින් හඳුන්වන්නේ ද විශාඛාවය.
- ඇය දිනක් විහාරයේ අමතක වී පැමිණි මෙලපළඳනාව විකුණා එම මුදලින් ජේතවනාරාමය බඳු විහාරයක් කරවා බුද්ධ ප්‍රමුඛ මහ සඟනට පූජා කළාය.
- සැවැත් නුවර පූර්වාරාමය හෙවත් මිගාරමාතු ප්‍රාසාදය නමින් එය හැඳින්වේ.
- නිතරම සිය නිවසෙහි සංඝයා උදෙසා අසුන් පනවා තිබිණි.
- දන්පැන් පූජා කිරීමත්, ශ්‍රද්ධාවෙන් තෙරුවන් ඇසුරු කිරීමත් නිසා බුදුරදුන්ගේ හා මහාශ්‍රාවකවරුන්ගේ ප්‍රසාදය දිනාගත් තැනැත්තියකි. ඇය ශාසනයේ අභිවෘද්ධිය උදෙසා කැප වී ක්‍රියා කළාය.

*(ලකුණු 06 යි)*

(ඊ)

- සුචරිතයෙහි හැසිරෙමින් තෙරුවන් උදෙසා ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීම.
- සද්ධර්මයේ ආරක්ෂාව පිණිස භික්ෂූන් වහන්සේට ධෛර්ය දෙමින් සිවුපසයෙන් උපස්ථාන කිරීම.
- වෙහෙර විහාර ආරක්ෂා කර ගැනීම හා අභිනවයෙන් ගොඩ නැංවීම.
- ශාසනයට සිය දරුවන් පූජා කිරීමෙන් භික්ෂු ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාමට දායකවීම.
- ධර්ම විනය ඇතුළත් ත්‍රිපිටක පාලිය ආරක්ෂා කරගැනීමට භික්ෂූන් වහන්සේට ධෛර්ය දීම.
- ධර්ම - විනය හා භාෂා ශාස්ත්‍රීය පර්යේෂණවල යෙදීමට අවශ්‍ය මූල්‍යමය [illegible]
  ආදී කරුණු විචාරාත්මකව ඇතුළත් වී තිබිය යුතු වේ.

*(ලකුණු 06 යි)*

*****

# දහම් පාසල් අවසාන සහතිකපත්‍ර විභාගය - 2014 (2015)

ලකුණු දීමේ පටිපාටිය

## (01) - බුද්ධ චරිතය

# 2558 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2014 (2015)

## (01) බුද්ධ චරිතය

## ලකුණු දීමේ පටිපාටිය

1. (අ) බ්‍රාහ්මණ කුලය, ක්ෂත්‍රිය කුලය, වෛශ්‍ය කුලය හා ක්ෂුද්‍ර කුලය යනුයි.

*(ලකුණු 04 යි)*

(ආ) ප්‍රජා පාලනය, දන්දීම, යාග කිරීම, කාමයෙහි නො ඇලීම ඉගෙනීම යනුයි.

*(ලකුණු 04 යි)*

(ඉ) බුද්ධකාලීන සමාජයේ බ්‍රාහ්මණ මතයට අනුව කාන්තාව මූලික මිනිස් අයිතිවාසිකම් පවා අහිමි වූ තත්ත්වයක පසු වූවාය. එහි දී අධ්‍යාපනික අංශය, සාමාජික අංශය, දේශපාලනික අංශය, ආගමික අංශය, ආර්ථික අංශය හා වෘත්තීය අංශය ආදී විවිධ අංශ යටතේ කිසිදු අයිතිවාසිකමක් හිමි නොවීය.

- මවක හෝ බිරිඳක ලෙස හිමිවිය යුතු නිසි තැන නොලැබීම.
- පිරිමින්ගේ විනෝදාස්වාදය සඳහා කාන්තාව මවන ලදැයි සැලකීම.
- ආගමක් ඇදහීමට හෝ එයට අදාළ වත් පිළිවෙත් කිරීමට හෝ නිදහස නොලැබීම.
- සිය කැමැත්තට අනුව ක්‍රියා කිරීමේ හැකියාව අහිමි කිරීම.
- කුඩා කල පියා යටතේ ද විවාහ වූ කල ස්වාමියා යටතේ ද ස්වාමියා මළ කල පුතා යටතේ ද ජීවත් විය යුතු යැයි සැලකීම.
- ස්වාමියා මළ කල සති පූජාව පැවැත්වීම ආදී කරුණු අතරින් ප්‍රමාණවත් පිළිතුරක් සකස් විය යුතුය.

*(ලකුණු 06 යි)*

(ඊ) බුදුසමය විසින් කාන්තාවට ගෞරවාන්විතව සමාජයේ කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සකසා දෙන ලදී. එහිදී භික්ෂුණියක වශයෙන්, මවක වශයෙන්, ගෘහණියක වශයෙන් හා උපාසිකාවක වශයෙන් කාන්තාවගේ අගය පෙන්වා දී ඇත.

බුදු සමයේ භික්ෂුණී ශාසනය ආරම්භ කිරීම තුළ භික්ෂුණියක ලෙස කාන්තාවගේ ආගමික අයිතිය උසස් ලෙස තහවුරු කොට ඇත.

- භික්ෂුණියක වශයෙන් බුද්ධිය දියුණු කිරීමෙන් විචක්ෂණව අවස්ථාවෝචිතව ක්‍රියා කරන කාන්තාව ද පණ්ඩිත වන බවත් පෙන්වා දීමෙන් පිරිමියා හා සමානත්වයෙන් ආගමික අයිතිය තහවුරු කිරීම.
- න සො සබ්බෙසු ඨානෙසු - ආදී ගාථාවන්.
- දක්ෂතා ඇති භික්ෂුණීන්ට අග්‍රතනතුරු ප්‍රදානය කිරීම ආදිය.
- මවක ලෙස ලැබූ නිදහස තුළින් කාන්තාව නිවසේ ප්‍රධානත්වයට පත් කිරීම හා පූජනීයත්වයට පත් කිරීම
- බ්‍රහ්මාති මාතා පිතරො - මව්පියන් බ්‍රහ්ම ලෙස සැලකීම.
- පුබ්බාචරියාති වුච්චරෙ - මව්පියන් පෙර ගුරුවරු ලෙස සැලකීම.
- ආහුණෙය්‍යාච පුත්තානං - මව්පියන් ආහුණෙය්‍ය ලෙස සැලකීම.
- පජාය අනුකම්පකා - ප්‍රජාවට අනුකම්පා කිරීම ආදිය.
- සිඟාලෝවාද සූත්‍රයේ මව්පිය දූ දරු යුතුකම් මගින් පෙර දිශාව ලෙස සලකා කටයුතු කිරීම ආදිය.
- ගෘහණියක වශයෙන් ලැබූ නිදහස තුළ කාන්තාව නිවසේ ස්වාමියා හා සමගාමිනියක් වීම.

- සිගාලෝවාද සූත්‍රයෙහි ස්වාමි භාර්යා යුතුකම හා අයිතිවාසිකම් තුළින් පශ්චිම දිශාව ලෙස සැලකීම.
- සත්තභරියා සූත්‍රයේ භාර්යාවන් සත්දෙනා.
- සංවාස සූත්‍රයට අනුව භාර්යාවගේ ලක්ෂණ පෙන්වා දීම ආදිය.
- උපාසිකාවක ලෙස ද ලැබූ නිදහස.

**මෙම කරුණු අතරින් සමස්තයක් සේ සලකා පිළිතුර සකස් වී තිබිය යුතුය.**

*(ලකුණු 06 යි)*

2. (අ) කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, ධීවර කටයුතු, භාණ්ඩ බෙදා හැරීම, වෙළෙඳාම, රාජ්‍ය සේවය, වෙනත් කර්මාන්තවල යෙදීම ආදියෙන් හතරකි.

*(ලකුණු 04 යි)*

(ආ)

- මධ්‍ය ආසියාවේ සිට සංක්‍රමණය වූ ජන කණ්ඩායම් ගංගාධාර ආශ්‍රිතව, කෘෂිකර්මාන්තයේ පහසුව සලකා පදිංචි වීම.
- ක්‍ෂත්‍රිය යැයි හඳුන්වන රජවරුන් කෘෂිකර්මයේ යෙදීම.
- වාර්ෂිකව කෘෂිකාර්මික උත්සවය (වප් මඟුල) පැවැත්වීම.
- මගධ ක්‍ෂේත්‍රය නම් විශාල කුඹුරු යායක් ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වීම.
- රජවරුන්ගේ නම්වලට ඕදන නාමය එක්කර ගැනීම. (සුද්ධෝදන, අමිතෝදන, ධෝතෝදන ආදිය)
- බ්‍රාහ්මණ සමාජය තුළ කෘෂිකර්මාන්තය ඇතුළු ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙන් වූ වෛශ්‍ය කුලයක් වෙන්ව පැවතීම.

**ආදී කරුණු අතරින් පිළිතුර සකස් වී තිබිය යුතුය.**

*(ලකුණු 04 යි)*

(ඇ) බුද්ධ කාලීන භාරතයේ ඉතා දියුණු ලෙසින් ද පුළුල්ව ද සංකීර්ණව ද වෙළෙඳ රටාවක් පැවති නිසාම දියුණු වෙළෙඳ නගර කිහිපයක් ගැන සඳහන් වේ.

ශ්‍රාවස්තිය, රාජගෘහය, බරණැස, උදේනිය ආදිය නාගරිකරණයට පත් වූ වෙළෙඳ නගර වේ. එහි වාණිජ්‍යකරණයේ අවස්ථා තුනක් හඳුනා ගැනේ.

1. සුළු පරිමාණයේ වෙළෙඳම

2. මධ්‍යම පරිමාණයේ වෙළෙඳම

2. මහා පරිමාණයේ වෙළෙඳම යනුයි

- වෙළෙඳම නිසාම දියුණු වූ හා ප්‍රසිද්ධ වූ භාරුකච්ච, සුප්පාරක, තාම්‍රලිප්ත වැනි වෙළෙඳ වරායන් ද වෙළෙඳ මාවත් ද ඇති වී තිබීම.
- දේශීය වෙළෙඳ ක්‍රම හා විදේශීය වෙළෙඳ ක්‍රම ගැන සඳහන් වීම.
- සේරිවාණිජ, වණ්ණුපථ, අපණ්ණක ආදී ජාතක කථා ඇසුරින් කරුණු සාකච්ඡා කොට තිබීම.

**ඉහත කරුණු ඇසුරින් පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.**

*(ලකුණු 06 යි)*

(ඈ)

- කෘෂිකර්මාන්තයත් ඒ ආශ්‍රිත නිෂ්පාදනත් වර්ධනය කිරීම.
- භාණ්ඩ නිෂ්පාදනය, භාණ්ඩ හුවමාරුව මුල් කොටගත් වෙළෙඳ ආර්ථිකය දියුණු කිරීම.
- සුළු පරිමාණ, මධ්‍ය හා මහා පරිමාණ ආයෝජන අවස්ථා පුළුල් කිරීම මඟින් නිෂ්පාදන අවස්ථා බහුල කිරීම.
- කර්මාන්ත සංවිධානය කිරීම ආදී කරුණු ඇසුරෙන් පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.

*(ලකුණු 06 යි)*

3. (අ) අශ්වමේධ යාගය, පුරුෂ මේධ යාගය, වාජපේය යාගය, නිරග්ගල යාගය යනුයි.

*(ලකුණු 04 යි)*

(ආ) යාගය, වේදය, වර්ණ ධර්ම, ස්වධර්ම, ආශ්‍රම ධර්ම හා නිර්මාණවාදය ආදිය යි.

*(ලකුණු 04 යි)*

(ඉ)

1. සියලු සිහිල් දිය පාවිච්චි කිරීමෙන් වැළකුණේ වෙයි. **(සබ්බවාරි වාරිතො)**
2. සියලු සංවරයෙන් යුක්ත වූයේ වෙයි. **(සබ්බවාරි යුතො)**
3. සියලු වැළකිය යුතු පවින් වැළකුණේ වෙයි. **(සබ්බවාරි ධුතො)**
4. සියලු පව්කම් විද නිම වූ විමුක්තියෙන් යුක්ත වූයේ වෙයි. **(සබ්බවාරි ඵුටො)**

යනු චතුයාම සංවරය යි.

*(ලකුණු 06 යි)*

(ඊ)

- බුදුසමය, පුද්ගලයාගේ කාය කර්ම, වචී කර්ම හා මනෝ කර්ම තුළින් කුසලා කුසල කර්ම රැස්වන බව උගන්වයි. අකුසලයෙන් මිදී කුසලයෙහි යෙදී ක්‍රියා කළයුතු බව පෙන්වා දෙයි.
- පූරණ කස්සපගේ ඉගැන්වීම අකිරියවාදයකි. මොහුගේ ඉගැන්වීමට අනුව,

සියතින් කරන්නාට ද අනුන් ලවා කරවන්නාට ද අනුන්ගේ අත් පා සිඳින්නාට ද සිඳු වන්නාට ද අනුන් දඬුවමින් පෙළන්නාට ද පෙළවන්නාට ද පර පීඩාවන් කරන්නාට ද කරවන්නාට ද පවක් සිදු නොවේ. එසේම සතුන් මැරීම, හොරකම් කිරීම, උවදුරු කිරීම, මං පැහැරීම, පරදාර සේවනය, බොරු කීම යනාදිය කරන්නාට ද කරවන්නාට ද පවක් සිදු නොවේ. තියුණු අවියකින් සියලු සතුන් මරා එකම මස් ගොඩක් කළ ද ඉන් පවක් නැත.

හිංසා කරමින්, කරවමින්, අත් පා සිඳිමින් සිඳුවමින් ගංගා නදියෙහි දකුණු තෙරට යන්නේ ද ඉන් සිදුවන පවක් නැත. පවෙහි ආගමනයක් ද නැත. ගංගා නදියෙහි උතුරු තෙරට දන් දෙමින් යාග කරමින්, කරවමින් යන්නේ ද ඉන් සිදුවන පිනක් ද නැත. දානය, සංවරය, ඉන්ද්‍රිය දමනය, සත්‍ය වචනය යන මෙයින් සිදුවන පිනක් නැත. කුසලා කුසල කර්ම ප්‍රතික්ෂේප කිරීම, මෙම ඉගැන්වීමෙන් සිදු වේ.

**මෙම ඉගැන්වීම් දෙක පෙන්වා බුදුසමයේ වෙනස පැහැදිලි කොට තිබීම ප්‍රමාණවත් වේ.**

*(ලකුණු 06 යි)*

## II කොටස

4. (අ) 1. ශාක්‍ය ජනපදය - කපිලවස්තු නුවර
2. කෝලිය ජනපදය - දෙව්දහ නුවර

*(ලකුණු 04 යි)*

(ආ) රාම, ධජ, ලක්ෂ්මණ, මන්ත්‍රී, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම, සුදත්ත යන නාම වලින් හතරකි.

*(ලකුණු 04 යි)*

(ඉ)

- කෝසල රාජ්‍යයට අයත් ශාක්‍ය ජනපදයේ අගනුවර කපිලවස්තු නුවර
- ශාක්‍ය ජනපදය ශාක්‍යයන්ගේ නිජ භූමියයි. ශාක්‍යයන්ගේ සම්භවය මහා සම්මත රජ පරපුරේ පසු කාලීනයෙකු වූ සූර්ය වංශයට අයත් ඔක්කාක රජුගෙන් ආරම්භ වේ.

**මූලික කරුණු ඇතුළත්ව ශාක්‍යයන්ගේ සම්භවය ගැන කරුණු දක්වා තිබීම ප්‍රමාණවත් වේ.**

*(ලකුණු 06 යි)*

(ඊ) යමක මහා ප්‍රාතිහාර්ය පෑම යි.

බුදුරදුන්ගේ එක් නාස් පුඩුවකින් ගිනි කඳක් ද අනෙක් නාස් පුඩුවෙන් ජල කඳක් ද මවා අවශ්‍ය අයට පමණක් දකින්නට සැලැස් වීම යි.

*(ලකුණු 06 යි)*

5.

(අ)

| | | |
|---|---|---|
| අනේක ජාති සංසාරං | - | සන්ධාවිස්සං අනිබ්බිසං |
| ගහකාරකං ගවේසන්තෝ | - | දුක්ඛා ජාති පුනප්පුනං |
| ගහකාරක දිට්ඨෝසි | - | පුනගෙහං නකාහසි |
| සබ්බා තෙ ඵාසුකා භග්ගා | - | ගහකූටං විසංඛිතං |
| විසංඛාර ගතං චිත්තං | - | තණ්හානං ඛයමජ්ඣගාති. |

(ලකුණු 04 යි)

(ආ) පළමු සතිය බෝ මැඩ වැඩ සිටීම, දෙවැනි සතිය අනිමිස ලෝචන පූජාව, තෙවැනි සතිය රුවන් සක්මනෙහි යෙදීම, සිව්වැනි සතිය රුවන්ගෙයි වැඩ සිටීම, පස්වැනි සතිය අජපාල නුගරුක මුල වැඩ සිටීම, සයවැනි සතිය මුචලින්ද නාග දරණයෙහි වැඩ සිටීම, සත්වැනි සතිය රාජායතන කිරිපලු නුගරුක මුල වැඩ සිටීම යනුයි.

(ලකුණු 04 යි)

(ඉ) බුදුරදුනු තමන් වහන්සේට බුද්ධත්වය අවබෝධ කර ගැනීමට සෙවන දුන් ඇසතු වෘක්ෂය මුල පළමු සතිය වැඩ සිට දෙවැනි සතියේ දී සතියක් ඇසිපිය නොහෙළා බලා සිටීමෙන් අනිමිස ලෝචන පූජාව සිදු කළහ. මෙය බුදුරදුන් ලෝකයට ප්‍රකට කළ කළගුණ සැලකීමේ ගුණයයි. එය සියලු ලෝකයාහට ආදර්ශයකි. වර්තමානයේ බෞද්ධයා බෝධි පූජාව පවත්වන්නේ ද මෙම ගුණය සිහිපත් කරමිනි.
**ප්‍රමාණවත් පිළිතුරක් අපේක්ෂා කෙරේ.**

(ලකුණු 06 යි)

(ඊ) බුදුරදුන් පහළ වන විට පැවතියේ අන්ත දෙකකට අයත් ඉගැන්වීම් සමුදායකි. එම අන්ත දෙක නම්,
1. **කාමසුඛල්ලිකානු යෝගය හා**
2. **අත්තකිලමථානුයෝගය යනුයි**

බුදුරදුන්ගේ ධර්මයේ විශේෂතාව වන්නේ එම අන්තවාදවලට අයත් නොවන මධ්‍යම ප්‍රතිපදාව දේශනා කිරීමයි. එය අංග අටකින් යුක්ත, ත්‍රි ශික්ෂාවකින් සම්පූර්ණ කළ යුතු ආර්ය මාර්ගයයි.
**මධ්‍යම ප්‍රතිපදාව කෙටියෙන් විස්තර කර තිබීම ප්‍රමාණවත් වේ.**

(ලකුණු 06 යි)

6. (අ) බරණැස් සිටුවරයා, යසකුල පුත්‍රයාගේ පුරාණ භාර්යාව හා සිටු බිරිය වූ සුජාතාව යනුයි.

(ලකුණු 04 යි)

(ආ)

- දරුවනි, වඩා උතුම් වන්නේ අනුන් ගැන සොයා වෙහෙසීම ද? නැතහොත් තමන් ගැන සෙවීම ද?
  ස්වාමීනි, තමන් ගැන සෙවීම වඩා උතුම් කාර්යයි.
  එසේ නම්, දරුවනි, වාඩි වී මා කියන දහම් අසව්
- මෙහි අනුන් ගැන සෙවීමට වඩා තමන් ගැන සොයා ක්‍රියා කිරීම උතුම් බව දේශනා කිරීම ඉස්මතු කොට පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.

(ලකුණු 04 යි)

(ඉ) රජගහනුවර කෝලිත ගමෙහි ප්‍රධාන බමුණාගේ පුතා කෝලිත නම් වූ අතර උපතිස්ස ගමෙහි ප්‍රධාන බමුණාගේ පුතා උපතිස්ස නම් විය. මේ දෙදෙනා අතිශය මිත්‍රශීලී වූහ. නිතර ක්‍රීඩා කිරීමටත්, උත්සව නැරඹීමටත් එකට එක්ව ක්‍රියා කිරීමටත් පුරුදු වූහ. මොවුහු ගිරග්ගසමජ්ජ නම් ක්‍රීඩා උත්සවය නරඹා ජීවිතය ගැන කළකිරී සංජය පරිබ්‍රාජක වෙත පැමිණ ධර්මය හැදෑරූහ. එතැනින් තමන් සොයන විමුක්තිය නොලැබෙන බව තේරුම්ගෙන එතැනින් පිටත්ව විමුක්ති මාර්ගය කියාදෙන ශාස්තෘවරයෙකු සොයමින් ගමන් කළහ. ඒ අතර අස්සජි තෙරුන් හමු වූ අතර උන්වහන්සේගේ මග පෙන්වීමෙන් බුදුරදුන් වෙත ගමන් කළ බවත්, විමුක්ති මාර්ගය සොයාගත් බවත් පැහැදිලි ලෙස කිරීම ප්‍රමාණවත් වේ.

(ලකුණු 06 යි)

(ඊ)

- පළමු රහත් සැට නම අමතා බුදුරදුන් දේශනා කළ චරථ භික්ඛවෙ චාරිකං ...... ආදි දේශනාවට අනුව එක් එක් මාර්ගවලින් වෙන වෙනම ගම් නියම් ගම්වල ධර්ම ප්‍රචාරයේ පිටත් කොට හැරි ආකාරයත්, බුදුරදුන් තනිවම උරුවෙල් දනව්වෙහි සේනානී නියම් ගමට වැඩම කළ බවත් කියවේ.
- භද්දවග්ගිය කුමාරවරුන්ට දහම් දෙසීම.
- තුන් බෑ ජටිලයන් දමනය කිරීම.
- 1250 ක භික්ෂු පිරිසක් ප්‍රථම ධර්ම ප්‍රචාරය තුළින් ගොඩ නැගුණු බව,

**ඇතුළු කරුණු ඇතුළත්ව පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.**

*(ලකුණු 06 යි)*

## III කොටස

7. (අ)

- චූලෝදර, මහෝදර යන නා රජවරුන් අතර මිණි පළඟක් උදෙසා ඇති වූ යුද්ධය සංසිඳවීම පිණිස ය.
- එහි දී කාකෝලූක, ඵන්දන හා වට්ටක ජාතක දේශනාවන් සිදු කොට දෙපිරිස සමගි කරවීම.
- නා රජවරු මැණික් පුටුව බුදුරදුන්ට පූජා කිරීම.

**යන කරුණු ඇතුළත්ව පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.**

*(ලකුණු 04 යි)*

(ආ) කැලණිය, සමන්තකූට පර්වතය, රුහුණ, දීඝවාපිය, අනුරාධපුර යන ස්ථානවලින් හතරකි.

*(ලකුණු 04 යි)*

(ඇ)

- බුද්ධත්වයෙන් පස් වැනි වස රෝහිණී නදියේ ජලය මුල් කොටගෙන ශාක්‍ය හා කෝලිය රජවරුන් අතර ඇති වූ යුද්ධය සන්සිඳවීම.
- පස් වැනි වස් කාලය තුළ ම චූලෝදර - මහෝදර නා රජුන්ගේ මිණි පළඟ අරබයා ඇති වූ යුද්ධය සන්සිඳ වීමට ලංකාවට වැඩම කරවීම.
- නව වන වස් කාලයෙහි කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ ධර්මධර හා විනයධර භික්ෂූන් අතර ඇති වූ කලහය සන්සිඳවීම.

**අවස්ථා තුනක් මතු කරමින් පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.**

*(ලකුණු 06 යි)*

(ඈ)

- **නහි වෙරෙන වෙරාණි — සම්මන්තීධ කුදාචනං**
  **අවෙරෙනච සම්මන්ති — එස ධම්මො සනන්තනො**
  වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බවත්, වෛර නොකිරීමෙන් එය සන්සිඳෙන බවත් පෙන්වා දීම.
- **සමග්ගා හොථ මා විවදථ** - සමගි වව්, විවාද නොකරව් යන දේශනාව.
- **අක්කොධෙන ජිනෙ කොධං** - **අසාධුං සාධුනා ජිනෙ,**
  ක්‍රෝධ කරන තැනැත්තා ක්‍රෝධ නොකිරීමෙන් දිනන්නේය ආදි දේශනා.
- **පරෙචන විජානන්ති** - **මයමෙත්ථ යමාමසෙ**
  මැරෙන බව නොදන්නෝ කලහ කෙරෙති, මැරෙන බව දන්නවුන්ගේ කලහය සන්සිඳෙත්.

**ආදි දේශනා ඇසුරින් පිළිතුර වර්තමානයට අදාළව සකස් වී තිබීම ප්‍රමාණවත් ය.**

*(ලකුණු 06 යි)*

8. (අ) බරණැස ඉසිපතනය, රජගහනුවර වේළුවනය, විශාලා මහනුවර කූටාගාර ශාලා විහාරය, කොසඹෑ නුවර ඝෝෂිතාරාමය, සැවැත් නුවර ජේතවනාරාමය, කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමය ආදී ස්ථාන අතරින් හතරකි.

(ලකුණු 04 යි)

(ආ) 1. පෙර බත් කිස 2. පසු බත් කිස 3. පෙරයම් කිස
4. මැදියම් කිස 5. පැසුළුයම් කිස යනුයි.

(ලකුණු 04 යි)

(ඉ)

- උදෑසන මුහුණ දෙවීම ආදි පිරිසිදු වීම් කටයුතු.
- පිඩු සිගා වැඩීමට කාලය පැමිණෙන තෙක් විවේකීව වැඩ සිටීම.
- ආරාධනයක් නොමැති නම් භික්ෂු සංඝයා සහිතව පිණ්ඩපාතයේ වැඩම කිරීම.
- ආරාධනයක් ඇතොත් එහි වැඩමවා දන් වළඳ එහි රැස්ව සිටින පිරිසට දහම් දෙසීම.
- ශ්‍රාවක භික්ෂු සංඝයා දන් වළඳ අවසන් කොට විහාරයට පැමිණෙන තුරු මණ්ඩල මාලකයේ විවේකයෙන් වැඩ සිටීම.
- භික්ෂු සංඝයා ආපසු වැඩම කළ බව උපස්ථායක තෙරුන් විසින් දැන්වීමෙන් පසු ගඳ කිළියට වැඩම වීම.

**යන කරුණු ඇතුළත්ව පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.**

(ලකුණු 06 යි)

(ඊ)

- පුද්ගල සාර්ථකත්වය සඳහා කාල කළමනාකරණය අවශ්‍ය බවත්.
- නිසි වේලාවට වැඩ කිරීම නිසා කාලය අපතේ නොයෑම.
- නිසි පරිදි වැඩ කටයුතු සම්පූර්ණ වීම.
- කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමටත්, වැඩි වැඩ කොටසක් ඉටු කිරීමටත් හැකි බව.

**එය පුද්ගල සාර්ථකත්වයට හේතු වන බව පෙන්වා දී තිබීම ප්‍රමාණවත් වේ.**

(ලකුණු 06 යි)

9. (අ) භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනුයි.

(ලකුණු 04 යි)

(ආ)

| | | |
|---|---|---|
| **මහා කාශ්‍යප තෙරුන්** | - | ධුතවාදීන් අතර අග තනතුර |
| **මහා කච්චායන තෙරුන්** | - | කෙටියෙන් දෙසූ ධර්මය විස්තර කිරීමේ සමර්ථයන් අතර අග තනතුර |
| **මහා ප්‍රජාපතීගෝතමී තෙරණිය** | - | චිර රාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුර |
| **භද්දකච්චානා තෙරණිය** | - | මහා අභිඥා නුවණ ලැබූවන් අතර අගතනතුර යනුයි. |

(ලකුණු 04 යි)

(ඉ)

- මහා කාශ්‍යප මහා රහතන් වහන්සේ බුදුරදුන් ජීවමානව වැඩ සිටිය දී ධුතාංගවාදීන් අතර අග තනතුරු ලැබූ තෙර නමකි.
- බුදුරදුන්ට මහා පුරුෂ ලක්ෂණ 32 ක් වූ අතර මහා කාශ්‍යප තෙරුන්ට මහා පුරුෂ ලක්ෂණ 07 ක් වූ බව කියවේ.
- බුදුරදුන් පිරිනිවන් පෑමෙන් පසු පළමු ධර්ම සංගායනාවට ප්‍රධානත්වය ගෙන ක්‍රියා කළේ ද මුන් වහන්සේය.
- මේ කරුණු ඇතුළත්ව තිබිය යුතුය.
- භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමට මූලිකත්වය ගත්තේ මහා ප්‍රජාපතීගෝතමී තෙරණිය යි.

**ඒ ඇසුරින් පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.**

(ලකුණු 06 යි)

(ඊ)

- රාහුල තෙරුන්ගේ චරිතයෙන් ප්‍රකට වන්නේ වැඩි වැඩියෙන් අවවාද ලබා ගැනීමෙන් ජීවිතය සාර්ථක කර ගැනීමට හැකි බවයි.
- අවවාදයේ දී නොකිපී ඉවසීමෙන් කටයුතු කළයුතු බවත් මින් පැවසේ.
- පුණ්ණ තෙරුන්ගේ චරිතයෙන් ඉවසීමේ අගය ප්‍රකාශ වේ. අන්‍යයන් සමග ක්‍රියා කිරීමේ දී හා සමාජ සේවයේ දී ඉවසීමේ ගුණය අතිශය වැදගත් වේ.
- "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය" යන ආප්තය පුණ්ණ තෙරුන්ගේ චරිතයෙන් ඉගැන් වේ.

**වර්තමානයේ පුද්ගල ජීවිත සාර්ථකත්වයට අදාළව කරුණු දක්වා තිබීම අවශ්‍ය යි.**

***(ලකුණු 06 යි)***

10. (අ)

- සුදත්ත හෙවත් අනේපිඬු සිටුතුමා අග්‍ර දායක පදවියත්,
- චිත්ත ගෘහපතියා ධර්ම කථිකයන් අතර අග්‍රස්ථානයත්,
- හත්ථාලවක රජු සතර සංග්‍රහ වස්තුවෙන් රට වැසියන්ට සංග්‍රහ කළවුන් අතර අග්‍රස්ථානයත්,
- මහානාම ශාක්‍ය රජු අග්‍ර ප්‍රණීත දායක පදවියත්,
- උග්ගහ ගෘහපතියා රිසි දෑ දෙන්නවුන් අතරින් අගතනතුරත්,
- සූරම්බට්ඨ අචල ශ්‍රද්ධා ඇති අය අතර අග තනතුරත්,
- ජීවක කෝමාරභච්ච පුද්ගලික ප්‍රසාද ඇත්තන් අතරින්  අගතනතුරත් ලැබිය,

- විශාඛාව අග්‍ර දායිකා තනතුරත්,
- සුප්පවාසාව ප්‍රණීත දෑ දෙන්නවුන් අතරින් අග තනතුරත්,
- උත්තරා ධ්‍යානලාභීන් අතරින් අග තනතුරත්,
- කාතියානි නොසෙල්වෙන ශ්‍රද්ධා ඇත්තියන් අතර අග තනතුරත්,
- ඛුජ්ජුත්තරා බහුශ්‍රැතාවියන් අතර අග තනතුරත්,
- නකුල මාතාව විශ්වාස කථා ඇත්තියන් අතර අගතනතුරත්,
- සාමාවතී මෛත්‍රී විහාර

**මින් දෙපක්ෂයෙන් සිව් දෙනෙකු ප්‍රමාණවත් වේ.**

***(ලකුණු 04 යි)***

(ආ) 1. මගධ රාජ්‍යයෙහි රාජ්‍යත්වය ලැබීම.
2. තමන්ගේ රටට බුදුරදුන් වැඩම වීම.
3. දහම් දෙසීම.
4. බුද්ධෝපස්ථානය කරන්නට ලැබීම.
5. ධර්මය අවබෝධ කර ගැනීමට ලැබීම.

***(ලකුණු 04 යි)***

(ඇ)

- බුදුරදුන් දවස කෝසලයේ පාලකයා වූයේ පසේනදී කෝසල රජුය.
- බුදුරදුන් සැවැත් නුවරට වැඩම කළ පසු බුදුරදුන් වෙත ගොස් සමකාලීන අන්‍ය ශාස්තෘවරුන් ගැන පවසා බුදුරදුන් සමග සාකච්ඡා කිරීමෙන් ප්‍රසාදයට පත්වූවෙකි.
- දිනකට දෙතුන් වරක් බුදුරදුන් හමු වී ධර්ම සාකච්ඡා පැවැත් වූ දායකයෙකි.
- බුදුරදුන් කෙරෙහි මහත් ගෞරවයෙන් කටයුතු කළ අයෙකි.
- බුදුරදුන් කෙරෙහි භක්තිමත් වීම නිසාම බුදුරදුන්ගේ ඥාතිවරයෙකු වීමට ද උත්සාහ කළේය.

- බුදුරදුන් හා තමා කොසොල් රට වැසියන් බවත්, අසූ වයස් ඇති බවත් පවසා සන්සන්දනය කොට කරුණු දැක්වීම ආදී කරුණු අතරින් පිළිතුර සකස්වීම ප්‍රමාණවත්ය.
- කෝසල මල්ලිකාව පසේනදී කොසොල් රජුගේ අග බිසව වූවාය.
- බුදුරදුන් කෙරෙහි අතිශය ප්‍රසාදයෙන් කටයුතු කළ තැනැත්තියකි.
- කොසොල් රජුට අසදෘශ මහා දානය පිරිනමන අයුරු කියා දුන්නේ ද මැයයි.
- රජු ලවා අසදෘශ දානය දෙවීම හා රජුට ජය ලබා ගැනීමට උදව් කිරීම.
- කොසොල් රජු සර්වශතක යාගය කිරීමට සූදානම් වූ අවස්ථාවේ මඟ ඉන් වළක්වා බුදුරදුන් වෙත යොමු කළේ ද ඇයයි.
- කොසොල් රාජ පරපුරේ මියගිය ඥාතීන්ට පින් දීමට දන් දී පින් අනුමෝදන් කරවා සුවපත් කරවූයේ ද ඇයගේ මෙහෙයවීම මතයි
- බුදුරදුන් කෙරෙහි ප්‍රසාදයෙන් කටයුතු කළ දායිකාවක ලෙස ඇයගේ සේවාව අගය කළ හැකිය.
  **මේ චරිත දෙක පිළිබඳ කරුණු ප්‍රමාණවත් පරිදි දක්වා තිබිය යුතුය.**

*(ලකුණු 06 යි)*

(ඊ)

- ශාසනයේ උන්නතිය උදෙසා රජයේ දායකත්වය ලබාදීම.
- සද්ධර්මයේ පැවැත්ම සඳහා සිව්වනක් පිරිසට ධෛර්ය ලබා දීම.
- වෙහෙර විහාර පවත්වාගෙන යෑමට භෞතික ආධාර ලබාදීම.
- දුෂ්ප්‍රතිපත්ති මගින් ශාසනය දූෂිත වී යැයි මහා තෙරවරු පවසන බැවින් ධර්ම කථිකාවත් සිදු කිරීම හා සංගායනාවකට අනුග්‍රහය දැක්වීම.
- ධර්ම පුස්තක සුලභ කොට දුෂ්කර ප්‍රදේශවලට බෙදා හැරීම.
- දුෂ්කර ප්‍රදේශවල වෙහෙර විහාර තනා සිටවීමට ධෛර්ය ලබාදීම.
  **නූතන පාලකවරුන් විසින් අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග ගැන සිය අදහස් දක්වා තිබීම ප්‍රමාණවත් වේ.**

*(ලකුණු 06 යි)*

**************************

# දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2015 (2016)

ලකුණු දීමේ පටිපාටිය

# (01) බුද්ධ චරිතය

# දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2015 (2016)

## (01) බුද්ධ චරිතය

### I කොටස

(i)

- සර්ව බලධාරී
- සර්ව ව්‍යාපී
- සර්වතෝභද්‍ර
- සර්වඥ
- සර්ව දර්ශී
- සර්වවාරිපරිපූර්ණ ආදියෙන් 04 කි.

(ලකුණු 04 යි)

(ii)

- සත්ත්ව පාලනය
- දානය
- යාගය
- ඉගෙනීම
- ගොවිතැන් කිරීම ආදියෙන් හතරකි.

(ලකුණු 04 යි)

(iii)

- බ්‍රහ්මචාරී - ජීවිතයේ මුල් අවධිය, ඉගෙනීම් කරන කාලය
- ගෘහස්ථ - විවාහ වී අඹු දරුවන් පෝෂණය කරන අවධිය
- වානප්‍රස්ථ - ගෘහ බන්ධනවලින් මිදී වනගතව ආගමික ජීවිතයක් ගෙවන අවධිය
- සන්‍යාසී - නිදහස් සංචාරක ජීවිතයක් ගෙවන ජීවිතයේ අවසාන අවධිය

(ලකුණු 06 යි)

(iv)

- නිර්මාණ වාදය, වර්ණධර්ම, ස්වධර්ම, ත්‍රිවේදය, යාගය, උදකපාරිශුද්ධිය ආදී ඉගැන්වීම් බුදු සමයේ විචාරයට ලක් වී ඇත.
- අග්ගඤ්ඤ සූත්‍රය, චක්කවත්ති සීහනාද සූත්‍රය, අස්සලායන සූත්‍රය, අම්බට්ඨ සූත්‍රය, මධුර සූත්‍රය, වසල සූත්‍රය, වාසෙට්ඨ සූත්‍රය ආදියෙන් බෞද්ධ විචාරය ඉදිරිපත් වේ.
- අස්සලායන සූත්‍රයේ එන බ්‍රාහ්මණොව සෙට්ඨො වණ්ණො හීනො අඤ්ඤෙ වණ්ණො ... ආදියත්.
- අග්ගඤ්ඤ සූත්‍රයේ එන බාහිතපාපත්තා බ්‍රාහ්මණා ...... ඛෙත්තානං අධිපතීති ඛත්තියෝ ...... විස්සුතකම්මන්තෙ පයොජෙන්තීති වෙස්සා ..... ලුද්ද ඛුද්ද සමාචාරා සුද්දා ...... ආදි පරිණාමීය සාධක අනුව විචාරය කිරීම.

- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]

**මෙම කරුණු අතරින් පහක් හෝ ඒ පමණ පිළිතුරු සපයා ඇති විට ලකුණු**

(ලකුණු 06 යි)

2 කර්මාන්තශාලා [illegible]

(ලකුණු 04 යි)

(අ)

- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]

**අදී කරුණු අතරින් පිළිතුරු සපයා ඇති විට ලකුණු**

(ලකුණු 04 යි)

(ආ) [illegible]

[illegible]

**1. සුළු පරිමාණයේ වෙළෙඳාම**

**2. මධ්‍යම පරිමාණයේ වෙළෙඳාම**

**2. මහා පරිමාණයේ වෙළෙඳාම යනුයි**

- වෙළෙඳාම නිසා දියුණු වූ හා ප්‍රසිද්ධ වූ [illegible] වෙළෙඳ [illegible] ද වෙළෙඳ [illegible] ද ඇති වී තිබීම.
- දේශීය වෙළෙඳ ක්‍රම හා විදේශීය වෙළෙඳ ක්‍රම ගැන සඳහන් වීම.
- [illegible] ආදී ජාතීන් [illegible] කරුණු [illegible] කිරීම.

**ඉහත කරුණු ඇසුරින් පිළිතුරු සපයා තිබීම ප්‍රමාණවත් වේ.**

(ලකුණු 06 යි)

(ඇ)

- කර්මාන්තශාලාවන් ඊට ආශ්‍රිත නිෂ්පාදනයන් [illegible] කිරීම.
- [illegible] නිෂ්පාදනය, [illegible] දියුණු කිරීම
- සුළු පරිමාණ, මධ්‍ය හා මහා පරිමාණ ආයෝජන අවස්ථා [illegible] කිරීම තුළින් නිෂ්පාදන අවස්ථා [illegible] කිරීම.
- [illegible] කිරීම ආදී කරුණු ඇසුරෙන් පිළිතුරු සපයා තිබීම ප්‍රමාණවත් වේ.

(ලකුණු 06 යි)

(i)
- කේවල ශාස්වතවාද
- අන්තානන්තවාද
- අධිච්චසමුප්පන්නවාද
- අසංඥීවාද
- උච්ඡේදවාද
- ඒකච්ච ශාස්වතවාද
- අමරාවික්ඛේපවාද
- සංඥීවාද
- නෙවසංඥීනාසංඥීවාද
- දිට්ඨධම්මනිබ්බානවාද

යන වාද අතරින් හතරකි.

(ලකුණු 04 යි)

(ii)
1. ලෝකය ශාස්වත ද
2. ලෝකය අශාස්වත ද
3. ලෝකය අන්තවත් ද
4. ලෝකය අනන්තවත් ද
5. ජීවය හා ශරීරය එකක් ද
6. ජීවය හා ශරීරය දෙකක් ද
7. තථාගත මරණින් මතු වේද
8. තථාගත මරණින් මතු නොවේ ද
9. තථාගත මරණින් මතු වෙයි හා නොවෙයි ද
10. තථාගත මරණින් මතු නොවෙයි හා නොම වෙයි ද යන කරුණු අතරින්

හතරකි.

(ලකුණු 04 යි)

(iii) නියතිවාද විස්තර වී තිබිය යුතු වේ.

සත්ත්වයන්ගේ කෙලෙසීමට, පිරිසිදු වීමට හේතුවක් ප්‍රත්‍යයක් නැත. හේතු ප්‍රත්‍යය රහිතව ම සත්ත්වයෝ කිලිටි වෙති. පිරිසිදු වෙති. තමා කළ කර්මයෙහි විපාක නැත. අනුන්ගේ උපදෙස් අනුව කළ කර්මයෙහි ද විපාක නැත. පුරුෂ බලය, පරාක්‍රමය, වීර්ය කියා දෙයක් නැත. සකල සත්ත්ව, භූත, ජීව, ප්‍රාණීහුම වීර්ය රහිතව ම නියති සංගති ස්වභාවය අනුව ශ්‍රේෂ්ඨ ජාති සයකම උපදිති. සුවදුක් විඳිති. බාල පණ්ඩිත සියල්ලන් සසර හැසිර ඉබේම දුක් කෙළවර කරන් නම් එවූ යෝනි දහ හතර ලක්ෂ හය දහස් හයසියයකි. කර්ම පන්සියයකි. කර්ම පහකි. කර්ම තුනකි. ප්‍රතිපදාවන් දෙසැටකි. අන්තර කල්ප දෙසැටකි. ශ්‍රේණි ජාති හයකි. පුරුෂ භූමි අටකි. ආජීවක වෘත්ති එකසිය හතලිස් නවයකි. ඉන්ද්‍රිය එකසිය විස්සකි. නිරය එකසිය තිහකි ....... යම් සේ නූල් ගුලියක් උස් තැනක සිට දමා ගසන්නෙන් නොරැඳී දිගහැරී යයි ද නූල් අවසන් වූ විට නවතී ද එසේම බාල පණ්ඩිත සියල්ලෝම ඉබේම සසර ගමන් කොට දුක කෙළවර කෙරෙත් යනු මොහුගේ ඉගැන්වීමයි.

(ලකුණු 06 යි)

(iv) ශාස්වත හා උච්ඡේද වාද නියෝජනය කෙරෙන අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගය ප්‍රතික්ෂේප කරන බවත්, මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කොට නිවන් සාක්ෂාත් කළයුතු බවත් බුදු සමය පෙන්වා දෙයි. මෙහිලා මධ්‍යම ප්‍රතිපදාව විස්තර කොට තිබිය යුතු වේ.

(ලකුණු 06 යි)

## II කොටස

04.

(i) සුද්ධෝදන, ශුක්ලෝදන, ධෝතෝදන, අමිතෝදන, මිතෝදන අමිතා හා ප්‍රමිතා යන අය අතරින් සිව් දෙනෙකි.

(ලකුණු 04 යි)

(ii) දණ්ඩපාණි, සුප්පබුද්ධ, මහාමායා හා ප්‍රජාපති යනුයි.

(ලකුණු 04 යි)

(iii) බරණැස රාම රජුගේ ශරීරයේ චර්ම රෝගයක් හට ගත්තේය. ඒ නිසා රජ සියල්ලන් විසින් පිළිකුල් කළෙන් රාජ්‍යය පුතුන්ට බාර දී වනගත විය. එහිදී වනමුල් ඵල ආදියෙනුත් සකස් කළ බෙහෙත් ජලය ස්නානය කොට බෙහෙත් අනුභව කොට රෝගය සුවපත් විය. යළිත් නගරයට නොගොස් විවේකය පිණිස වනයෙහිම නතර විය. සුවිසල් ගසක මෙහයක කුටියක් තනා එහි සුවසේ ජීවත් වූයේය. එක් අවයම් කාලයක රාම රජුට වනය තුළින් නැගිගෙන කාන්තාවකගේ හඬක් අසන්නට ලැබිණ. ඒ ගැන විපරම් කළ රජුට වනය තුළ බිං ගෙයක විසූ එක් කාන්තාවක් දැකගන්නට ලැබිණ. ඇයගෙන් තොරතුරු දැනගත්තේය. අවයම් ව්‍යාඝ්‍රයෙකු පැමිණ දොරටුව හාරන්නට වූ බියට පත්ව කෑගැසූ බවත් ඇය ඔක්කාක රජුගේ දියණියක බවත්, ශරීරයේ චර්ම රෝගයක් හට ගැනීමෙන් සොහොයුරන් විසින් වනයේ බිං ගෙයක නතර කරවූ බවත් ඇය විස්තර කළාය.

තමා ද ක්ෂත්‍රිය වංශයේ බරණැස රජු බවත් හැඳින්වූ කළ පෙමෙන ඇය හා එක්ව සතුටින් වනයේ කල් ගෙවද්දී පසුකල ඇය දරුවන් ද ලැබුවා ය. පසු කල දරුවන් සිය පියා සොයාගෙන පැමිණියත් රජු වනයෙන් පිටව නොගිය බවත්, රජු ජීවත් වූ කෝල ගස මැදි කොට නගරයක් ඉදි කිරීමට උපදෙස් දුන් බවත් ඒ අනුව නගරයක් කළ බවක් දැක්වේ. කෝල නගරයේ උපන් රාම රජුගේ දරු පරපුර කෝලිය නමින් හැඳින්වේ.

(ලකුණු 06 යි)

(iv)

- සිදුහත් කුමරුගේ පියා ශාක්‍ය වංශික සුද්ධෝදන රජය. මව කෝලිය වංශික අංජන රජුගේ දියණිය වූ මහාමායා දේවියයි.
- සිදුහත් කුමරු ඉපදී දින හතකින් මව කළුරිය කළ හෙයින් සුළු මව වූයේ ද කෝලිය රජුගේ දෙවැනි දියණිය වූ ප්‍රජාපති ගෝතමිය යි.
- සිදුහත් කුමරු උපන්නේ ද මහාමායා දේවිය පෙරනැඹින් සිය කෝලිය රජ පරපුරේ සිය දෙමාපියන් වෙත යන අතරතුර දෙව්දහ නුවර බලා යද්දී ලුම්බිනි සල් උයනේ දීය.
- සිදුහත් කුමරුට නම් තැබීම උපතින් පස්වන දින සිදුවිය. ඊට සහභාගී වූයේ ශාක්‍ය දේශයේ ප්‍රකට පඬිවරුන් වූ රාම, දජ, ලක්ඛණ, මන්ත්‍රී, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම, සුදත්ත නම් බමුණු පඬිවරු ය.
- ශාක්‍ය රජවරුන්ගේ වප් මඟුල් උත්සවය දා සිදුහත් කුමරු කිරි අම්මාවරුන්ගේ ඒකවරණය මැද සිටිය දී භාවනානුයෝගීව සිටිනු දැක පියරජු දෙවැනි වර නමස්කාර කිරීම.
- සිදුහත් කුමරු කෝලිය රාජ පරපුරේ සුප්පබුද්ධ රජු ඇතුළු ශාක්‍ය - කෝලිය ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීම.

- කෝලිය රාජ පරපුරේ සුප්ප බුද්ධ රජුගේ දියණිය වූ යශෝධරා දේවිය සමග සරණ බන්ධනයට පත්වීම.
- බුද්ධත්වයෙන් පසුව රෝහිණී නදියේ ජලය මුල්කොට ශාක්‍ය - කෝලිය රජවරුන් අතර ඇතිවීමට ගිය යුද්ධය සන්සිඳ වීම.
- බුදුරදුන්ට විරුද්ධව වැඩ කළේ ද කෝලිය රාජ පරපුරේ සුප්පබුද්ධ රජුගේ පුත් දේව දත්තය.

මෙම කරුණු අතරින් පිළිතුර සකස් වී තිබීම ප්‍රමාණවත් වේ.

**(ලකුණු 06 යි)**

ප්‍ර. 11

(i)

- මහ පොළොව යහනක් විය. හිමාලය පර්වතය තම සයනයෙහි කොට්ටය විය. එහි සැතපෙන බෝසතුන්ගේ වම් අත පෙරදිග මුහුදෙහි විය. දකුණු අත අවරදිග මුහුදෙහි විය. දකුණු දිග මුහුදෙහි දෙපා විහිදී තිබිණ.
- බෝසතුන්ගේ නාභියෙන් රතු ඒ තණ ගසක් පැන නැගී අහස පුරා දිගට පැතිර යාම.
- කළු හිස් ඇති සුදු පණුවන් රාශියක් පාද මුලයෙන් පැන නැගී දණහිස දක්වා වසාගැනීම.
- සිව් දිසින් පියාඹා පැමිණි ඒ ඒ වර්ණයෙන් යුත් ලිහිණියන් සතර දෙනෙකු බෝසතුගේ පාමුල වැටී එකම සුදු වර්ණයෙන් යුක්ත වීම.
- මහත් සේ කිලිටි මහා අසූචි පර්වතයක් මුදුනේ එහි නොතැවරී නොගෑවී බෝසතුන් සක්මන් කිරීම යනුයි.

**(ලකුණු 04 යි)**

(ii)

- පළමු සිහිනයෙන් සියල්ල අභිබවා බෝසතුන් සම්බුද්ධත්වය ලබන බවට පෙර නිමිත්තකි.
- දෙවැන්නෙන් ශ්‍රේෂ්ඨ වූ ආර්යෂ්ටාංගික මාර්ගය අවබෝධ කොටගෙන එය ලොව පුරා දේශනා කරන්නේය යන අර්ථයයි.
- තෙවැන්නෙන් බොහෝ උවසු උවැසියෝ තෙරුවන් සරණ යන්නෝය යන අදහසයි.
- සිව්වැන්නෙන් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිව් කුලයන් පැමිණ බුදුරදුන් වෙත පැවිදිව එකම ආර්යශ්‍රාවක භාවයට පත්වන ශ්‍රාවක පිරිස පිළිබඳව යි.
- පස් වැන්නෙන් සිව් පසයෙහි බොහෝ ලාභ ප්‍රයෝජන ලැබෙද්දී එහි නොඇලී නිරාමිස පිවිතුරු ජීවිතයක් ගතකරන බව එහි අර්ථය යි.

**(ලකුණු 04 යි)**

(iii)

- සිරුරෙහි සම ගැල වී විසිර ගියත් මුදු වී මිස නොනැගිටිමි.
- සිරුරෙහි නහර ගැල වී විසිරී ගියත් මුදු වී මිස නොනැගිටිමි
- සිරුරෙහි ඇට කටු ගැල වී විසිර ගියත් මුදු වී මිස නොනැගිටිමි.
- සිරුරෙහි මස් ලේ විසිරී ගියත් මුදු වී මිස නොනැගිටිමි. යන දැඩි අධිෂ්ඨානය යි.

මේ අධිෂ්ඨානය තුළින් ජීවිත අරමුණු ඉටුකර ගැනීමෙහිලා ගතහැකි ආදර්ශ පෙන්වා තිබීම අවශ්‍ය වේ.

**(ලකුණු 06 යි)**

3. (අ) අශ්වමේධ යාගය, පුරුෂ මේධ යාගය, වාජපේය යාගය, නිරග්ගල යාගය ආදියයි.

(ලකුණු 04 යි)

(ආ) යාගය, වේදය, වර්ණ ධර්ම, ජාතිවාදය, ආශ්‍රම ධර්ම හා නිර්මාණවාදය ආදිය යි.

(ලකුණු 04 යි)

(ඇ)

1. සියලු සිහිල් දිය පාවිච්චි කිරීමෙන් වැළකුණේ වෙයි. **(සබ්බවාරි වාරිතො)**
2. සියලු සංවරයෙන් යුක්ත වූයේ වෙයි. **(සබ්බවාරි යුතො)**
3. සියලු පැළැතිය යුතු පවින් වැළකුණේ වෙයි. **(සබ්බවාරි ධුතො)**
4. සියලු පවිකම් විද නිම වූ විමුක්තියෙන් යුක්ත වූයේ වෙයි. **(සබ්බවාරි [illegible]**

යනු චාතුයාම සංවරය යි.

(ලකුණු 06 යි)

(ඈ)

- බුදුසමය, පුද්ගලයාගේ කාය කර්ම, වචී කර්ම හා මනෝ කර්ම තුළින් කුසලා කුසල කර්ම සිදුවන බව උගන්වයි. අකුසලයෙන් මිදී කුසලයෙහි යෙදී ක්‍රියා කළයුතු බව පෙන්වා දෙයි.
- පූරණ කස්සපගේ ඉගැන්වීම අකිරියවාදයයි. මොහුගේ ඉගැන්වීමට අනුව,

සියතින් කරන්නාට ද අනුන් ලවා කරවන්නාට ද අනුන්ගේ අත් පා සිඳින්නාට ද සිඳ වන්නාට ද අනුන් දඬුවමින් පෙළන්නාට ද පෙළවන්නාට ද පර පීඩාවන් කරන්නාට ද කරවන්නාට ද පවක් සිදු නොවේ. එසේම සතුන් මැරීම, සොරකම් කිරීම, ගෙවල් බිඳීම, මං පැහැරීම, පරදාර සේවනය, බොරු කීම යනාදිය කරන්නාට ද කරවන්නාට ද පවක් සිදු නොවේ. තියුණු අවියකින් සියලු සතුන් මරා එකම මස් ගොඩක් කළ ද ඉන් පවක් නැත.

හිංසා කරමින්, කරවමින්, අත් පා සිඳිමින් සිඳුවමින් ගංගා නදියෙහි දකුණු දෙරට යන්නේ ද ඉන් සිදුවන පවක් නැත. පවෙහි ආගමනයක් ද නැත. ගංගා නදියෙහි උතුරු ඉවුරට දන් දෙමින් යාග කරමින්, කරවමින් යන්නේ ද ඉන් සිදුවන පිනක් ද නැත. දානය, සංවරය, ඉන්ද්‍රිය දමනය, සත්‍ය වචනය යන මෙයින් සිදුවන පිනක් නැත. කුසලා කුසල කර්ම ප්‍රතික්ෂේප කිරීම, මෙම ඉගැන්වීමෙන් සිදු වේ.

**මෙම ඉගැන්වීම් දෙක පෙන්වා බුදුසමයේ වෙනස පැහැදිලි කොට තිබීම ප්‍රමාණවත් වේ.**

(ලකුණු 06 යි)

## II කොටස

4. (අ) 1. ශාක්‍ය ජනපදය - කපිලවස්තු පුරය
2. කෝලිය ජනපදය - දේවදහ පුරය

(ලකුණු 04 යි)

(ආ) රාම, ධජ, ලක්ෂණ, මන්ත්‍රී, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම, සුදත්ත යන නම් වලින් හඳුන්වයි.

(ලකුණු 04 යි)

(ඇ)

- කෝසල රාජ්‍යයට අයත් ශාක්‍ය ජනපදයේ අගනුවර කපිලවස්තු පුරය.
- ශාක්‍ය ජනපදය ශාක්‍යයන්ගේ නිජ භූමියයි. ශාක්‍යයන්ගේ සම්භවය මහා සම්මත රජ පරපුරේ පසු කාලීනයෙකු වූ සූර්ය වංශයට අයත් ඔක්කාක රජුගෙන් ආරම්භ වේ.

**මූලික කරුණු ඇතුළත්ව ශාක්‍යයන්ගේ සම්භවය ගැන කරුණු දක්වා තිබීම ප්‍රමාණවත් වේ.**

(ලකුණු 06 යි)

(ඈ) යමක මහා ප්‍රාතිහාර්ය පෑම යි.

- බුදුරජුන්ගේ එක් හස් පුඩුවකින් ගිනි කඳක් ද අනෙක් හස් පුඩුවෙන් ජල කඳක් ද [illegible] දකින්නට සැලැස්වීම යි.

(ලකුණු 06 යි)

| | |
|---|---|
| යථා එතාසු ජාතීසු | ලිංගං ජාති මයං පුථු |
| එවං නත්ථි මනුස්සේසු | ලිංගං ජාතිමයං පුථු ආදි වාසෙට්ඨ සූත්‍රයේ කරුණු |
| න ජච්චා වසලෝ හෝති | න ජච්චා හෝති බ්‍රාහ්මණෝ ආදි වසල සූත්‍රයේ කරුණු |

අංගුත්තර නිකායේ එතදග්ග පාලියේ ශ්‍රාවක සංඝයාට තනතුරු ප්‍රදානය කිරීමේ විස්තර ආදිය ද මෙහිලා අදාල වේ.

ඉහත කරුණු ඇසුරෙන් ප්‍රමාණවත් පිළිතුරක් අපේක්ෂා කෙරේ. අවම වශයෙන් අස්සලායන සූත්‍රයේ කරුණු හා වසල සූත්‍රයේ කරුණුවත් ඇතුළත් කිරිය යුතු වේ.

**(ලකුණු 06 යි)**

2.

(i)
- අංග
- මගධ
- කාසි
- කෝසල
- වජ්ජි
- මල්ල
- චේති
- වත්ස
- කුරු
- පඤ්චාල
- මච්ඡ
- සූරසේන
- අස්සක
- අවන්ති
- ගන්ධාර
- කාම්බෝජ අතරින් හතරකි.

**(ලකුණු 04 යි)**

(ii)
- ශාක්‍යයන්ගේ කපිල වස්තුව
- ලිච්ඡවීන්ගේ වෙසාලිය
- මල්ලයන්ගේ කුසිනාරාව හා පාවාව
- භග්ගයන්ගේ සුංසුමාරගිරිය
- බුලීවරුන්ගේ අල්ලකප්පය
- කාලාමයන්ගේ කේසපුත්තය
- කෝලියන්ගේ රාමග්‍රාමය
- මෝරියයන්ගේ පිප්ඵලිවනය
- විදේහයන්ගේ මිථිලාව අතරින් හතරකි.

**(ලකුණු 04 යි)**

(iii) කෝසලයේ අගනුවර, එහි පාලකයා, එහි දේශ සීමා, පාලන තත්ත්වය, බුදු සමය හා පැවති සම්බන්ධය යන කරුණු ඇසුරින් පිළිතුර සපයා තිබිය යුතු වේ.

**(ලකුණු 06 යි)**

(iv) සතර අගතියෙන් වෙන්වීම, සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කිරීම, පංච ශීල ප්‍රතිපත්තිය අනුගමනය කිරීම, දසරාජ ධර්මයන්ට අනුව පාලනය ගෙන යෑම, සප්ත අපරිහානීය ධර්ම පාලනය අනුව කටයුතු කිරීම, දස සක්විති වත් අනුගමනය කිරීම යනාදි ධර්ම කරුණු ඇසුරින් පිළිතුර සපයා තිබිය යුතු වේ.

**(ලකුණු 06 යි)**

# දහම් පාසල් අවසාන සහතික පත්‍ර

## විභාගය - 2016 (2017)

ලකුණු දීමේ පටිපාටිය

## (01) බුද්ධ චරිතය

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2560 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2016 (2017) S1

## (01) බුද්ධ චරිතය

පැය තුනයි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

1. (i) 'වේදගූ' නමින් හැඳින්වෙන බ්‍රාහ්මණයා වේදයෙහි විශාරද බව ලබන චතුර්වේදය නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) වේදය ගුරුකොටගෙන සැකසුණු භාරතීය සමාජ ක්‍රමයෙහි ප්‍රධාන කුල හතර හැරුණු විට 'පසද්වම' නමින් හැඳින්වෙන ඉතා පහත් කුල පහක් ගැන සඳහන් වේ. එයින් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව සමාජයේ සිව්වැනි ස්ථානයෙහිලා සැලකෙන ශූද්‍ර වර්ණයට හිමි ස්වධර්ම පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iv) බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව සැකසුණු බුද්ධකාලීන භාරත සමාජ විෂමතා කෙරෙහි බල පෑ වර්ණධර්ම බුදුරදුන්ගේ විචාරයට ලක් වූ අයුරු විමසන්න. (ලකුණු 06 යි)

2. (i) බුද්ධකාලීන භාරතයේ පැවති රාජාණ්ඩු හතරක් හා ඒවා පාලනය කළ රජවරුන් හතරදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) 'පාලකයා සතර අගතියෙන් තොරව පාලන කටයුතු සිදු කළ යුතු ය' යන්න රාජාණ්ඩු පාලන බෞද්ධ මූලධර්මයකි. මෙහි සඳහන් සතර අගතිය ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) එකල ලිච්ඡවීන් පාලනය කළ වේශාලියෙහි පැවති රාජ්‍ය පාලන ව්‍යවස්ථා මාලාවක් වූ සප්ත අපරිහානීය ධර්ම රාජ්‍යපාලන මූලධර්මයක් ලෙස සැලකිය හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) දැහැමි රාජ්‍යයක් උදෙසා රාජ්‍ය පාලකයාගේ වගකීම කවරේදැයි බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

3. (i) බුද්ධකාලීන භාරතයේ පැවති ආර්ථික නිෂ්පාදන හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුරදුන් ජීවමාන සමයෙහි පැවති බොහෝ ශිල්ප කර්මාන්ත සඳහා වෙන් වූ ශිල්ප ශ්‍රේණි දහඅටක් වූ බව සඳහන් වේ. එයින් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පුරාතන භාරතයේ ආර්ථික ක්‍රමයේ පදනම වූයේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රියාවලියයි. මේ බව බෞද්ධ සාහිත්‍යයේ තොරතුරු ඇසුරින් කෙටියෙන් විමසන්න. (ලකුණු 06 යි)

(iv) වර්තමාන ශ්‍රී ලංකාව තුළ ආර්ථික සමෘද්ධිය ඇති කිරීමෙහි ලා ඉපැරණි භාරතීය ආර්ථික ක්‍රමෝපායයන්ගෙන් ගතහැකි ආදර්ශ පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

### II කොටස

4. (i) සිදුහත් කුමරුගේ නම් තැබීමේ උත්සවයට සහභාගි වූ උගත් පඬිවරුන් අතුරින් හතරදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) සුදොවුන් රජු සිදුහත් කුමරුට නමස්කාර කළ අවස්ථා දෙකක් පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 04 යි)

(iii) 'සතර පෙරනිමිති දැකීම තුළින් නිරූපණය වන්නේ බෝසතුන්ගේ සිතෙහි චතුරාර්ය සත්‍යය පිළිබඳ මූලික සංකල්පය ජනිත කළ අවස්ථාවයි.' එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ජීවිතයේ යථාර්ථය සොයමින් ගුරුවරුන් සොයා ගිය "බෝසතාණන් වහන්සේ ආලාරකාලාම - උද්දකරාම පුත්ත තාපසවරුන් වෙතින් ද යථාර්ථය හමුනොවේ යැයි සලකා ඔවුන් ද අතහැර [illegible] තනිවම නිවන් සෙවීමෙහි නිරත වූහ" මෙයින් ලෝකයා වෙත සපයන ආදර්ශය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

| දෙවන පිටුව බලන්න.

5. (i) බෝසත් චරිතය තුළින් පැවසෙන බුදුවීමට පෙර පළවා හැරි 'දසමරසෙන්' අතුරින් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) "බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වය සාක්ෂාත් කිරීමේ දී ත්‍රිවිද්‍යා අතුරින් 'සිත ආශ්‍රවයන්ගෙන් මිදීමේ නුවණ (ආසවක්ඛය ඤාණ)' නම් වූ තෙවැනි විද්‍යාව පහළ කළහ." මීට අදාළ සතරාකාර ආශ්‍රවයන් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) මහත් පරිශ්‍රමයකින් නිර්වාණය සාක්ෂාත් කොටගත් බුදුරජාණන් වහන්සේගේ පළමු උදානය ලියා කෙටි සටහනක් සපයන්න. (ලකුණු 06 යි)

(iv) බුද්ධත්වය සාක්ෂාත් කොටගත් බුදුරජාණන් වහන්සේ බෝධීන් වහන්සේට කෘතඥතාව සත්සතිය ගත කළ ආකාරය දක්වා ඉන් ලෝකයට සපයන ආදර්ශය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

6. (i) බුදුරදුන්ගේ පළමු ධර්ම දේශනය කිනම් නගරයක කොතැන්හි දී කවුරුන් අරභයා කිනම් සූත්‍රයක් ලෙස දේශනා කරන ලද්දේදැයි ලියන්න. (ලකුණු 04 යි)

(ii) එම සූත්‍ර දේශනාවෙහි ඇතුළත් නිර්වාණය පිණිස හේතුවන චතුරාර්ය සත්‍යය නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) චතුරාර්ය සත්‍යධර්මයෙහි පළමු ආර්ය සත්‍යය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iv) අනේකවිධ දුෂ්කරදරවලින් පීඩාවට පත් වර්තමාන බිහි ජනතාවගේ දුක්ඛනිරෝධය සඳහා මධ්‍යමප්‍රතිපදාව අනුගමනය කළ හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

## III කොටස

7. (i) බුද්ධශාසනයේ කාන්තා පැවිද්ද කිනම් නගරයක කොතැන්හි දී කවුරුන් අරභයා කිනම් ධර්මයක් පැනවීමෙන් ආරම්භ කරන ලද්දේදැයි දක්වන්න. (ලකුණු 04 යි)

(ii) භික්ෂුණීන් වහන්සේගේ පැවිදි - උපසම්පදාව පිහිටන අෂ්ටගරුධර්ම අතුරින් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බුද්ධකාලීන භාරතීය සමාජයේ කාන්තා විමුක්තිය උදෙසා මහා ප්‍රජාපතීගෝතමී තෙරණියගේ කැපවීම හා ධෛර්ය කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)

(iv) වර්තමාන ශ්‍රී ලංකාවේ ගෘහ ජීවිතයේ ගැටලු නිරාකරණයෙහි ලා මෙහෙණින් වහන්සේගේ හෝ දසසිල් මාතාවන්ගේ හෝ සමාජ කාර්යභාරය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

8. (i) බුදුරදුන්ගෙන් පිහිට ලැබුවන් සිව්දෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) 'තථාගත ජීවිතයේ අවසාන සමයේ දී බුදුරදහු ආනන්ද තෙරුන් අමතා සතර ඉද්ධිපාද වැඩූ තැනැත්තෙකුට අවශ්‍ය නම්, ආයුෂ්කල්පයක් හෝ ඊට වැඩි කාලයක් හෝ ජීවත් විය හැකි යැයි දෙසූහ' මෙහි සඳහන් සතර ඉද්ධිපාද ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ නායකයකු ලෙස ශ්‍රාවක සමාජය වෙත සැපයූ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iv) බුදුරජාණන් වහන්සේ තුළ පැවති අන්‍යාමතවාද ඉවසීමේ ගුණය, අන්‍ය ජාතික හා ආගමික මතවාද නොඉවසන නූතන සමාජය වෙත සපයන ආදර්ශය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

9. (i) බුදුරදුන්ගෙන් අග්‍රස්ථාන ලැබූ සිව්වනක් පිරිසට අයත් සිව්දෙනෙකු හා ඔවුන් ලැබූ අගතනතුරු ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(ii) ශුද්ධෝදන රජපවුලට ඥාතිත්වය ඇතිව සිට බුදුසසුනේ පැවිදි - උපසම්පදාව ලැබූ භික්ෂු - භික්ෂුණී උභය සංඝයාට අයත් සිව්දෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) බුදුරදුන්ගේ පවා විශේෂ අවධානයට යොමු වූ වර්තමානයෙහි පවා බෞද්ධ නිවසෙහි පුද පූජාවන්ට ලක්ව ඇති සීවලී මහරහතන් වහන්සේගේ චරිතය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iv) අභිඥාලාභී භික්ෂුණීන් වහන්සේ අතර අගතනතුරු ලැබූ භද්දකච්චානා තෙරණියගේ ගිහිකල ජීවන පැවැත්ම වර්තමාන විවාහක කාන්තා පරපුර වෙත සපයන ආදර්ශය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

10. (i) බුදුසසුනෙහි ප්‍රථම ද්වේවාචික උපාසකවරුන් දෙපළ හා තෙරුවන් සරණගිය ප්‍රථම උපාසිකාවන් දෙපළ නාම කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුසසුනෙහි සැදැහැයෙන් ක්‍රියාකළ බුද්ධකාලීන කාන්තාවන් සිව්දෙනෙකුගේ නම් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බුදුසසුනෙහි සැදැහැයෙන් හා බුද්ධියෙන් ක්‍රියා කළ උදේන රජුගේ බිසව වූ සාමාවතියගේ චරිතය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iv) වර්තමාන ශ්‍රී ලංකාව තුළ බුද්ධශාසනයේ ආරක්ෂාව හා පෝෂණය උදෙසා දායක - දායිකාවන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 06 යි)

* * *

# දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2016 (2017)

## (01) බුද්ධ චරිතය

01.

(i) i. ඍග්වේදය ii. යජුර්වේදය
iii. සාමන්වේදය iv. අථර්වන්වේදය

(ලකුණු 04 යි)

(ii) i. වේණ (කුළුපොතු කාරයෝ)
ii. නේසාද (වැද්දෝ)
iii. පුක්කුස (කසල ශෝධකයෝ)
iv. චණ්ඩාල (සැඩොල්)
v. රථකාර (රිය තනන්නෝ)

(ලකුණු 04 යි)

(iii) ඒක මේවතු ශූද්‍රස්ස - ප්‍රභූ කර්ම සමාදිසත්
ඒතේ සාමේව වර්ණානාං - සුශ්‍රෑසා මනුසූයයා
ශූද්‍ර වංශිකයන්ට නියමිතව පැවතියේ එකම කාර්යකි. එනම්, දාසභාවය යි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන ඉහළ තුන් කුලයේ අය උදෙසා උපතේ සිට විපත දක්වාම බැල මෙහෙකම් කිරීම යි. මේ අනුව රටට අවශ්‍ය ශ්‍රමදායී පිරිස ලෙසින් ශූද්‍රවංශිකයන් යොදාගෙන තිබූ බව මෙයින් කියවේ.

(ලකුණු 06 යි)

(iv) වර්ණ ධර්මය හෙවත් කුල ක්‍රමය බෞද්ධ ඉගැන්වීම් තුළින් නිර්දය ලෙස විවේචනයට ලක්ව ඇත. එමෙන්ම මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ ආකාරය ත්‍රිපිටක සාහිත්‍යයෙන් ප්‍රකට වේ. අග්ගඤ්ඤ, චක්කවත්ති සීහනාද, අස්සලායන, අම්බට්ඨ, මධුර, වසල, වාසෙට්ඨ ආදි සූත්‍ර රැසකින් විවේචනයට ලක්කොට බැහැර කරන ලදී.
අද්වෛතවාදී බෞද්ධ චින්තනයට අනුව විශ්වමාපක මහා බ්‍රහ්මයකු පිළිබඳ විශ්වාස නොකරයි. ඒ නිසාම එබඳු පුද්ගලයෙකුගේ මැවීම් ද නොපිළිගැනේ. නිර්මාණවාදී ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරයි. සමාජ සංස්ථා කිසිවෙකුගේ මැවීමක් නොව හේතුවාදීව ඇති වූ බව බෞද්ධ ඉගැන්වීම යි. අග්ගඤ්ඤ සූත්‍රයෙහි ඒ බව සවිස්තරව දක්වේ. එයින් සමාජ සත්වයාගේ සම්භවය හා විකාශයත් ක්‍රමයෙන් සිදුවූ අයුරුත් විස්තර වේ.
දීඝනිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රයට අනුව කුල ක්‍රමය ඇති වූ ආකාරය පැහැදිලි කෙරේ. පොදු අයිතිය යටතේ පරිහරණය කළ කෙත්වතු පෞද්ගලික අයිතියට ගැනීම මෙහි මුල් අවස්ථාව යි. ඉන්පසු එතෙක් සමාජයේ පැවති සමානාත්මතාව පලුදු විය. සාමය, සමගිය, සහජීවනය දුරස්ථ විය. සමාජයේ දුප්පත්, පොහොසත් භේදය, ඉඩම් හිමි පිරිසක්ද ඉඩම් අහිමි පිරිසක්ද ඇති වූහ. ඇති හැති පරතරයක් උදාවිය. හැකි හැකි පිරිසක් මෙන්ම ඇති නැති පිරිසක්ද බිහි වූහ. මෙසේ දුප්පත්කම ප්‍රකට වීම සමාජ ගැටලු රැසකට මග පෑදීමක් විය.
සමාජගත මෙම අවාසනාවන්ත තත්ත්වය සලකා බැලූ බුද්ධිමත් ජනතා හිතකාමී පිරිසක් එක් වී සාකච්ඡා කළහ. අපරාධ, දූෂණ, භීෂණ නැතිකොට යළිත් සමාජයේ සාමය, සමගිය, දියුණුව උදාකරලීම පිණිස පාලකයෙකු පත්කර ගැනීමට තීරණය කළහ. ඔවුන් අතරින් දක්ෂ, කාර්යශූර, බුද්ධිමත් මනා පෞරුෂයකින් යුත් එක් අයෙකු තෝරාගත්හ. ඔහුට වගකීම් හා බලතල පැවරූහ. මෙසේ මහජන සම්මතයෙන් තෝරා පත්කරගත් එම පුද්ගලයා මහා සම්මත යන නාමයෙන් හැඳින්විය.

(iv)

- ❖ සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වූ ආර්ථික කටයුතු පෞද්ගලික අංශය මගින්ද සාමූහික ව්‍යාපාර ලෙසද ආරම්භ කිරීමට හා පවත්වාගෙන යෑමට ඉඩ ප්‍රස්ථාව සලසා දීම.
- ❖ කෘෂිකර්මික, වෙළෙඳ හා කර්මාන්ත සංවර්ධන යන අංශ ප්‍රධාන කොට ඒවාට රජය විසින් ධෛර්ය හා මූලධනය සැපයීම.
- ❖ රට තුළ රෙදිපිළි, සම්භාණ්ඩ, දව භාණ්ඩ, ගොඩනැගිලි ද්‍රව්‍ය, මැටි භාණ්ඩ, රතු භාණ්ඩ, කෘෂි උපකරණ, කලා භාණ්ඩ ආදී නිෂ්පාදන සඳහා කර්මාන්ත ආරම්භ කිරීම හා ඒවා දියුණු කිරීමට ධෛර්ය සැපයීම.
- ❖ භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා මාර්ග පද්ධතිය දියුණු කිරීම හා පුළුල් කිරීම.
- ❖ ගංගා ආදී ජල මාර්ග තුළින් ද ප්‍රවාහන කටයුතු වලට අවස්ථා සලසා දීම.

ආදී කරුණු ඇසුරින් ප්‍රමාණවත් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

(ලකුණු 06 යි)

04.

(i)

| | | | |
|---|---|---|---|
| i. | රාම | v. | කොණ්ඩඤ්ඤ |
| ii. | ධජ | vi. | භෝජ |
| iii. | ලක්ඛණ | vii. | සුයාම |
| iv. | මන්ත්‍රී | viii. | සුදත්ත |

යන නම් අතරින් හතරකි.

(ලකුණු 04 යි)

(ii) i. අසිත තාපසතුමා සිද්ධාර්ථ කුමරු බැලීමට පැමිණි අවස්ථාව.

ii. වප් මඟුල් උත්සව අවස්ථාවේ කුමරු පළඟක් බැඳගෙන ආනාපාන සතිය වැඩූ අවස්ථාව යන අවස්ථා දෙක කෙටියෙන් විස්තර දක්වා තිබිය යුතු වේ.

(ලකුණු 04 යි)

(iii) මහල්ලෙකු, ලෙඩෙකු, මළමිනියක හා පැවිදි රුවක දක්නට ලැබිණි. මෙයින් මෙලොව උපන් සත්වයා අනුක්‍රමයෙන් ජරාව කරා පියනගන බවත්, එසේම උපන් සත්වයා ව්‍යාධිය විසින් පීඩාවට පත් කරනු ලබන බවත්, ඔහු කෙරෙහි සෙනෙහසින් බැඳී සිටින්නන්ට දුක හා ශෝකය නිරන්තරයෙන් ඇති වන බවත් කුමරුට වැටහිණ. උපන් සත්වයා ජරාවට පත්වීම, රෝගී වීම නිසා නිරන්තරයෙන් පීඩාවට ලක්වනවා පමණක් නොව මරණය නමැති දුකට ද භාජනය වන බවත් මේ ක්‍රියාවලිය නැවත සිදුවීම නිසා සත්වයා දුකට පත්වන අයුරු ගැඹුරින් කල්පනා විය.

පැවිදි රුවක් දක්ම තුළින් දුක් විඳින සත්වයන්ට ඉන් මිදීමේ මගක්ද ලොව තුළ තිබෙන බව කල්පනා විය. එම මග කුමක්දැයි සොයන්නට කුමරු තුළ උනන්දුවක් ද ඇති විය. මෙය චතුරාර්ය සත්‍ය පිළිබඳ මූලික සංකල්පය යි.

ඉමබඳ පිළිතුරක් අපේක්ෂා කෙරේ.

(ලකුණු 06 යි)

(iv) ලෝකයා වෙත සපයන ආදර්ශය වන්නේ තමාගේ අභිමතාර්ථය සාධනය වන තෙක් නොපසුබටව අනලස්ව ධෛර්යයෙන් ක්‍රියා කළ යුතු බව යි.

මෙයට අදාළව බෝසත් චරිතය ඇසුරින් ප්‍රමාණවත් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

(ලකුණු 06 යි)

05.

(i) i. කාමය ii. අරතිය iii. සා-පිපාසාව vi. භය
vii. විචිකිච්ඡාව viii. ගුණමකු බව හා දැඩි බව iv. තෘෂ්ණාව
ix. ලාභ සත්කාර හා වැරදි මාර්ගයන්ගෙන් ලබන යසස v. ථිනමිද්ධය
x. තමන් උසස් කොට සලකමින් අනුන් පහත් කොට සැලකීම යන කරුණු අතරින් හතරකි.

(ලකුණු 04 යි)

(ii) i. කාමාසව
ii. භවාසව
iii. දිට්ඨාසව
iv. අවිජ්ජාසව යන යි.

(ලකුණු 04 යි)

(iii) අනේකජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තෝ - දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨෝසි - පුනගේහං නකාහසී
සබ්බාතෙ ඵාසුකාභග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛය මජ්ඣගා

නැවත නැවත ඉපදීම දුකකි. පඤ්චස්කන්ධය නමැති ගෙය තනන වඩුවා සොයමින් මෙතෙක් සසර පුරා ඇවිද්දෙමි. තණ්හා නමැති වඩුව, මා විසින් තා දක්නා ලද්දෙමි. නැවත තා මට ආත්මභාව නමැති ගෙය නොසාදන්නෙහිය. තාගේ සියලු කෙලෙස් නමැති පරාළ හා අවිද්‍යා කැණි මඩල මා විසින් විනාශ කරන ලද්දෙමි යනු යි.
මෙම උදානය පාලි ගාථාවලින් හෝ සිංහල අර්ථය හෝ ලියා ඒ ගැන කෙටියෙන් පැහැදිලි කර තිබීම අවශ්‍ය වේ.

(ලකුණු 06 යි)

(iv) i. පළමු සතිය බෝමැඩ වැඩ සිටීම - අර්හත්ඵල සමාපත්තියට සමවැද විමුක්ති සුවයෙන් විසීම.
ii. අනිමිසලෝචන පූජාව - බෝධීන් වහන්සේ දෙස ඇසිපිය නොහෙළා බලා සිටීමෙන් උපහාර දැක්වීම.
iii. රුවන් සක්මන - බෝ මැඩටත් අනිමිසලෝචන පූජාව කළ ස්ථානයටත් අතර නැගෙනහිරට හා බස්නාහිරට සක්මන් කිරීම තෙවැනි සතිය යි.
iv. හතර වැනි සතිය රුවන්ගෙයි වැඩ සිටීමින් තමන් වහන්සේ අවබෝධ කළ ධර්මය ගැඹුරින් මෙනෙහි කරමින් වැඩ සිටීම හා සිරුරින් සවණක් ගන බුදුරැස් විහිදීම.
v. පස්වැනි සතිය අජපාල නුගරුක වෙත වැඩම කොට එහි වැඩ හිඳිමින් ධර්මය නුවණින් සලකමින් විමුක්ති සුවය විඳිමින් ගත කිරීම.
vi. සයවන සතිය අජපාල නුගරුක සමීපයෙහි මුචලින්ද නම් වෘක්ෂය මුල සතියක් වැඩ සිටීම. එහිදී අකාල මහාවර්ෂාවක් ඇද හැලීම නිසා බුදුරදුන්ට සිදුවන පීඩාවෙන් මුදවා ගැනීමට මුචලින්ද නාග රාජයා සතිය පුරාම සෙවන සැලසීම.
vii. සත්වන සතිය කිරිපලු නුගරුක මුල අර්හත්ඵල සමාපත්ති සුවයෙන් වැඩ සිටීම යනු යි.

- තමාගේ අභිමතාර්ථ සාධනයට උපකාර කළ බෝධිවෘක්ෂයට උපහාර හා ගෞරව දැක්වීම තුළින් කෘතඥතා පූර්වක වීමේ ගුණය
- තමා ලද විමුක්ති සුවය විඳිමින් විවේකීව වාසය කිරීමෙන් තමා ලද ජයග්‍රහන අන්‍යයන්ට කරදර හිරිහැර නොවන පරිදි ස්මරණයෙන් සැමරීමේ හා සතුට භුක්ති විඳීමේ ගුණය.

ආදී කරුණු ලෝකයා වෙත සපයන ආදර්ශ ලෙස මතුකොට තිබිය යුතුවේ.

(ලකුණු 06 යි)

05.

(i) i. බරණැස් නුවර
ii. ඉසිපතනයේ මිගදායේ දීය.
iii. පස්වග තාපසවරුන් අරහයා
iv. ධම්මචක්කප්පවත්තන සූත්‍රය

(ලකුණු

(ii) i. දුක්ඛ ආර්ය සත්‍යය
ii. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
iii. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
iv. දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය යනුයි

(ලකුණු 04

(iii)

❖ ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං
අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො
යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛාති
❖ ඉපදීම දුකකි. ජරාවට පත්වීම දුකකි. ලෙඩ වීම දුකකි. මරණයට පත්වීම දුකකි. අප්‍රියයා හා එක්වීම දුකකි. ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකකි. ප්‍රාර්ථනා කරන දේ නොලැබීම දුකය. කෙටියෙන් පවසතොත් පංච උපාදානස්කන්ධය ම දුකකි. මෙය දුක්ඛ ආර්ය සත්‍යය යි.
❖ පාලියෙන් හෝ සිංහලෙන් හෝ කෙටියෙන් විස්තර කර තිබීම අවශ්‍ය වේ.

(ලකුණු 06 (

(iv) ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රි ශික්ෂාවට අනුව ආනුපූර්විකව අනුගමනය කළ හැකි ආකාර දක්වා තිබිය යුතුය.

(ලකුණු 06 (

07.

(i) i. විශාලාමහනුවර ii. කූටාගාර ශාලාවේදී
iii. මහාප්‍රජාපතීගෝතමී දේවිය ඇතුළු පන්සියයක් කාන්තාවන් අරභයා
iv. අෂ්ටගරුධර්ම පැනවීමෙනි.

(ලකුණු 04 (

(ii) i. උපසපන් වී වස් සියයක් ඉක්ම වූ මෙහෙණිය ද එදින උපසපන් භික්ෂුව දැක ගරු කළ යුතුය.
ii. භික්ෂුණිය භික්ෂූන් නැති පෙදෙසක වස් විසීම නොකළ යුතුය.
iii. අඩ මසකට වරක් භික්ෂුණිය භික්ෂූන් මුණගැසී පොහොය විචාරීම, අවවාද ලබා ගැනීම ද කළ යුතුය.
iv. භික්ෂුණියක වස් අවසානයේ භික්ෂු - භික්ෂුණී යන උභය සංඝයා ඉදිරියේ පවාරණය කළ යුතුය.
v. භික්ෂුණිය අතින් ගරුකාපත්තියක් සිදු වූ විට එයින් පිරිසිදු වීමට භික්ෂු - භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ දෙපෝයක් මානත්පුරා අබ්භාන විනය කර්මය කළ යුතුය.
vi භික්ෂුණිය උපසම්පදාවට පෙර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති පුරමින් සික්ඛමානාවක වශයෙන් දස අවුරුද්දක් පුහුණු කොට උභතෝ සංඝයා ඉදිරියේ උපසම්පදාව ලබා යුතුය.
vii. භික්ෂුණියක් කිසිම හේතුවක් නිසා භික්ෂුවකට ආක්‍රෝශ නොකළ යුතුය.
viii. භික්ෂුණිය භික්ෂූන්ට අවවාද නොකළ යුතුයි. භික්ෂූන් විසින් දෙනු ලබන අවවාද පිළිගත යුතුය යනු යි. මෙයින් හතරකි.

(ලකුණු 04 (

(iii) i. මහාප්‍රජාපතී ගෝතමිය පැවිද්ද ඉල්ලමින් කහවස්ත්‍ර හැඳ තවත් කාන්තාවන් පිරිවරාගෙන අනගාරිකව කටයුතු කිරීම.

ii. බොහෝ දුරකතර ගෙවා විශාලාවේ කූටාගාර ශාලාව වෙත පැමිණ පැවිද්ද ඉල්ලීම.

iii. පළමුවර, දෙවැනිවර හා තෙවැනිවර දක්වා එම ඉල්ලීම බුදුරදුන් විසින් ප්‍රතික්ෂේප කළත් නැවත නැවත උත්සාහ කිරීම.

iv. අෂ්ට ගරුධර්ම පිළිගැනීමෙන් අනතිමානීව ශික්ෂණයට යොමුවීම.

v. සෙසු භික්ෂුණීන් වහන්සේට නායකත්වය ලබාදෙමින් පැවිදි උපසම්පදාවට පෙරමුණ ගැනීම ආදී කරුණු ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුවේ.

**(ලකුණු 06 යි)**

(iv) සමාජ, ආර්ථික හා දේශපාලනික බලපෑම් හේතුවෙන් වර්තමාන ශ්‍රී ලංකාවේ පවුල් ඒකක තුළ විවිධ ගැටලු පැන නැඟී ඇත. ස්වාමි - භාර්යා, දෙමාපිය - දූ දරු, සහෝදර - සහෝදරියන්, ඥාති - මිත්‍රයන් ආදී ඥාති සම්බන්ධතා ද අතර විවිධ අර්බුද පැන නැඟී ඇත.

කාන්තාව ගෘහණියක්, බිරිඳක්, මවක්, සහෝදරියක්, නැගණියක් දියණියක් වශයෙන් විවිධ භූමිකා නියෝජනය කරන අතර ඒ ඒ භූමිකාහි දී ඒ ඒ පාර්ශ්වයන් විසින් ප්‍රචණ්ඩත්වයට හා අපයෝජනයට ලක්වන අවස්ථා බහුල වී තිබේ. ගෘහස්ත ප්‍රචණ්ඩත්වය තුළ කාන්තාවගේ මානසිකත්වය අවපාතයකට ලක්වීමත්, එම ගැටලු විෂයෙහි භික්ෂූන් වහන්සේ නමකට වඩා භික්ෂුණියකට හෝ දසසිල් මාතාවකට සමීපව මැදිහත්ව ක්‍රියා කිරීමෙන් ගෘහස්ථ අර්බුද මගහරවා ගැනීමටත්, නීතියෙන් සිදුවන දික්කසාද ආදී නීතිමය ක්‍රියාමාර්ග වෙත යොමු නොවී සාමකාමීව විසඳා ගැනීමටත් හැකියාව තිබේ. එබැවින් භික්ෂුණියකගේ සමාජ කාර්යභාරයක් ලෙස සලකා විචාරාත්මකව දක්වා තිබීම අපේක්ෂා කෙරේ.

**(ලකුණු 06 යි)**

08.

(i) i. කුඹුර පාළුවට ගිය බමුණා

ii. පූතිගත්ත තිස්ස තෙරුන්

iii. දරුවන් විසින් අතහැර දැමූ මහලු පියා

iv. කිසාගෝතමිය

v. පටාචාරාව ආදීන් අතරින් සිව් දෙනෙකි.

**(ලකුණු 04 යි)**

(ii) i. ඡන්ද

ii. චිත්ත

iii. විරිය

iv. වීමංස

**(ලකුණු 04 යි)**

(iii) සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ පැවිදිව නිවන ගවේෂණයෙහි යෙදෙන්නට වූයේ තමාට නිඃායාසයෙන් ලැබෙන්නට තිබූ සක්විති රාජ්‍ය සම්පත්තිය පිළිබඳ උරුමය හා එම භෞතික සමාජ නායකත්වය සිතින් සපුරා බැහැර කරමිනි. ඒ වන විටත් ශාක්‍ය රාජ්‍යයේ අධිපති වූ බෝසතුන්ට නායකත්වය පිළිබඳ ගැටලුවක් නොවිය.

❖ උන්වහන්සේගේ නිර්වාණය සාක්ෂාත් කිරීමත්, බුදුරදුන් ලොව පහළව පෙර නොඇසූ සත්‍ය දහමක් දෙසති යන කීර්තිරාවය භාරතය පුරා පැතිර යෑමත්, ඒ නිසා සිව් දිශාවෙන් අනුගාමිකත්වය ප්‍රාර්ථනා කරමින් සතර කුලයෙන් විවිධ පිරිස් බුදුරදුන් වෙත පැමිණීමත් නායකත්වය තුළම සිදුවිය.

- ❖ නායකයෙකු තුළ තිබිය යුතු මහා පෞරුෂය බුදුරදුන් තුළ මැනවින් පිහිටියේ දුටුවන් වශීකරන ආරෝහපරිනාහ දේහ සම්පත්තියක් ශරීර ශෝභාවක්, රූ සෞන්දර්යක් පිහිටා තිබුණේය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, අශීති ඛුද්‍රානුව්‍යඤ්ජන ආදී ශාරීරික භෞතික අංග තුළින් නායකයෙකුගේ විශේෂ ලක්ෂණ ප්‍රකට වේ.
- ❖ බුදුරජාණන් වහන්සේගේ චරිතයේ සෑම අංශුවක්ම වූයේ පූර්ණ නායකයෙකු යන උදාර ආදර්ශය යි. රහසින්වත් පව්නොකළ උන්වහන්සේගේ චරිතය පුරා ආදර්ශය පිරී තිබිණ. උන්වහන්සේ යමක් ප්‍රකාශ කරන්නේ ද, ප්‍රකාශ කරන දෙයම ක්‍රියාත්මක කරන යථාවාදී තථාකාරී ගුණයෙන් යුක්ත වූහ.
- ❖ විනය ශික්ෂා පැනවීමත්, බොහෝ දෙනාගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දීමත්, ඒ අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත් නායකයෙකුගේ උසස් ලක්ෂණයකි.
- ❖ සානුකම්පිතව ශ්‍රාවකයා කෙරෙහි කටයුතු කිරීම ආදී කරුණු ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුවේ.

**(ලකුණු 06 යි)**

(iv)

- ❖ බුදුරජාණන් වහන්සේ ජීවිතයේ සෑම අවස්ථාවක ම අන්තවාදයෙන් බැහැරව මධ්‍යස්ථව ක්‍රියා කළහ.
- ❖ බුදුරදුන් හා වාදයට පැමිණි බොහෝ දෙනා ඔවුන් ප්‍රකාශ කළ කරුණුවල ඇතුළත් නිසරු බව වටහාගෙන දහමෙහි පැහැදී ශාසනයට ඇතුළත් විම.
- ❖ භික්ෂු සමාජයේ යහපත උදෙසා නොයෙක් තරාතිරම්වල අය ඉදිරිපත් කළ අදහස් පිළිගැනීමට තරම් නිහතමානී විම.
- ❖ වරක් ජීවක වෛද්‍යවරයා උදේනියේ චණ්ඩපජ්ජෝත රජුගෙන් ලැබූ අගනා සීවෙය්‍යක වස්ත්‍ර දෙකක් බුදුරදුන්ට පූජා කළේය. එය කැප වූවක් ලෙස පිළිගන්නා මෙන් ඉල්ලා සිටියේය. භික්ෂු සංඝයාට ගහපති චීවරයද අනුදන වදාළහ.
- ❖ රාහුල කුමරු පැවිදි කළ අවස්ථාවේ සුද්ධෝදන රජුගේ ඉල්ලීම වූයේ මව්පියවරුන්ගේ අවසරය නොලැබ දරුවන් මහණ නොකරන ලෙසයි. එය බුදුරදුන් පිළිගත්හ.
- ❖ භික්ෂු සංඝයාට අවශ්‍ය වැසි සළු, ගිලන් බෙහෙත්, ආගන්තුක වත්, ගමික වත්, හිනි කැඳ ආදිය අනුදන වදාළේ විශාඛාවන් විසින් කරන ලද ඉල්ලීම නිසාය.
- ❖ විනය පිටකයේ බොහෝ ශික්ෂා පද මහජනයාගේ උද්ඝෝෂණයෙන්, අදහස් දැක්වීම මුල් කොටගෙන පනවා ඇති බව සඳහන් වේ. සාධාරණ මහජන මතවලට සවන්දීම නිසා ශික්ෂාපද පනවා ඇති බව පෙනේ.
- ❖ කාන්තාවන් උදෙසා පැවිද්ද ලබා දීම ද මහාප්‍රජාපතී ගෝතමියගේ ඉල්ලීම අවස්ථා තුනකදී ප්‍රතික්ෂේප කළත් ආනන්ද තෙරුන්ගේ කරුණු පැහැදිලි කිරීමෙන් පසුව කාන්තා පැවිද්ද ලබා දුන්හ.
- ❖ චාතුමා නගරයේ තෙල්ලි වනයෙහි වැඩ සිටිද්දී සැරියුත් - මුගලන් දෙදෙනා වහන්සේගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ පන්සියයක් ඝෝෂාව නිසා ඔවුන් හමුවීම ප්‍රතික්ෂේප කිරීමත් පසුව කරුණු පැහැදිලි කිරීමටත් ආදී අවස්ථා ලබාදීමත් ආදී කරුණු ඇසුරින් පිළිතුරු සකස්.වී තිබිය යුතුය.

**(ලකුණු 06 යි)**

09.

(i)

- ❖ මහා ප්‍රාඥයන් අතර අග තනතුර ද ධම්මසේනාපති තනතුර ද දකුණත් සව් තනතුර ද ලැබුණේ සැරියුත් තෙරුන්වහන්සේය.
- ❖ සෘද්ධිමතුන් අතර අගතනතුර ද වමත් සව් තනතුර ද මුගලන් තෙරුන්ට හිමි විය.
- ❖ ධුතවාදී භික්ෂූන් අතර අගතනතුර මහාකාශ්‍යප තෙරුන්ට හිමිවිය.

- ❖ අග්‍ර උපස්ථායක තනතුර, ධර්ම භාණ්ඩාගාරික තනතුර, බහුශ්‍රැතයන් අතර අගතනතුර, සිහි කල්පනා ඇත්තවුන් අතර අගතනතුර අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර අගතනතුර, ධෛර්ය සම්පන්නවුන් අතර අගතනතුර යන තනතුරු රැසක්ම ආනන්ද තෙරුන් වෙත පිරිනැමිණ.
- ❖ බුදුසසුනෙහි ලාභීන් අතර අගතනතුර සීවලි මහරහතන් වහන්සේ වෙත පිරිනැමිණ.
- ❖ ශික්ෂාකාමී භික්ෂූන් අතර රාහුල තෙරණුවෝ අගතනතුරු ලැබූහ.
- ❖ ධර්මය අර්ථ විභාග කොට දක්වන්නවුන් අතර මහාකච්චායන තෙරුන් වහන්සේ අග තනතුර ලැබූහ.
- ❖ ධර්ම කථිකයන් අතර අගතනතුර පුණ්ණමන්තානිපුත්ත තෙරුන්ට පිරිනැමිණ.
- ❖ පිවිතුරුව ධර්මය දේශනා කරන්නවුන් අතරින් කුමාරකාශ්‍යප තෙරණුවෝ අගතනතුරු ලැබූහ.
- ❖ චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර මහාප්‍රජාපතිගෝතමී තෙරණිය අගතනතුරු ලැබිය.
- ❖ අභිඥාලාභීන් අතර භද්දකච්චානා තෙරණියත් මහාප්‍රඥා තෙරණිවරුන් අතර ඛේමා තෙරණියත් සෘද්ධිමත් භික්ෂුණිය අතර උප්පලවණ්ණා තෙරණියත් ධර්ම කථික තෙරණිවරුන් අතර ධම්මදින්නා තෙරණියත් විනයධර තෙරණිවරුන් අතර පටාචාර තෙරණියත් අගතනතුරු ලැබූහ.
- ❖ සුදත්ත හෙවත් අනේපිඩු සිටු අග්‍රදායක තනතුරත්, චිත්ත ගෘහපති ධර්ම කථිකයන් අතර අගතනතුරත් හත්ථාලවක රජු සතර සංග්‍රහ වස්තුවෙන් රට වැසියාට සංග්‍රහ කළවුන් අතර අගතනතුරත් ප්‍රිය දෑ දෙන්නවුන් අතරින් උග්ග ගෘහපතියාත් අචල ශ්‍රද්ධා ඇත්තවුන් අතරින් සූරම්බට්ඨ ද පෞද්ගලික ප්‍රසාද ඇත්තන් අතරින් ජීවක කෝමාරභච්ච ද සංඝෝපස්ථායකයන් අතරින් උග්ගත ගෘහපතියා ද විශ්වාස කථා ඇත්තවුන් අතරින් නකුලපිතා ගෘහපතියා ද අගතැන් ලැබූහ.
- ❖ අග්‍රදායිකා තනතුර විශාඛා උපාසිකාවට ද ප්‍රණීත දෑ දෙන දායිකාවන් අතරින් සුප්පවාසාභිව ද ධ්‍යානලාභීන් අතරින් උත්තරා උපාසිකාව ද බහුශ්‍රැත උපාසිකාවන් අතරින් ඛුජ්ජුත්තරාව ද නොසෙල්වෙන සැදැහැතියන් අතරින් කාකියානිද විශ්වාස කථා ඇත්තියන් අතරින් නකුලමාතාව ද මෛත්‍රී විහාර ඇත්තියන් අතරින් සාමාවතිය ද ආරංචියෙන් බුදුගුණ අසා පැහැදුනවුන් අතරින් කාලි ද ගිලානෝපස්ථාන උපාසිකාවන් අතරින් සුප්පියාද යන අය අග්‍රස්ථාන ලැබූහ.
- ❖ මේ අය අතරින් හතර දෙනෙකි.

(ලකුණු 04 යි)

(ii)
- i. රාහුල කුමරු - රාහුල පොඩි හාමුදුරුවන් ලෙසද
- ii. නන්ද කුමරු - නන්ද තෙරුන් ලෙසද
- iii. දේවදත්ත කුමරු - දෙව්දත් තෙර ලෙසද
- iv. මහාප්‍රජාපතීගෝතමිය - මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය ලෙසද
- v. යශෝදරා දේවිය - යශෝදරා තෙරණිය ලෙසද
- vi. නන්දා කුමරිය - නන්දා තෙරණිය ලෙසද සසුන්ගත වූහ.

(ලකුණු [illegible] යි)

(iii)
- ❖ බුදුසසුනේ ලාභීන් අතර අග්‍රස්ථාන ලැබූ සීවලී මහරහතන් වහන්සේ විදර්ශී බුදුරදුන් දවස ප්‍රාර්ථනාවක් සම්පූර්ණ වීම ලෙස විස්තර වේ.
- ❖ චාරිකාවේ වඩින බුදුරදුන් ද සීවලී මහරහතන් වහන්සේ කැටුව වැඩම කිරීමට වැඩි කැමැත්තක් දක්වූ බව සඳහන් වේ.
- ❖ සීවලී කුමරුගේ උප්පත්තිය, පැවිද්ද හා ලාභීන් අතර අග්‍රස්ථාන ලැබීම ආදී තොරතුරු ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.

(ලකුණු 06 යි)

(iv) භද්දකච්චානා සුප්පබුද්ධ රජුගේ හා අමිතා දේවියගේ දියණිය යි. දේවදත්ත කුමරුගේ සහෝදරිය යි. සිද්ධාර්ථ රජුගේ බිසව යි. ඇය යශෝදරා නමින් ද හැඳින්වේ.

- ❖ යහපත් බිරිඳක ලෙස භද්දකච්චානාව සිදුහත් කුමරුට ඉමහත් ආදරයෙන් සැලකුවාය.
- ❖ වසර 13ක් කුමරුගේ සිත් දිනාගෙන සතුටින් විසුවාය.
- ❖ සිදුහත් රජුගේ වෙන්ව යෑම ගැන අතිශයින් දුක්වූවා ය.
- ❖ සිඟිති පුතු රාහුල් කුමරුගේ සුරතල් දකින්නට නොසිට සිදුහත් රජු ගිහිගෙන් වෙන්ව යෑම ගැන ඇය අතිශයින් දුක් වූවාය.
- ❖ යස ඉසුරින් පිරි හෙයෙක් රාජ කුමාරවරුන් විසින් ඇයව දෙවන විවාහයක් සඳහා යෝජනා එවූ නමුත් ඒවා සියල්ල ප්‍රතික්ෂේප කළ ඇය සිදුහත් රජ ගැන ඉමහත් භක්තිමත් වූවාය.
- ❖ සිදුහත් රජු අභිනිෂ්ක්‍රමණය කිරීමෙන් පසු භක්තිමත් බිරිඳක ලෙස සිය ස්වාමියා පිළිබඳ අදහසින් හා ප්‍රාර්ථනාවෙන් ම පසු වූවාය.
- ❖ සිදුහත් තවුසාණන් කහවත් හඳින බවත් එක් වේලක් පමණක් වළඳන බවත් අසා ඇයද එසේ කළාය.
- ❖ බුදුරදුන් කිඹුල්වතට වැඩම කළ අවස්ථාවේ භද්දකච්චානාව සිය මාළිගයේදී බුදුරදුන්ගේ දෙපා අල්වාගෙන බොහෝ වේලාවක් හඬා කඳුලු සැලූ බව සඳහන් වේ.
- ❖ ඇයගේ ස්වාමි භක්තිය, ස්වාමියා පිළිබඳ කැපවීම හා ආදරය නූතන කාන්තා පරපුරට ආදර්ශයක් ලෙස පිළිතුර සකස් වී තිබිය යුතුය.

(ලකුණු 06 යි)

10.

(i)
- i. තපස්සු
- ii. භල්ලුක
- iii. බරණැස් සිටුවරයාගේ බිරිඳ
- iv. යසකුල පුත්‍රයාගේ බිරිඳ

(ලකුණු 04 යි)

(ii)
- i. සුජාතා
- ii. බන්ධුලමල්ලිකා
- iii. සුප්පවාසා
- iv. සාමාවතී
- v. මල්ලිකා බිසව ආදීන්ගෙන් හතර දෙනෙකි.

(ලකුණු 04 යි)

(iii)
- ❖ උදේනි රජුගේ බිසව වූ සාමාවතිය ශ්‍රද්ධාවෙන් කටයුතු කරමින් ශාසනික කටයුතුවලටත් බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයෙන් ඇප උපස්ථාන කළ තැනැත්තෙකි.
- ❖ දන්සලේ යාචකයන්ගේ කලබලය, ඝෝෂාව ඇති නොවන ලෙස ක්‍රමවත් පිළිවෙළකට දන් බෙදාදීමට උපදෙස් ලබා දීමෙන් බුද්ධිමත්ව හා සැලසුම් සහගතව ක්‍රියා කිරීමේ හැකියාව පෙන්නුම් කෙරේ.
- ❖ සාමාවතී චරිතය ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.

(ලකුණු 06 යි)

(iv) වර්තමාන ශ්‍රී ලංකාව තුළ බුද්ධ ශාසනයේ ආරක්ෂාව හා පෝෂණය උදෙසා උපාසක උපාසිකාවන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කොට තිබිය යුතුය. සමස්ථයක් සේ සලකා ලකුණු ලබාදිය හැකිය.

(ලකුණු 06 යි)

********************

# දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2017 (2018)

## ලකුණු දීමේ පටිපාටිය

## (01) බුද්ධ චරිතය

### I – කොටස

බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍යය, ශූද්‍ර

*(එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 04යි.)*

ඉගෙනීම, ඉගැන්වීම, යාග කිරීම, යාග කරවීම, දන් දීම, දන් පිළිගැනීම

*(ලකුණු 04යි.)*

බ්‍රාහ්මණොස්‍ය මුඛමාසිද් - බාහු රාජන්‍යඃ කෘතඃ

ඌරූතදස්‍ය යද්වෛශ්‍යඃ - පද්භ්‍යාම් ශූද්‍රෝ අජායත

මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බමුණෝ උපන්හ. දෙබාහුවලින් ක්ෂත්‍රියයෝ පහළ වූහ. දෙකලවායෙන් වෛශ්‍යයෝ උපන්හ. දෙපතුලින් ශුද්‍රයෝ උපන්හ. යනුයි.

*(ලකුණු 06යි.)*

භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ මෙසේ කිවාහු ය. බ්‍රාහ්මණයෝම ශ්‍රේෂ්ඨයහ. සෙසු වර්ණ (කුල) පහත්ය. බ්‍රාහ්මණ වර්ණය ශුක්ලය. (සුදුය) සෙසු වර්ණ කෘෂ්ණය. (කළුය) බ්‍රාහ්මණයෝම පරම පවිත්‍ර වෙත්. සෙසු වර්ණ එසේ නොවෙත්. බ්‍රාහ්මණයෝ බ්‍රහ්ම පුත්‍රයෝ ය. පපුවෙහි වැස මුවින් උපන්නෝය. බ්‍රහ්මයෙන්ම උපන් බැවින් බ්‍රාහ්මජයහ. බ්‍රාහ්මයා විසින්ම නිමවන ලද බැවින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මයාට පිහිටකර වසන බැවින් බ්‍රහ්ම දායාදයහ. (අස්සලායන සූත්‍රය)

බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර ඉතා වැදගත් කොට සලකනු ලැබූ වර්ණ ධර්ම හෙවත් කුලක්‍රමය ද එම කුල ක්‍රමයට අයත් යුතුකම්, වගකීම්, කුලධර්මයන් ලෙස සැලකෙන ස්වධර්මයන් ද බෞද්ධ ඉගැන්වීම් තුළින් නිර්දය ලෙස විවේචනයට ලක් වී තිබේ. එපමණක්ද නොව මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ ආකාරය ද ත්‍රිපිටක ගත සූත්‍රවලින් අවධාරණය වේ. මෙහිලා අග්ගඤ්ඤ, චක්කවත්ති සීහනාද, අස්සලායන, පොට්ඨපාද, අම්බට්ඨ, මධුර, වසල, වාසෙට්ඨ ආදී සූත්‍ර රැසකින් ම විවේචනයට ලක් කොට ඇත

- අග්ගඤ්ඤ සූත්‍රයෙහි එන චතුර්වර්ණයෙහි උපත ගැන බෞද්ධ නිර්වචනයේදී
  වාසෙට්ඨ ඛත්තියො.....
  බාහිත පාපධම්මා ති ඛො වාසෙට්ඨ බ්‍රාහ්මණො.....
  විස්සුත විස්සුත කම්මන්තෙ පයොජෙන්තීති ඛො වාසෙට්ඨ වෙස්සා.....
  ලුද්ද ඛුද්ද සමාචාරා සුද්දා.... ආදී යෙදුම්වලින් නිර්වචනය කිරීම.

- ජීව විද්‍යාත්මක සිද්ධාන්ත අනුව වාසෙට්ඨ සූත්‍රයෙහි
  යථා එතාසු ජාතිසු - ලිංගං ජාතිමයං පුථු
  එවං නත්ථි මනුස්සෙසු - ලිංගං ජාති මයංපුථු ආදිය ද

- නජච්චා වසලො හොති - නජච්චා හොති බ්‍රාහ්මණො
  කම්මුනා වසලොහොති - කම්මුනා හොති බ්‍රාහ්මණො
  ආදී වසල සූත්‍රයේ ගාථාවලින් ද
  වර්ණ ධර්ම හා ස්වධර්ම යන කරුණු ප්‍රතික්ෂේප කෙරෙන අයුරු විස්තර කොට තිබිය යුතු වේ.

(අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් කරුණු දැක්වීමට ලකුණු 03යි.
විග්‍රහයට ලකුණු 03 = 06යි.)

02.

(i) ගිජ්ජකූට, ඉසිගිලි, වේභාර, වේපුල්ල, පාණ්ඩව (ලකුණු 04යි.)

(ii) රජු, පුරෝහිතයා, ඇමතිවරු, සෙන්පතිවරයා (ලකුණු 04යි.)

(iii) අගනුවර රජගහනුවරයි. බිම්බිසාර රජුගෙන් පසු ඔහු පුත් අජාසත්ත රාජ්‍යත්වයට පත් විය. ඉතා විශාල භූමි ප්‍රමාණයකින් යුක්ත මගධය කෝසල රාජ්‍යයට අග්නි දිගින් පිහිටියේය. උතුරින් ගංගා නම් ගඟින්ද නැගෙනහිරින් චම්පා නදියෙන් හා වින්ධ්‍යා කඳු වැටියෙන් ද බටහිරින් සෝණ නදියෙන් සීමා විය. සොළොස් මහා ජනපද අතර ප්‍රධාන රාජ්‍යක් වන මෙහි රාජාණ්ඩු පාලනය පැවතියේය.

ගිජ්ජකූට, ඉසිගිලි, වේභාර, වේපුල්ල හා පාණ්ඩව යන පඤ්ච මහා පර්වතවලින් ස්වභාවිකවම ආරක්ෂාව සැලසී තිබිණි.

මේ කරුණු ඇතුළත්ව පිළිතුර සකස් වී තිබිය යුතු වේ. (ලකුණු 06යි.)

දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව යන කරුණු ඇතුළත්ව පිළිතුර සකස් වී තිබිය යුතුවේ.

(ලකුණු 06යි.)

3.

) පරිබ්‍රාජක, අචේලක, ආජීවක, නිගණ්ඨ ආදී කණ්ඩායම් අතරින් කෙනෙකි. (ලකුණු 04යි.)

) පූර්ණකාශ්‍යප ශාස්තෘ, මක්ඛලීගෝසාල, අජිතකේසකම්බලී, පකුධකච්චායන, සංජයබෙල්ලට්ඨිපුත්ත, නිගණ්ඨනාතපුත්ත යන ශාස්තෘවරුන් අතරින් සිවු දෙනෙකි.

(ලකුණු 04යි.)

l) පරලොවක් ඇත්දැයි මගෙන් ඇසුවහොත් පරලොවක් ඇතැයි මට සිතුණොත් පරලොවක් ඇතැයි මම කියමි. එසේත් එබඳුම අදහසක් මට නැත. පරලොවක් ඇතැයි යන අදහසද නැත. පරලොවක් නැතැයි යන අදහසද නැත. මෙලොවින් චුතව පරලොව උපදින සත්ත්වයෙක් ඇත්ද කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාකයෝ ඇත්ද? තථාගත තෙමේ මරණින් මතු වන්නේද යනාදී ප්‍රශ්නවලට ද ඉහත සඳහන් අයුරින්ම පිළිතුරු ලබාදෙන මොහුගේ ඉගැන්වීම අමරාවික්ඛේප වාදයයි. (ලකුණු 06යි.)

මධ්‍යමප්‍රතිපදාව ත්‍රි ශික්ෂාවට අනුව සම්පූර්ණ කිරීම නිවනට මග වේ.

- සම්මා දිට්ඨි
- සම්මා සංකප්ප
  - ප්‍රඥා ශික්ෂාව
- සම්මා වාචා
- සම්මා කම්මන්ත
- සම්මා ආජීව
  - සීල ශික්ෂාව
- සම්මා වායාම
- සම්මා සති
- සම්මා සමාධි
  - සමාධි ශික්ෂාව

අනුපූර්ව ප්‍රතිපදාවක් ලෙස වැඩිය හැකි අයුරු විස්තර කොට තිබිය යුතු වේ.

(ලකුණු 06යි.)

## II – කොටස

04.

(i) ශුද්ධෝදන, ශුක්ලෝදන, ධෝතෝදන, අමිතෝදන, මිතෝදන, අමිතා හා ප්‍රමිතා යන අය අතරින් සතර දෙනෙකි. *(ලකුණු 04යි.)*

(ii) දේවදහ නුවර, අංජන රජු

දණ්ඩපාණි, සුප්පබුද්ධ *(ලකුණු 04යි.)*

(iii) සොළොස්මහා ජනපද අතරින් ප්‍රබල රාජ්‍යයක් වූ හිමාලය කඳුවැටියෙන් දකුණු පස පිහිටි කෝසල රාජ්‍යයට අයත් ශාක්‍යජනපදයේ අගනුවර වූයේ කපිලවස්තුපුර හෙවත් කිඹුල්වත් නුවරයි. කිඹුල්වත් නුවර ශාක්‍යයන් විසින් පාලනය කරන ලදී.

ශාක්‍යයන්ගේ ආදි පුරුෂයා සූර්ය වංශයට අයත් ඔක්කාක නම් රජුය. ඔහු මහාසම්මත රජ පරපුරේ පසුකාලීනයෙකු වූ අතර ඔක්කාක පරපුරේ තුන්වැන්නාය. පුතුන් සතර දෙනෙකුද දියණිවරුන් පස්දෙනෙකුද ලැබූ ඔක්කාක රජුගේ ප්‍රධාන බිසව කලකට පසු මිය ගියාය. ඇයගේ පුතුණුවරුන් වනගතව ජීවත් වී කපිල නම් තාපසවරයා මුණගැසී ඔහුගේ අනුශාසනා ඇතිව ඉදිකළ නගරය කපිලවස්තු නම් විය. ඔවුන්ට විවාහ වීමට ක්ෂත්‍රිය කාන්තාවන් නොවූ බැවින් වැඩිමහල් සොහොයුරිය මව් තනතුරෙහි තබා සෙසු සහෝදරියන් සතර දෙනා සමග විවාහ ගිවිස දරුවන් ලබාගෙන සතුටින් ජීවත් වූහ.

මහලු වයසට පත් ඔක්කාක රජු තම වැඩිමහල් දරුවන් කොහි වෙසෙත්දැයි සොයන්නේ වනයෙහි කපිලවස්තු නම් නගරයක් ඉදිකොට ප්‍රදේශය සමෘද්ධ කරමින් ජීවත් වෙත් යැයි අසා ඔවුහු දක්ෂයෝය. භාග්‍යවන්තයෝය. යැයි සතුටු විය. කුමාරවරුන්ගේ දක්ෂභාවය හා ශක්තිමත් භාවය නිසා ඔවුන්ට ශාක්‍යයෝ යැයි රජු නම් තැබූ බවත් ඔවුන්ගෙන් ශාක්‍ය රාජ පරපුර ආරම්භ වූ බවත් කියවේ. *(ලකුණු 06යි.)*

iv) අභිනිෂ්ක්‍රමණය කිරීමෙන් පසු බෝසතාණන් වහන්සේ ගුරුවරුන් කිහිපදෙනෙකු ඇසුරු කළහ.

භග්ගව, ආළාරකාලාමතාපසතුමා, උද්දකරාමපුත්ත තාපසතුමා යන ගුරුවරුන් වෙතින් ධර්මය හදාරා ඔවුන් දත් සියල්ල දැන ඔවුන්ගෙන් ද වෙන් වී තුදකලාව තනියම කිංකුසලගවේසීව සත්‍ය සෙවූහ. මෙහිදී මධ්‍යමප්‍රතිපදාව අනුගමනය කොට නිවන් අවබෝධ කළහ.

ගුරුවරුන් ඇසුරු කළ ආකාරය විස්තර කොට තිබීම ප්‍රමාණවත් වේ.

*(ලකුණු 06යි.)*

05.

(i) මහල්ලෙකු දැකීම

ලෙඩෙකු දැකීම

මළ මිනිසා දැකීම

පැවිද්දෙකු දැකීම

නළඟනන්ගේ විප්‍රකාර දැකීම

*(එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 04යි)*

(ii) නිබ්බුතා නූන සා මාතා    නිබ්බුතා නූන සෝ පිතා

නිබ්බුතා නූන සා නාරී    යස්සායං ඊදිසො පති

මෙවැනි පැහැපත්තකුගේ මව විශාන්තයෙන් නිවුණු හැඟැත්තියකි. පියාද එසේම නිවුණු හැඟැත්තෙකි. මෙබන්දකු ස්වාමියා කරගත් බිරියද විශාන්තයෙන් නිවුණු හැඟැත්තියක වන්නීය.

*(පාඨයට ලකුණු 02යි. අදහසට ලකුණු 02යි.)*

(iii) මහාභිනිෂ්ක්‍රමණය යනු බෝසතාණන් වහන්සේ බුද්ධත්වය පතා ගිහිගෙය අතහැර පැවිදි බවට පත්වීමයි. ඇසළ පෝය දින එදිනම උපන් රාහුල පුත් කුමරු බලා ඡන්න ඇමති සමග කන්ථක අශු පිට නැගී මාලිගයෙන් බුදු බව පතා සිදුහත් කුමරු පිටත්වීම.

*(මහාභිනිෂ්ක්‍රමණය හඳුන්වීමට ලකුණු 03යි.*
*මහාභිනිෂ්ක්‍රමණය විස්තර කිරීමට ලකුණු 03යි.)*

(iv)
i. ගිහිගෙය අතහැර අනෝමා ගංතෙර දී කසාවත් හැඳ පැවිදි වීම.
ii. සම්බුද්ධත්වය සාක්ෂාත් කිරීමේ පරමාර්ථයෙන් ගුරුවරුන් වෙත යෑම.
iii. කිංකුසලගවේෂීව යමින් නේරංජනා නදී තීරයේදී උග්‍ර තපස්දම් පිරීම.
iv. යටි දතෙහි උඩු දත තබා දිවෙන් තලු මැඩගෙන කුසල් සිතින් අකුසල් සිත තලාපෙලා තවන්නට වීම.
v. ආශ්වාසය මැඩගෙන ධ්‍යානයට සමවදිමින් මුඛයෙන්ද නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස යටපත් කිරීම, දෙකන් සිදුරෙන් වාතය පිට කිරීම.
vi. අප්‍රාණක ධ්‍යානය වඩන්නට වීම.
vii. පිණ්ඩපාතයෙන් පමණක් යැපීම. ඉන් ඵලක් නැතැයි සලකා ඉන් බැහැර වී අනතුරුව තමා වෙතට වැටුණු ඵල පමණක් (පවත්තඵලභෝජී) ව කටයුතු කිරීම. පසුව එයද සීමා කිරීම. පසුව ආහාර ගැනීමෙන් සම්පූර්ණයෙන්ම වැළකීම.

viii. ලෙඩ දුක් පීඩාවලින් හෝ අනුකම්පා රහිත ධනය වැයීමෙන් හෝ එළුන් පැමිණව අවශෙෂ කොට දුෂ්කරක්‍රියා අත්හැරීම, දැඩි ආත්මවාදී බව අතහැර මධ්‍යස්ථ භාවයට පත්වීම.

ix. මජ්ඣිමපටිපදාව ඔස්සේ සිත වැඩීම

x. චතුරංග සමන්නාගත වීර්යයෙන් කටයුතු කිරීම

xi. ආනාපාන සතිය ඔස්සේ සිත එකඟ ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය ආදී ධ්‍යාන ලැබ අනතුරුව පුබ්බේනිවාසානුස්සති, ආසවක්ඛය ආදී ඥාන ලැබ සිත් ආශ්‍රවක්ෂය කිරීම ආදී කරුණු ඔස්සේ පිළිතුර සකස් විය යුතුවේ.

(යමක් ලියා ඇත්නම් ලකුණු හයයි)

08.

(i) විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති (ලකුණු 04යි.)

(ii) i. ශාක්‍යයන්ගේ මානය බිඳීම සඳහා යමක මහා ප්‍රාතිහාර්ය පෑම.

ii. පාවානුවරින් පැමිණි මල්ල රජදරුවන්ගේ දරුවන් වූ භද්දිය, සුබාහු, වල්ලිය, උත්තිය යන කුමාරවරු පැවිදි වීම.

iii. විසි දහසකට අධික භික්ෂූන් පිරිවරා කිඹුල්වත්පුර පිඬු සිඟා වැඩම කිරීම

iv. සුද්දොදුන් රජුට දහම් දෙසා සකදාගාමී වීම.

v. ප්‍රජාපතීගෝතමිය සෝවාන් වීම.

vi. යශෝධරාවගේ මාළිගයට වැඩම කොට චන්දකින්නර ජාතකයෙන් දහම් දෙසීම හා ඇයට පැවිදි වීමේ අදහස පහළ වීම.

vii. නන්ද කුමරුගේ රාජාභිෂේකය, ගෘහප්‍රවේශ මංගල්‍යය, විවාහ මංගල්‍යය යන උත්සව සංවිධානය වී තිබීම, ඒ අතර නන්ද කුමරු පැවිදි කිරීම.

viii. කිඹුල්වත්පුර ගමනෙහි 7 වැනි දින දායාද ඉල්ලා පැමිණි රාහුල කුමරු පැවිදි කිරීම.

ix. සුද්දොදුන් රජුට මහා ධර්මපාල ජාතකයෙන් දහම් දෙසීම ආදී කරුණු අතරින් හතරයි.

(ලකුණු 04යි.)

(iii) (චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං මා එකෙන ද්වෙ අගමිත්ථ.) දෙසෙථ භික්ඛවෙ ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ.

මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, සුව පිණිස ගම් නියම් ගම්හි හැසිරෙව්. දෙදෙනෙක් එක්මග නොයව්. මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත ධර්මය දේශනා කරව්. හුදෙක් පිරිපුන් බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරව් යනු යි.

*අවවාදයට ලකුණු 03යි.*
*අදහසට ලකුණු 03යි.*

(iv) i. පළමු රහතන් සැට නම අමතා සිදු කළ දේශනය

ii. භද්‍රවර්ගීය කුමාරවරුන්ගේ ප්‍රව්‍රජ්‍යාව

iii. තුන් බෑ ජටිලයන් දමනය කිරීම

ඒහි භික්ෂු මහණ උපසම්පදාවෙන් පැවිදි කිරීම.

iv. කෝලිත උපතිස්ස දෙදෙනාගේ පැවිද්ද

v. බුදුරදුන් මගධාධිපති බිම්බිසාර රජු හමුවීම හා දහම් දෙසීම.

vi. කිඹුල්වත්පුර චාරිකාව, පිය රජුට දහම් දෙසීම.

vii. ආනන්ද ආදී ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද

viii. සුදත්ත සිටුතුමාගේ ජේතවනාරාම පූජාව ආදී කරුණු ඇසුරෙන් පිළිතුර සකස් වී තිබිය යුතුවේ.

*ධර්ම ප්‍රචාරය සඳහා විස්තරයට ලකුණු 03යි*
*සුදුසු නිදර්ශනවලට ලකුණු 03යි*

## III – කොටස

07.

(i) නාලන්දා, පාටලී, ගෝතමද්වාරය, ගෝතමතීර්ථ, කෝටිග්‍රාම, නාදිකග්‍රාම, වේළුවග්‍රාම, වෙසාලිපුර, උරුවෙල නියම්ගම, චාපාලචේතිය, හත්ථිග්‍රාමය, භණ්ඩග්‍රාමය, කුසිනාරා, ආදියෙන් හතරකි. **(ලකුණු 04යි.)**

(ii) i. මහණෙනි, භාග්‍යවතුන් වහන්සේ වෙතින් මෙය අසන ලදැයි කී පමණින් නොපිළිගෙන තථාගතයන් දෙසූ ධර්මය හා විනය දෙකට ගැලපේ දැයි විමසා බලා ගැලපේ නම් පමණක් භාර ගැනීම.

ii. අසවල් විහාරස්ථානයේ ප්‍රධාන ස්ථවිරයන් සහිත මහාසංඝයාගෙන් මෙය අසන ලදැයි කී පමණින් නොගෙන, තථාගත ධර්මය හා විනය සමග සසඳා බලා ගැලපේ නම් පමණක් පිළිගැනීම.

iii. අසවල් විහාරස්ථානයේ බොහෝ පණ්ඩිත තෙරවරුන් වෙසි. උන්වහන්සේලා වෙතින් මෙය ශාස්තෘ ශාසනය යැයි කියා අසන ලදැයි කී පමණින් නොපිළිගෙන ධර්මය හා විනය දෙස හා ගැලපේ දැයි විමසා බලා ගැලපෙනොත් පමණක් පිළිගැනීම.

iv. අසවල් විහාරස්ථානයේ ධර්මය දන්නාවූ එක් පණ්ඩිත ස්ථවිර නමක් වෙයි. උන්වහන්සේ වෙතින් මෙය ඇසීමි යැයි කී පමණින් නොපිළිගෙන ධර්මය හා විනය සමග සසඳා බලා ගැලපේ නම් පමණක් පිළිගැනීම යනුයි.

*(එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු 04යි.)*

(iii) හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ.

මහණෙනි, ඔබ අමතමි. හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළුවෙති. එබැවින් අප්‍රමාදීව කුසල් දහම් සම්පාදනය කරන්න. *(ලකුණු 06යි.)*

*බුද්ධ වචනයට ලකුණු 03යි. අදහසට ලකුණු 03යි.*

(iv) * සිය අරමුණු, අභිමතාර්ථ සාධනය කර ගැනීමෙහිලා උත්සාහය, උනන්දුව, වීර්යය ඇතිව අනලස්ව කටයුතු කළයුතු බව මෙයින් කියැවේ.

* කල් නොයවා අනලස්ව කටයුතු කිරීම තුළ සාර්ථකත්වය ඇතිවේ.
ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු ආදී ඉගැන්වීම් තුළින්ද යමින සාර්ථකභාවය සඳහා උත්සාහය වැඩිය යුතු ආකාරය ඉගැන්වේ.

එබඳු කරුණු ඇතුළත්ව පිළිතුර සකස් වී තිබිය යුතුය.

*(සම්පූර්ණ පිළිතුරට ලකුණු 06යි)*

08.

(i) i. තාදී ගුණය ii. අසරණයන්ට පිහිට වීම

iii. ගිලනුන්ට උපස්ථාන කිරීම iv. ශික්ෂාකාමී ගුණ පුද්ගලයන් බිහිකිරීම

v. ඉවසීමේ ගුණය vi. අනුකම්පාවෙනුව සවන් දීමේ ගුණය ආදිය අතරින් සතරකි.

(ලකුණු 04යි.)

(ii) ලාභ - අලාභ, යස - අයස, නින්දා - ප්‍රශංසා, සැප - දුක යන කරුණු අතරින් සතරකි.

(ලකුණු 04යි.)

(iii) සූචිලෝම, ඛරලෝම යන යක්ෂයන් දමනය කිරීම.

සච්චක දමනය, සභිය පරිබ්‍රාජක දමනය, ආලවක දමනය, අංගුලිමාල, නාලාගිරි දමනය ආදිය අතරින් කරුණු දෙකක් ඔස්සේ පිළිතුර සැපයිය යුතු වේ. (ලකුණු 06යි.)

(එක් අවස්ථාවකට ලකුණු 03 බැගින්)

(iv) i. දෙව්දත් තෙරුන් විසින් නොයෙක් පීඩා ඇති කිරීම.

ii. සුප්පබුද්ධ නම් ශාක්‍යයා නොයෙක් දෝෂාරෝපණය කිරීම.

iii. සුදත්ත සිටුවරයා ජේතවනාරාමය ඉදි කොට පූජා කිරීම, විශාඛාව විසින් පූර්වාරාමය, ඝෝෂිතාරාමය, කුක්කුටාරාමය ආදී ආරාම ලැබීම හා ඒවායෙහි අධික සතුටක් හෝ දුකක් ඇති නොකර ගැනීම.

iv. විශාඛාව විසින් මේල පළඳනාව පූජා කිරීම, සිවක, දෝණ, උදේන ආදීන් වටිනා සළු පිළි පූජා කිරීම, ඒවායෙන් අධික සතුටක් හෝ දුකක් ඇති නොකර ගැනීම.

v. මාගන්දියා, අක්කෝසක භාරද්වාජ, සුප්පබුද්ධ ආදීන් විසින් සිදු කරනු ලැබූ නින්දා අපහාස ඉවසීම.

ආදී උදාහරණ ඇසුරින් පිළිතුර සැපයිය යුතු වේ. (ලකුණු 06යි.)

තාදී ගුණය හැඳින්වීමට ලකුණු 03යි. වර්තමානයට ආදේශයට ලකුණු 03යි.

09.

(i) අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් චිරරාත්‍රඥ භික්ෂූන් අතර අග්‍රතනතුර, රාහුල තෙරුන් ශික්ෂාකාමී භික්ෂූන් අතර අග්‍රතනතුර මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග්‍රතනතුර, භද්දකාපිලානී තෙරණිය මහා අභිඥාලාභී භික්ෂුණීන් අතර අග්‍රතනතුර

(ලකුණු 04යි.)

(ii) ප්‍රතික්ෂේප හතර

i. බුදුරජාණන් වහන්සේට ලැබෙන චීවර සිවුරු ආනන්ද තෙරුන්ට නොදිය යුතුය.

ii. බුදුරජාණන් වහන්සේට ලැබෙන ප්‍රණීත ආහාර පාන ආනන්ද තෙරුන්ට නොදිය යුතුය.

iii. බුදුරජාණන් වහන්සේ වැඩවසන ගන්ධකුටියෙහි විසීමට ආනන්ද තෙරුන්ට ඉඩ නොදිය යුතුය.

iv. බුදුරජාණන් වහන්සේට දන් පිණිස ලැබෙන ආරාධනාවලට ආනන්ද තෙරුන්ට සමග නොවැඩිය යුතුය.

හෝ

වර හතර

i. ආනන්ද තෙරුන් විසින් පිළිගන්නා ආරාධනාවලට බුදුරදුන් වැඩම කළ යුතුය.

ii. නොයෙක් ප්‍රදේශවල සිට බුදුරදුන් බැහැ දැකීම සඳහා පැමිණෙන පිරිස් බුදුරදුන් වෙත කැඳවාගෙන ඒමට අවසර තිබිය යුතුය.

iii. යම් සැකයක් පැන නැගී කල්හි එය විමසා දැන ගැනීමට බුදුරදුන් වෙත පැමිණීමට අවසර තිබිය යුතුය.

iv. ආනන්ද තෙරුන් නොමැති තැන දෙසූ ධර්මය ආනන්ද තෙරුන්ට නැවත දේශනා කිරීම යනුයි.

(ලකුණු 04යි.)

(iii) රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් ඉස්මතුවන ආදර්ශ ලෙස

* අවවාදයෙහි උරණ නොවීම හා අවවාද දුන් තැනැත්තා කෙරෙහි ගෞරවයෙන් කටයුතු කිරීම.

* ගුරුවර, වැඩිහිටි අවවාද නොඉවසීම පරිහානියට හේතුවක් බව තේරුම් ගැනීම.

* උඩඟු බව, නොහික්මුණු බව නිසා අවවාදයෙහි එසා ප්‍රතිචාර දක්වන අතර අවනත බව, කීකරු බව ශිෂ්‍යයකු තුළ වර්ධනය විය යුතු බව.

මෙබඳු කරුණු ඇසුරින් පිළිතුර සකස් විය යුතුවේ. *(ලකුණු 06යි.)*

***(චරිතය දැක්වීමට ලකුණු 03යි. වර්තමානයට ආදේශයට ලකුණු 03යි.)***

iv) * i. සිය ස්වාමියාට ආදරයෙන්, කරුණාවෙන් හා මෛත්‍රියෙන් සැලකීම හා කටයුතු කිරීම.

ii. වසර 13ක් ගත ජීවිතයේ සිය සැමියාගේ සිත් දිනාගෙන කටයුතු කිරීම.

iii. ඇය සිදුහත් රජුගේ වෙන්ව යෑම ගැන අතිශය දුක් වීම.

iv. යස ඉසුරින් පිරි නොයෙක් රාජකුමාරවරුන් විසින් ඇය වෙත දෙවැනි විවාහයක් සඳහා යෝජනා ගෙන ආවත් ඒ සියල්ල ප්‍රතික්ෂේප කිරීම.

v. සිදුහත් තවුසාණන් කහවත් හැඳිනු අසා ඇය ද කහවත් දැරීම.

vi. කිඹුල්වත් පුර චාරිකාවේදී සිය මාළිගයට වැඩම කළ බුදුරදුන්ගේ දෙපා අල්ලාගෙන හඬා වැලපීම.

**ආදී කරුණුවලින් ස්වාමි භක්තිය, ස්වාමියාට ඇති ආදරය ප්‍රකාශ වේ. මෙබඳු කරුණු ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.** *(ලකුණු 06යි.)*

***(චරිතය දැක්වීමට ලකුණු 03යි. වර්තමානයට ආදේශයට ලකුණු 03යි.)***

**උපාසකවරු**

i. **තපස්සු භල්ලුක** - බුදුන් දහම් සරණ ගිය ප්‍රථම ද්වේවාචික උපාසක

ii. **සුදත්ත හෙවත් අනේපිඬු** සිටු අග්‍රදායක

iii. **චිත්ත ගෘහපති** ධර්ම කථිකයන් අතර අග්‍රතනතුර

iv. හත්ථාලවක රජ සතර සංග්‍රහ වස්තුවෙන් රටවැසියාට සංග්‍රහ කළවුන් අතර අග්‍රතනතුර

v. මහානාම ශාක්‍ය ප්‍රණීත දායක

vi. උග්ග ගෘහපති මනාප දෑ දෙන්නවුන් අතර අගතනතුරු

vii. සූරම්බට්ඨ අචල ශ්‍රද්ධා ඇත්තවුන් අතර අගතනතුරු

viii. ජීවක කෝමාරභච්ච පුද්ගලප්‍රසාද ඇත්තන් අතර අගතනතුරු

ix. උග්ගත ගෘහපති සංඝෝපස්ථායකයන් අතර අගතනතුරු

x. නකුලපිතු විශ්වාස කථා ඇත්තන් අතර අගතනතුරු

උපාසිකාවෝ

i. සුජාතා බුදුන් සරණගිය ප්‍රථම උපාසිකාව

ii. විශාඛා අග්‍ර දායිකා

iii. ඛුජ්ජුත්තරා බහුශ්‍රැත දැ දෙසන්නියන් අතර අගතනතුරු

iv. උත්තරා ධ්‍යායීන් අතර අගතනතුරු

v. සුප්පවාසා, ප්‍රණීතදායිකාවන් අතර අගතනතුරු

vi. කාතියානී නොසෙල්වන පැහැදීම ඇතියන් අතර අගතනතුරු

vii. නකුලමාතා විශ්වාස කථා ඇතියන් අතර අගතනතුරු

viii. සාමාවතී මෛත්‍රී විහාර ඇතියන් අතර

ix. කාලී ආරංචියෙන් බුදුගුණ අසා පැහැදුණු අය අතර

x. සුප්පියා ගිලානෝපස්ථායිකාවන් අතර අගතනතුරු

**මේ අය අතරින් සිවු දෙනෙකි.** *(ලකුණු .*

*(නම් කිරීමට ලකුණු 02යි)*

1. පුක්කුසාති නම් මල්ල රජුට බුදුන් ලොව පහළවූ බවත් උන්වහන්සේ ධර්මයේ ගුණත් රන් පතක ලියා යැවීම.
2. සෝවීර දේශයේ රෝරුව නගරයේ තිස්ස රජුට පටිච්චසමුප්පාද ධර්මය රන්පතක ලියා යැවීම.
3. එසේම වස්ත්‍රයක බුද්ධ චරිතය සිතුවම් කොට යැවීම.

*(ලකුණු 04යි.)*

*එක් කරුණකට ලකුණු 02 බැගින්*

i) i. බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීම.

ii. සර්වඥතා යාගය සිදු කිරීමට මිනුමෙහි විසින් කොතොල් රජුට ලබාදුන් උපදෙස් වලක්ද පිළිපැදීමට ඉඩ නොදෙමි.

iii. සර්වඥතා යාගය වෙනුවට මහා දානයක් දීමට උපදෙස් ලබාදීම හා එය සංවිධානය කිරීම.

iv. මල් නෙලීමට උයනට යන අතරතුර මගදී පිඬු පිණිස වඩින සඳ බුදුරදුන්ට හා ආනන්ද තෙරුන්ට තමාට අනුභව කිරීමට තිබූ පුංසාල්වලින් සෑදූ පිඬු පූජා කිරීම.

v. මහජනතාව සමග පරගයට දන්දීමට යාමේදී අසදෘශ මහා දානය ලබාදීමට උපදෙස් දීම හා එය සංවිධානය කිරීම ආදී කරුණු ඇසුරිනි. *(ලකුණු 06යි.)*

*(චරිතය දැක්වීමට ලකුණු 03යි. වර්තමානයට ආදේශයට ලකුණු 03යි.)*

) i. සිය රට තුළ තෙරුවන් කෙරෙහි හිමි ආරක්ෂාව සලසා දීම.

ii. විහාරස්ථාන ආරක්ෂා කිරීම, පවත්වාගෙන යෑම, ආධාර අනුබල දීම.

iii. ශාසනයේ භික්ෂු පිරිස අඩුවන අවස්ථාවල පැවිද්දට අදාළ අනුබල රටවැසියාට ලබාදීම.

iv. මිථ්‍යා දෘෂ්ටික බලවේගවල ක්‍රියාත්මක වීමට ඉඩකඩ ආවරණය කිරීම.

v. ධර්මය ප්‍රචාරය කිරීමේ මාධ්‍ය පුළුල් කිරීම.

vi. දුර්මත දරන හා ශාසන විරෝධී පිරිස සමූහයන් බැහැර කිරීමට භික්ෂූන් වහන්සේලාගේ නායකත්වයෙන් ක්‍රියා කිරීම.

vii. භික්ෂු කතිකාවත්, සංඝ සම්මුති ආදිය ක්‍රියාවට නැංවීමට හිමිකම අවකාශ සලසා දීම. *(ලකුණු 06යි.)*

ආදී කරුණු ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුවේ.

## 2562 – දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය – 2018 (2019)

### (01) බුද්ධ චරිතය

### ලකුණු දීමේ පටිපාටිය හා ආදර්ශ පිළිතුරු.

ලකුණු බෙදී යාම.

01 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු 06 යි.

**ලකුණු 20 යි.**

02 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු 06 යි.

**ලකුණු 20 යි.**

03 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු 06 යි.

**ලකුණු 20 යි.**

04 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු 06 යි.

**ලකුණු 20 යි.**

05 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු 06 යි.

**ලකුණු 20 යි.**

06 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු 06 යි.

**ලකුණු 20 යි.**

07 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු 06 යි.

**ලකුණු 20 යි.**

08 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු <u>06 යි.</u>

**ලකුණු <u>20 යි.</u>**

09 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු <u>06 යි.</u>

**ලකුණු <u>20 යි.</u>**

10 වන ප්‍රශ්නය

(i) ලකුණු 04 යි.

(ii) ලකුණු 04 යි.

(iii) ලකුණු 06 යි.

(iv) ලකුණු <u>06 යි.</u>

**ලකුණු <u>20 යි.</u>**

## I කොටස

01.

I. මහාබ්‍රහ්මගේ මුඛයෙන් බමුණෝ උපන්හ.
දෙබාහුවලින් ක්ෂත්‍රියයෝ උපන්හ.
දෙකලවාවලින් වෛශ්‍යයෝ උපන්හ.
දෙපතුල්වලින් ශුද්‍රයෝ උපන්හ.

(ලකුණු 04 )

II. බ්‍රහ්මචාරී අවධිය, ගෘහස්ථ අවධිය, වානප්‍රස්ත අවධිය, සන්‍යාසී අවධිය.

(ලකුණු 04 )

III. ප්‍රජාපාලනය, දන්දීම, යාග කිරීම, කාමයෙහි නොඇලීම, ඉගෙනීම.

(ලකුණු 0( 0

IV. බ්‍රහ්මචාරී අවධිය - ළමා කාලය ඉගෙනීම සඳහා වෙන්කළ යුතුය. උපතේ සිට ව ද අවුරුදු 16 තෙක්

ගෘහස්ථ අවධිය - වයස අවුරුදු 16 දී විවාහ දිවියට එළඹිය යුතුය. එහිදී දූ දර ): හදාවඩා ඉගැන්විය යුතුය.

වානප්‍රස්ථ අවධිය - සිය දරුවන්ට වයස අවුරුදු 16 වනවිට මව්-පියවරු වැ ව පිවිසිය යුතුය. ආගමික ජීවිතයට එළඹීම.

සන්‍යාසී අවධිය - දරුවන් වානප්‍රස්ථ අවස්ථාවට පත්වන විට දෙමාපියන් සන ): ජීවිතයට එළඹිය යුතුය. වනයට පිවිසි ඔවුනු න ද ආපසු ගෘහවාසයට නොපැමිණියහ. වනයෙහිම ජීවිතය අත් ද

(ලකුණු 0 (

02.

I.

- මහාබ්‍රහ්ම විසින් කාන්තාව මවන ලද්දේ පිරිමින්ගේ විනෝදය සඳහා යැයි සැලකීම.
- ආගම ඇදහීමට හෝ එයට අදාළ වත්පිළිවෙත් කිරීමට නිදහස නොලැබීම.
- තමාගේ කැමැත්ත පරිදි රැකියාවක නිරත වීමේ අයිතිය ද නොලැබීම.
- මියගිය පියා වෙනුවෙන් දියයුතු පිතෘ යාගය කළ හැක්කේ පුතෙකුට පමණක් වීම.
- බාලකල පියා යටතේ ද විවාහ වූ පසු ස්වාමියා යටතේ ද ස්වාමියා මළ පසු සිය පුතා යට ට ජීවත් විය යුතුය.
- ස්වාමියා මළ පසු දරසෑයට පැන දිවිහානි කර ගැනීම (සති පූජාව) ආදිය යි.

(ලකුණු ( (

II.

1. භික්ෂුණී ශාසනය ආරම්භ කරමින් කාන්තා පැවිද්ද ලබා දීම.
2. නිවසෙහි ස්වාමියාට සමානව කාන්තාවට ගෘහනියක ලෙස යුතුකම් [illegible] සමානව දක්වා තිබීම.
3. මවක, බිරිඳක, දියණියක, උපාසිකාවක, ලෙස කාන්තාවගේ ස්ථානය ආරක්ෂා කිරීම.
4. පිරිමියා පමණක් නොව කාන්තාව ද ඒ ඒ තැන විචක්ෂණව පණ්ඩිතව ක්‍රියාකරන [illegible] පවසා අධ්‍යාපන අවස්ථා සලසා දීම.
5. හැකියාව අනුව ඒ ඒ තනතුරු ලබාදෙමින් ඇගයීමට ලක් කිරීම විනයධර, මහා ප්‍රඥාලාභීන් අතර, චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග්‍රතනතුරු ලබා දීම ආදිය.

(ලකුණු 04 යි.)

III.

- කුඩාකල දෙමාපියන් විසින් හැර දමන ලදැයි සැලකෙන අම්බපාලිය රූමත් තරුණියක වූ බැවින් නගරශෝභනියක ලෙස පත්කරනු ලැබීය. නගරශෝභනියක වූ ඇය පැවිදි වී රහත් බව ලැබුවාය.
- ස්වාමියා, දරුදෙදෙනා, දෙමාපියන් හා එකම සහෝදරයා එකම දිනක මරණයට පත්ව සිහිමුළා වූ පටාචාරාව භික්ෂුණී ශාසනයට ඇතුළත් වී නිවන් සුවය ලබා සැනසුනා ය.
- එකම දරු මළ සොවින් සිහි මුළාව තැන තැන ඇවිද්ද කිසාගෝතමිය භික්ෂුණී ශාසනයේ පැවිද්ද සැනසීම ලබා ගත්තාය.
- වංචාකාර සොරෙකුට රැවටී ජීවිතය විනාශ මුඛයට පත්වීමට ගිය කුණ්ඩලකේශී ස්ථානෝචිත ප්‍රඥාව තුළින් දිවි ගලවා ගෙන ශාසනයට ඇතුළත්ව පැවිදිව සැනසුනාය.

මේ ආදී චරිත දෙකක් ඇසුරෙන් පිළිතුර ලියා තිබිය යුතුය.

(ලකුණු 06 යි.)

IV.

- ශ්‍රී ලංකාව බෞද්ධ ශිෂ්ටාචාරය තුළ හැඩගැසුණු රටකි.
- බෞද්ධ සමාජයෙහි සිව්වනක් පිරිස අතර උපාසිකා යන්නෙන් කාන්තාව හඳුන්වනු ලැබීය.
- මවක, බිරිඳක, දියණියක, සහෝදරියක, උපාසිකාවක යන විවිධ ඥාති ස්තරයන්හි කාන්තාවගේ ස්වකීය අයිතිය ඇගයීමට ලක් කිරීම.
- මානව අයිතිය, යුතුකම, වගකීම, හැකියාව, ආදී සියලු අංශ බුදුසමය විසින් ඇගයීමට ලක් කිරීම.
- ගෘහය තුළ හෝ වෙනත් ස්ථානයන්හි කාන්තාවකගේ එම අයිතිය අභියෝගයට ලක්කොට හිංසනයට පත් කරන්නේනම් එය සදාචාර විරෝධී, මානව විරෝධී අපයෝජනයක් ලෙස සාකච්ඡා කොට තිබිය යුතුය.

(ලකුණු 06යි.)

03.

I. ශ්වේතාම්බර නිගණ්ඨ - සුදුවස්ත්‍ර අඳින බැවිනි.

දිගම්බර නිගණ්ඨ - දිශා නමැති වස්ත්‍ර දරණ බැවින් නිර්වස්ත්‍ර නිගණ්ඨ එනමින් හැඳින්වේ.

(ලකු

II.

- සිරුරෙහි මඩ තවරා ගැනීම.
- දූවිලිවලින් සිරුර වසා ගැනීම.
- ආහාර නොගෙන සිටීම.
- රත් වූ ගල් තලාවල වැතිර සිටීම.
- ඇන තියාගෙන නිදා සිටීම.
- අජව්‍රත, ගෝව්‍රත, කුක්කුර ව්‍රත ආදිය

(ල

III.

- සියලු සිසිල් දිය පානය කිරීමෙන් වැළකුණේ වෙයි. (සබ්බවාරි වාරිතො)
- සියලු සංවරයෙන් යුක්ත වූයේ වෙයි. (සබ්බවාරි යුතො)
- සියලු වැළකිය යුතු පවින් වැළකුණේ වෙයි. (සබ්බවාරි ධුතො)
- සියලු පව්කම් විඳ නිමවූ විමුක්තියෙන් යුක්ත වූයේ වෙයි. (සබ්බවාරි ඵුටො)
- දුෂ්කර ව්‍රත රැකීමෙන් සියලු කර්ම ගෙවා අවසන් කොට කේවලත්වය සුවය ලැබීය.

IV. ශරීරයට අධික දුක්දීමේ අත්තකිලමථානුයෝගයත් ශරීරයට අ කාම සුඛල්ලිකානුයෝගයත් බුදුසමය බැහැර කරයි. මේ අන්ත දෙකෙන් බැහැ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළහ. බුදුසමයේ එම මධ්‍යම ප්‍රතිපදාව ආර්ය අ යැයි ද කියනු ලැබේ. අංග අටකින් යුක්ත ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාව මාර්ගය නිර්වාණාවබෝධයට මගයි.

## II කොටස

04.

I. සුද්ධෝදන රජුට දාව මහාමායා දේවියගේ කුස පිළිසිඳගෙන දසමස් ඇවෑමෙන් මහාමායා දේවිය පෙරහැරින් දෙමාපියන් බලන්නට යන අතරමග ලුම්බිණි සල් උයනේ දී සල් රුකක් මුල දී සිද්ධාර්ථ කුමරු වෙසක් මස පුරපසළොස්වක දා උපන්නේය.

කුමරුගේ උපතින් පස්වන දින ශාක්‍ය දේශයේ සුප්‍රසිද්ධ පඬිවරුන් වන රාම, ධජ, ලක්ෂ්මණ, මන්ත්‍රී, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම, සුදත්ත යන බමුණු පඬිවරුන් අටදෙනා නම් තැබීමේ උත්සවයට සහභාගී වූහ. ඔවුහු කුමරුගේ දේහ ලක්ෂණ බලා කුමරු ගිහිගෙයි හිටියොත් සක්විති රජවෙති. පැවිදි වුවහොත් බුදුවෙතැයි ප්‍රකාශ කළහ. තරුණ කොණ්ඩඤ්ඤ බමුණු පමණක් කුමරු ඒකාන්තයෙන්ම බුදුවෙතැයි කීවේය. කුමරුගෙන් ලොවට සිදුවන අර්ථය සලකා සිද්ධාර්ථ යැයි නම් තැබූහ.

එක් කන්නයක වී ඇස්වනු කපා පාගාගත් පසු ඊළඟ කන්නය සඳහා ගොවිතැන් කටයුතු ආරම්භ කරනු ලැබුයේ රජුගේ සහභාගීත්වය ඇතිව සිදුකරන වප්මගුල් උත්සවයකිනි. එය නැරඹීමට නගරයේ බොහෝ දෙනා සහභාගී වූහ. මව්වරු කිරිදරුවන් පවා රැගෙන උත්සවය බැලීමට ගියහ. සුදොවුන් රජු කිරිමව්වරුන්ගේ රැකවරණය ඇතිව සිදුහත් කුමරු ද උත්සව භූමියට රැගෙන ගියේය. උත්සවය පැවැත්වෙන අවස්ථාවේ රුක් සෙවනක වටතිර ඇද යහනක හොවා සිටි කුමරු සියල්ලන් උත්සවය නරඹද්දී භාවනායෝගීව සිටිනු දැක කිරිමව්වරු විශ්මයට පත්වූහ. එයින් සතුටටපත් පියරජු දෙවැනි වර සිය පුතුට වැන්දේය.

සිදුහත් කුමරු ශිල්ප කිසිවක් නොදන්නෙතැයි ශාක්‍යයන් හා කෝලියන් අතර රාවයක් පැතිරිණ. මේ නිසා තරුණ සිදුහත් කුමරුට සුප්‍රබුද්ධ රජුගේ දියණිය විවාහකර දෙන්නට අකමැති විය. මේ බව දැනගත් සිදුහත් කුමරු සිය ඥාතීන් ඉදිරියේ ශිල්ප දක්වන්නට ඉදිරිපත් වූයේය. කඩුශිල්ප, දුනුශිල්ප ප්‍රදර්ශනය කළ සිදුහත් කුමරු ඥාතීන් විශ්මයට පත් කළේය. අනතුරුව ඔවුහු සුප්‍රබුද්ධ රජුගේ දියණිය වූ යශෝධරාව නොහොත් භද්දකච්චානා කුමරිය විවාහ කර දුන්හ.

(ලකුණු 04යි.)

II. අවංක බව, සත්‍යගරුක බව, මෛත්‍රී සහගත බව, කරුණාව, අධිෂ්ඨානශීලී බව.
අප්‍රතිහත ධෛර්ය, වීර්යය,
අරමුණු ඉටුවන තෙක් සිය අධිෂ්ඨානය අත්නොහැරීම,
පාපයෙන් වැළකීම, නිවැරදි ජීවනයක් ගත කිරීම,
අන්‍යයන්ට සවන් දීම, ගුරු ඔවදන් පිළිපැදීම,
අභියෝගයට මුහුණ දීම, අභියෝග ජයගැනීම ආදී කරුණු ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුය.

(ලකුණු 04යි.)

III. මහල්ලෙකු දැකීමෙන් - ජීවිතය ජරාවට පත්වන බවත්

ලෙඩෙකු දැකීමෙන් - ජීවිතය ව්‍යාධිවලට ගොදුරුවන බවත්

මළ මිනියක් දැකීමෙන් - ජීවිතය මරණයට පත්වන බවත්

පැවිදිරුවක් දැකීමෙන් - ජාති - ජරා - ව්‍යාධි - මරණ යන ජීවිතයේ යථාර්ථය

අවබෝධ කොට සැනසීම වෙත ගමන් කරන සැනසීමේ මි

මින් අර්ථවත් කෙරේ.

(ලකුණු

IV.

- කිං කුසලගවේසීව ප්‍රව්‍රජ්‍යාවට පත්ව සත්‍ය සෙවීම.
- ආලාරකාලාම - උද්දකරාමපුත්ත තාපස්වරුන්, භග්ගව ආදී සමකාලීන ගුරුවරුන් වෙත ඔවුන්ගේ ඉගැන්වීම් අනුගමනය කිරීම.
- සය අවුරුද්දක් දුෂ්කරක්‍රියා කිරීම.
- පවත්තඵලභෝජී ජීවිතයක් ගත කිරීම.
- උග්‍ර තවුස් ව්‍රත අනුගමනය කිරීම.
- එක් තාපස් ව්‍රතයක් ලෙස යටි දතෙහි උඩුදත තබා දිවින් තලු මැඩගෙන කුසල් සිතින් සිත තළා පෙළා තවන්නට වෙර දැරීම.
- ආශ්වාසය මැඩගෙන ධ්‍යානයට සමවදිමින් මුඛයෙන් ද නාසයෙන් ද ආශ්වාස ප්‍රශ්වාස කිරීම. එවිට දෙකන් සිදුරුවලින් වාතය පිටවන්නට වීම. මෙසේ අධික ව්‍රත අනුගමනය කිරීම ඒ සියල්ල නිර්ථක බව දැන මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය නිවන් ලැබීම.

(ලකු

05.

I. තපස්සු - භල්ලුක

බුදුන් - දහම් සරණ යාම ඊට හේතුවයි.

(ල

II. කොණ්ඩඤ්ඤ - භද්දිය - වප්ප - මහානාම - අස්සජි තාපසවරු

ධම්මචක්කපවත්තන සූත්‍රය හා අනත්තලක්ඛණ සූත්‍ර දේශනාව

(ල

III. සංහුන් ඉඳුරන් ඇති, ප්‍රසන්න පෙනුමෙන් යුක්ත ඔබ කවරෙක් ද? හා [illegible] උපක බුදුරදුන්ගෙන් ප්‍රශ්න කළේය.

නමෙ ආචරියො අත්ථි - සදිසො මෙ නවිජ්ජති

සංදෙවකස්මිං ලෝකස්මිං - නත්ථි මෙ පටිපුග්ගලො

අහංහි අරහා ලොකෙ - අහං සත්ථා අනුත්තරෝ

එකොම්හි සම්මා සම්බුද්ධෝ - සීතිභූතොස්මි නිබ්බුතො

මට වෙනත් ගුරුවරයෙක් නැත. මම සියලු පාපයන් ජයගෙන සිටින හෙයින් අනන්තජින [illegible] වෙ. යනුයි.

(ලකුණු 06යි.)

IV.

| | |
|---|---|
| සම්මා දිට්ඨි<br>සම්මා සංකප්ප | පඤ්ඤා සික්ඛා |
| සම්මා වාචා<br>සම්මා කම්මන්ත<br>සම්මා ආජීව | සීල සික්ඛා |
| සම්මා වායාම<br>සම්මා සති<br>සම්මා සමාධි | සමාධි සික්ඛා |

- කාය වාචානං සමොදානං සීලං - කාය වාග් සංවරය ශීලයයි.
- එය අර්යමාර්ගයේ පදනමයි. ශීලයෙන් තොර සමාධියක් හෝ සමාධියෙන් තොර ප්‍රඥාවක් හෝ සාධනය නොවේ.

(ලකුණු 06යි.)

06.

I. උතුරින් ගංගා නම් ගඟින් ද නැගෙනහිරින් චම්පා නදියෙන් ද හා වින්ධ්‍යා කඳුවැටියෙන් ද බටහිරින් සෝණ නදියෙන්ද අග්නි දිගින් කෝසල රාජ්‍යය ද දේශසීමා විය.

(ලකුණු 04යි.)

II. වේළුවනාරාමය, බිම්බසාර රජු, මගධ දේශය, රජගහනුවර

(ලකුණු 04යි.)

III. හඬා වැළපුණු නිරුවත් ප්‍රේතයන් පෙර අත්භවයක ඥාති ප්‍රේතයන් සමූහයක් බවත් ඔවුන්
අවශ්‍ය වී ඇති බැවින් සිහිනෙන් පෙනී සිටි බවත් සඳහන් වේ.

රජු බුද්ධ ප්‍රමුඛ මහාසංඝයාට දන් පූජාකොට පින් අනුමෝදන් කළේය. එහෙත් පසු
නිර්වස්ත්‍ර ප්‍රේතයන් සිහිනෙන් දක්නට ලැබිණ.

රජු නැවත වස්ත්‍ර හා සේනාසන ද සහිතව බුද්ධ ප්‍රමුඛ සංඝරත්නයට දන්දී පින් අනු
කරවූයේය. බුදුන් වහන්සේ තිරෝකුඩ්ඩ සූත්‍රයෙන් දහම් දෙසූහ. ඥාති ප්‍රේතයන් දුගතියෙ
දිව සැපත් ලැබූහ.

(ලකුණු

IV. දානය යනු පරිත්‍යාගයයි.
ලෝභ - දෝස - මෝහ යනු අකුසල මූල බලවත් වීමෙන් දානයෙන් වළකයි. දන් දෑ
පරිත්‍යාග නොකරයි.
දන් දෙන්නා තුළ කුසල මූල් වර්ධනය වීමෙන් චිත්ත පාරිශුද්ධිය ඇති වේ.
අලෝභ, අදෝස, අමෝහ යනු කුසල මූලයි. ඒවා බලවත් වීමෙන් දන්දෙයි. කුසලමූල ව
දානය මහත්ඵල මහානිසංස ගෙන දෙයි.

(ල

## III කොටස

07.

I. බරණැස ඉසිපතනාරාමය, රජගහනුවර වේළුවනාරාමය, විශාලා මහනුවර කූටාගාර ශා
පර්වතයේ හා තව්තිසා දෙව්ලොව, භග්ග ප්‍රදේශයේ සුංසුමාරගිරිය අසල භේ
කොසඹෑ නුවර ඝෝෂිතාරාමය, පාරිලෙය්‍යවනය, ඒකනාලා බමුණුගම, වේරංජා
පර්වතය, සැවැත් නුවර ජේතවනාරාමය, කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමය, අලව්රට රජගෘ
පූර්වාරාමය ආදිය.

II. අනේපිඬු සිටුතුමා - ජේතවනාරාමය
ඝෝෂක සිටුතුමා - ඝෝෂිතාරාමය
කුක්කුට සිටුතුමා - කුක්කුටාරාමය
පාවාරික සිටුතුමා - පවාරික අඹවනය

III.

- සුදත්ත බුදුරදුන්ගෙන් දහම් අසා සෝවාන් ඵලයට පත් වූවෙකි.
- බුදු පාමොක් මහසඟනට මහත් ගෞරවයෙන් දන් දුන්නේය.
- සැවැත්නුවර වස් විසීමට වැඩම කළ බුදුරදුන්ට ජේතවනාරාමය කරවා පූජා කිර...
- අනාථයන් උදෙසා නොයෙක් පරිත්‍යාග කළ හෙයින් අනාථපිණ්ඩික යැයිද කියා...
- කණිටු දියණිය වූ සුමනාවෝ ද පියා අනුව යමින් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධා... කළාය. ඇය සකෘදාගාමී වූ තැනැත්තෙකි.
- මුළු ධනස්කන්දයම දන්දීම ආදී කටයුතු සඳහා යෙදවීම

ආදී කරුණු ඇසුරෙන් පිළිතුර සකස් විය යුතුය.

(ලකුණු ...)

IV.

- ශාසනික කටයුතු කෙරෙහි උනන්දුවෙන් ක්‍රියා කිරීම.
- භික්ෂු භික්ෂුණී දෙපිරිසගේ ශාසනික කටයුතු වලට අනුග්‍රහය දැක්වීම.
- සිවුපසයෙන් උපස්ථාන කිරීම ශාසනික අනුග්‍රහය වේ.
- උපාසක උපාසිකාවෝ ද ලෞකික ධාර්මික ජීවිතයක් පවත්වාගෙන යාම.
- ලෝකෝත්තර වශයෙන් ආධ්‍යාත්මික දියුණුවට භාවනා ආදී කටයුතුවල යෙදීමෙන් ලෝකෝත්තර සැනසීම සලසා ගැනීම සිය වගකීම වේ.

මේ ඇසුරෙන් පිළිතුර සකස් විය යුතුය.

( ලකුණු 06යි.)

08.

| | |
|---|---|
| I. පාටලී ග්‍රාමයෙහි | - සුනීධවස්සකාර |
| කෝටි ග්‍රාමයෙහි | - භික්ෂූන්ට ශීල සමාධි ප්‍රඥා වැඩීමේ අනුසස් දෙසීම. |
| ඥාතික ග්‍රාමයෙහි | - ජනවසභ සූත්‍රය දෙසීම |
| විසල්පුර | - ආම්‍රපාලි හා ලෝහිත පක්ඛඳිකාරෝගය වැළදීම. |
| චාපාල චෛත්‍යය | - ආනන්ද තෙරුන් ඇමතීම. |

භාණ්ඩ ග්‍රාමයෙහි භික්ෂූන්ට දහම් දෙසීම ආදිය ප්‍රධාන වේ.

(ලකුණු 04යි.)

II. අජාසත් රජු, ලිච්ඡවී රජවරු, ශාක්‍ය රජවරු, බුලිවරු, කෝලිය රජවරු, මල්ල කුමාරවරු.

(ලකුණු 04යි.)

III.

- භික්ෂු සංඝයා පිරිවරාගත් බුදුන් වහන්සේ කුකුත්ථාවානදිය වෙත පැමිණ එහි බැස ස්
  කොට පැන් වැළඳූහ.
- සිරුරෙහි මදක් ක්ලාන්ත ගතියක් ඇති වූ බැවින් සඟල සිවුර එලා පැනවූ අ
  විවේකීව වැඩ හුන්හ.
- බුදුවීමට පෙර දින සුජාතාව දුන් දානයත් පිරිනිවනට පෙර දින චුන්දකම්මාර පුත් දු
  එක හා සමාන ආනිසංස ඇතැයි දේශනා කිරීම.
- තමන් දුන් දානය වළඳා බුදුරදුන් රෝගී වූයේ දැයි චුන්ද තුළ යම් පසුතැවිල්ලක්
  ඔහු සනහාලන ලෙස ආනන්ද තෙරුන්ට දැනුම් දීම.
- නැවත එතැනින් නික්ම හිරණ්‍යවතී නදියෙන් එතෙරව කුසිනාරා පුරයට වැඩම කිරී
- එහි මල්ල රජදරුවන්ගේ උපවර්තන සල්උයනෙහි සල්ගස් දෙකක්
  අතර පනවා තිබූ ආසනය නැවත සකස් කරවා උතුරට හිසලා සිංහ සෙයියාවෙන්
- උපවාන තෙරුන් බුදුරදුන්ට පවන් සැලීම. සෙසු භික්ෂූන් වහන්සේලා කම්පාවෙ
  සිටීම.

  ආදී කරුණු වලින් පිළිතුර සකස්ව තිබිය යුතුයි.

IV.

- හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො, වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ
  මහණෙනි, ඔබ අමතමි. හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියලු සංස්කාර ධර්ම
  සුළුවෙති. එබැවින් අප්‍රමාදව කුසල් දහම් සම්පාදනය කරන්න.

09.

I. සැරියුත් තෙරුන් වහන්සේ - මුගලන්තෙරුන් වහන්සේ
ආනන්ද තෙරුන් වහන්සේ - මහාකාශ්‍යප තෙරුන් වහන්සේ
යශෝධරා තෙරණිය - මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය
උප්පලවණ්ණා තෙරණිය - ඛේමා තෙරණිය

ආදී තෙරවරු හා තෙරණිවරුන් අතරින් සිව් දෙනෙකි.

අභිඥාලාභී

II. යශෝධරා තෙරණිය - ~~විනයධර~~ භික්ෂුණීන් අතරින් අගතනතුර

මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය - මහාප්‍රාඥ භික්ෂුනින් අතරින් අගතනතුර

සැරියුත් තෙරුන් වහන්සේ - දකුණත්සව් ලෙස අගතනතුර

මුගලන් තෙරුන් වහන්සේ - වමත්සව් ලෙස අගතනතුර (ලකුණු [illegible])

III.

- සැරියුත් තෙරුන් වහන්සේ දකුණත් සව්ලෙස කටයුතු කිරීම.
- ධර්ම සේනාපති ලෙස කටයුතු කිරීම.
- සච්චවිභංග සූත්‍රය ආදී සූත්‍ර දේශනා පැවැත්වීම.
- ශාසනික වශයෙන් භික්ෂූන් වහන්සේට නායකත්වය ලබා දෙමින් ක්‍රියා කිරීම ආදී කරුණු
- මුගලන් මහරහතන් වහන්සේ වමත්සව් ලෙස කටයුතු කිරීම.
- මාර තජ්ජනීය සූත්‍රය ආදී දේශනා පැවැත්වීම.
- සෘද්ධි ප්‍රාතිහාර්ය දක්වමින් බෙහෝපිරිස් සසුන කෙරෙහි ප්‍රසාදයට පත් කරවා ගැනීම ආදී කරුණු ඇසුරෙනි.

(ලකුණු 06 යි.)

IV.

- මහාකාශ්‍යප මහරහතන් වහන්සේ බුදුරදුන්ට සමාන රූප ශෝභාවකින් යුක්ත වූහ. උන්වහන්සේ බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශාසනයේ නායකත්වයට පත් වූහ. පළමු ධර්ම සංගීතියේ ද නායකත්වය ගෙන ක්‍රියා කිරීම. ධර්මයට අදාළ සියලු ප්‍රශ්න හා විනයට අදාළ සියලු ප්‍රශ්න විචාරණ ලද්දේ උන්වහන්සේය. එබැවින් සාසනය ආරක්ෂාකර ගැනීමටත් ධර්ම විනය ආරක්ෂා කර ගැනීමටත් මහත් ධෛර්යෙන් ක්‍රියා කිරීම.
- ආනන්ද තෙරුන් වහන්සේ බුදුරදුන්ගේ ධර්ම භාණ්ඩාගාරික ලෙස ක්‍රියා කිරීම. අග්‍ර උපස්ථායක ද වූහ.
- පළමු ධර්මසංගීතියේදී ධර්මයට අදාළ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.
- දීඝ නිකාය ආරක්ෂා කර ගැනීමේ දීඝභාණක ගුරුකුලයේ නායකත්වය ගෙන ක්‍රියා කිරීම ආදී කරුණු වලින් පිළිතුර සකස් වී තිබිය යුතුය.

(ලකුණු 06 යි.)

10.

I. අනේපිඬු සිටුතුමා - යසකුල පුත්‍රයාගේ පියා වූ බරණැස් සිටුතුමා

උදේන රජතුමා - පසේනදී කොසොල් රජතුමා

සුමනා දේවිය - බන්ධුල මල්ලිකා උපාසිකාව

සුජාතා සිටු දේවිය - විශාඛා උපාසිකාව ආදීන් අතරින් හතර දෙනෙකි.

(ලකුණු 04යි.)

II.

1) ඇතුළත ගිනි පිටතට නොදිය යුතුය.
2) පිටතගිනි ඇතුළට නොගත යුතුය.
3) දෙන්නහුටම දිය යුතුය.
4) නොදෙන්නහුට නොදිය යුතුය.
5) දෙන්නහුට ද නොදෙන්නහුට ද දිය යුතුය.
6) සුවසේ හිඳගැනීම යුතුය.
7) සුවසේ අනුභව කළ යුතුය.
8) සුවසේ නිදාගැනීම කළ යුතුය.
9) ගිනි දෙවියන් පිදිය යුතුය.
10) ඇතුළත දෙවියන් පිදිය යුතුය.

මෙම කරුණු ඇතුළත්ව පිළිතුර සකස් වී තිබිය යුතුය.

(ලකුණු 04 )

III.

- විශාඛාව බුදුසසුනේ අග්‍රදායිකාව වේ. ඇය සත්හැවිරිදි වයසේ දී සෝවාන් වීම.
- මහාලතා පළඳනාව ලැබීම හා එය ශාසනයේ උන්නතිය වෙනුවෙන් පූජා කිරීම.
- මිගාරමාතු පාසාදය කරවා පූජා කිරීම.
- ඇය නිති දන් දුන්නාය. සියතින් සංඝයා වහන්සේට උපස්ථාන කිරීමට කැපවී ක්‍රියා කළාය.

මෙම කරුණු ඇසුරෙන් පිළිතුර සකස් වී තිබිය යුතුය.

(ලකුණු 06 )

IV.

- ශාසන උන්නතිය සඳහා කැපවී ක්‍රියා කිරීම.
- වෙහෙර විහාර ඉදි කිරීම හා ඒවා ප්‍රතිසංස්කරණය කොට ආරක්ෂා කර ගැනීම.
- භික්ෂු භික්ෂුණී උභය පිරිසට සිව්පසයෙන් උපස්ථාන කිරීම.
- සසුනෙහි පැවැත්ම උදෙසා සිය කුලදරුවන් සසුනට පූජා කිරීම.
- මිථ්‍යා දෘෂ්ටි වැළඳ ගැනීමෙන් තොරව ශ්‍රද්ධාවෙන් හා බුද්ධිමත්ව ක්‍රියා කිරීම.
- ධාර්මිකව ක්‍රියා කිරීම හා ධර්ම මාර්ගය ජීවන දර්ශනය ලෙස නිවැරදිව අනුගමනය කිරීම.

මේ ආදී කරුණු ඇසුරෙන් පිළිතුර සකස් වී තිබිය යුතුය.

(ලකුණු 06)

****************

# 2563 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2019 (2020) (2021)

## (01) බුද්ධ චරිතය

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුයි.

### ලකුණු බෙදීයාම

**I** කොටස

**ප්‍රශ්න අංක 01, 02 හා 03 සඳහා**

| | | | |
|---|---|---|---|
| (i) | කොටස සඳහා | = | ලකුණු 04 යි |
| (ii) | කොටස සඳහා | = | ලකුණු 04 යි |
| (iii) | කොටස සඳහා | = | ලකුණු 06 යි |
| (iv) | කොටස සඳහා | = | ලකුණු 06 යි |

**බැගින් එක් ප්‍රශ්නයකට ලකුණු 20 යි**

**II** කොටස

**ප්‍රශ්න අංක 04, 05 හා 06 සඳහා**

| | | | |
|---|---|---|---|
| (i) | කොටස සඳහා | = | ලකුණු 04 යි |
| (ii) | කොටස සඳහා | = | ලකුණු 04 යි |
| (iii) | කොටස සඳහා | = | ලකුණු 06 යි |
| (iv) | කොටස සඳහා | = | ලකුණු 06 යි |

**බැගින් එක් ප්‍රශ්නයකට ලකුණු 20 යි**

**III** කොටස

**ප්‍රශ්න අංක 07, 08, 09 හා 10 සඳහා**

| | | | |
|---|---|---|---|
| (i) | කොටස සඳහා | = | ලකුණු 04 යි |
| (ii) | කොටස සඳහා | = | ලකුණු 04 යි |
| (iii) | කොටස සඳහා | = | ලකුණු 06 යි |
| (iv) | කොටස සඳහා | = | ලකුණු 06 යි |

**බැගින් එක් ප්‍රශ්නයකට ලකුණු 20 යි**

**සමස්ථ පිළිතුරු සඳහා ලකුණු 100 යි**

# ලකුණු දීමේ පටිපාටිය

## I කොටස

01.

(i) **බ්‍රාහ්මණයන්ගේ අනුශාසකත්වය හා සංවිධානය ඇති ව පැවැත්වූ යාගහෝම වර්ග <u>හතරක්</u> නම් කරන්න.**

අශ්වමේධ, පුරුෂමේධ, වාජපේය, නිරග්ගල, සම්මාපාය, රාජසූය, සර්වමේධ යන යාග අතුරින් හතරකි.

**(ලකුණු 04යි)**

(ii) **යාගහෝම පැවැත්වීම සඳහා යොදාගත් දෑ (යාග ද්‍රව්‍ය) අතුරින් <u>හතරක්</u> නම් කරන්න.**

ධාන්‍ය වර්ග, පළාවර්ග, කිරි, ගිතෙල්, එළු, බැටළු, හරක්, කුකුළු, අශ්ව ආදී සතුන් ද මිනිසුන් ද යන මෙයින් හතරකි.

**(ලකුණු 04යි)**

(iii) **බ්‍රාහ්මණ සමාජය තුළ වෛශ්‍යයන්ට හිමි වූ කාර්යභාරය කෙටියෙන් පහදන්න.**

සත්ව පාලනය, දානය, යාග කිරීම, ඉගෙනීම, වෙළඳාම, ගොවිතැන් කිරීම යන කටයුතුයි.

* ආර්ථික අංශයෙහි නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ කටයුතුයි.

**(ලකුණු 06යි)**

කරුණු - 2 / සංකල්ප

විස්තරය - 3

(iv) **බුද්ධකාලීන භාරතයේ සමාජ විෂමතාවලට චාතුර්වර්ණය හෙවත් කුලභේදය පදනම් වූ අයුරු කෙටියෙන් විස්තර කරන්න.**

* මානවයාට සමානාත්මතාවෙන් නොසැලකීම.
* මානව අයිතීන් උල්ලංඝණය වීම (ජීවත් වීම, වැඩපළ කිරීම, ඉගෙනීම, රැකියාව, කරා කිරීම, සවන් දීම, ආගම් ඇදහීම) ආදියෙහි
* බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිව්කුල ක්‍රමය නිසා සමාජ විෂමතා පැනනැගුණු බවට කරුණු දක්වා තිබිය යුතුය.

**(ලකුණු 06යි)**

3 × 2

02.

(i) **බුද්ධකාලීන භාරතයෙහි පැවති සමූහාණ්ඩු <u>හතරක්</u> නම් කරන්න.**

කපිලවස්තුව, වේසාලිය, කුසිනාරාව, පාවා නගරය, සුංසුමාරගිරිය, අල්ලකප්පය, කේසපුත්තය, රාමග්‍රාමය, පිප්ඵලිවනය, මිථිලාව යන මේ අතරින් හතරකි.

**(ලකුණු 04යි)**

(ii) **බුද්ධකාලීන භාරතයෙහි පැවති සමූහාණ්ඩු පාලනය කළ රාජවංශ <u>හතරක්</u> ලියා දක්වන්න.**

ශාක්‍යයන්, ලිච්ඡවීන්, මල්ලවයන්, භග්ගයන්, බුලිවරුන්, කාලාමයන්, කෝලියන්, මෞර්යයන් යන මේ අතරින් හතරකි.

**(ලකුණු 04යි)**

(iii) **බුද්ධ චරිතයට සම්බන්ධ වැදගත් සිදුවීම් සිදු වූ සමූහාණ්ඩු <u>දෙකක්</u> නම් කොට, එම සමූහාණ්ඩුවල දී ඇති වූ බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් <u>දෙකක්</u> කෙටියෙන් විස්තර කරන්න.**

| | |
|---|---|
| ශාක්‍යයන්ගේ කපිලවස්තුව | - සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය |
| ලිච්ඡවීන්ගේ විශාලාව | - තුන්බිය දුරු කිරීමට රතන සූත්‍රය දේශනා කිරීම |
| මල්ලයන්ගේ කුසිනාරාව | - බුදුරදුන්ගේ පරිනිර්වාණය සිදුවීම |
| කාලාමයන්ගේ කේසපුත්තය | - කාලාමයන්ට කාලාම සූත්‍රය දේශනා කිරීම |

**සමූහාණ්ඩු දෙකක් නම් කිරීමට ලකුණු 02යි.**

**බුද්ධචරිතයේ සිදුවීම් දෙකකට ලකුණු 04යි.**

**(02 + 04 = 06යි)**

(iv) **සමූහාණ්ඩුවල ක්‍රියාත්මක ව පැවති බුදුරදුන්ගේ ප්‍රශංසාවට ලක් වූ ක්‍රමවත් රාජ්‍ය පාලන ව්‍යවස්ථාවක් කෙටියෙන් හඳුන්වන්න.**

1. නිතර රැස්වීම
2. සමගිව රැස්ව සමගිව කටයුතු කර සමගිව විසිර යෑම
3. නොපැනවූ නීති නොපැනවීම හා පැනවූ නීති නොකඩකොට රැකීම
4. වැඩිහිටියන්ට ගරුකිරීම හා ඔවුන්ගේ උපදෙස් පිළිපැදීම

5. කුල කතුන් ආරක්ෂා කිරීම
6. පූජනීය ස්ථානවලට කඩ නොකොට අවශ්‍ය වතාවත් කිරීම
7. ගුණවත් රහතුන්ට සිය රාජ්‍යයෙහි නිසි රැකවරණ සැලසීම

**කරුණු 07ට ලකුණු 04යි.**
**කෙටියෙන් හැඳින්වීමට ලකුණු 02යි.**
**(02 + 04 = 06යි)**

03.

(i) **බුද්ධකාලීන භාරතයේ පැවති දර්ශනවාද පිළිබඳ තොරතුරු සඳහන් වන සූත්‍ර දේශනා <u>හතරක්</u> නම් කරන්න.**

බ්‍රහ්මජාල සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය, චූල්ලමාලුංක්‍යපුත්ත සූත්‍රය, අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, මහාතිත්ථායතන සූත්‍රය, සුත්තනිපාතයේ අට්ඨක හා පාරායන වග්ගවලසූත්‍ර මේ අතරින් හතරකි.

**(ලකුණු 04යි)**

(ii) **බුද්ධකාලීන භාරතයේ පැවති දෙසැටක් මිථ්‍යාදෘෂ්ටිවාද අතුරින් <u>හතරක්</u> ලියා දක්වන්න.**

කේවල ශාස්වතවාද 04, ඒකච්ච ශාස්වතවාද 04, අන්තානන්තවාද 04, අමරාවික්ඛේපවාද 04, අධිච්චසමුප්පන්නවාද 02, පුබ්බන්තකල්පිතවාද 18කි. උච්ඡේදවාද 16, ආසඤ්ඤීවාද 08, නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද 08, උච්ඡේදවාද 07, දිට්ඨධම්මනිබ්බානවාද 05 මේ අතරින් හතරකි.

**(ලකුණු 04යි)**

(iii) **බුද්ධකාලීන භාරතයේ දාර්ශනික පරිසරයෙහි නිරන්තර ව පැවති 'දස අව්‍යාකෘත ප්‍රශ්න' කෙටියෙන් හඳුන්වන්න.**

ලෝකය ශාස්වතද, ලෝකය අශාස්වතද, ලෝකය අන්තවත්ද, ලෝකය අනන්තවත්ද, ජීවය හා ශරීරය එකක්ද, ජීවය හා ශරීරය දෙකක්ද, තථාගත මරණින් මතුවේද, තථාගත මරණින් මතු නොවේද, තථාගත මරණින් මතු වෙයි හෝ නොවෙයිද, තථාගත මරණින් මතු නොවෙයි හෝ නොමවෙයිද ?

**කරුණු 10 විතරක් නම් ලකුණු 04යි.**
**කෙටියෙන් හඳුන්වා තිබීමට ලකුණු 02යි.**

(02 + 04 = 06යි)

(iv) **දස අව්‍යාකෘත ප්‍රශ්න පිළිබඳ ව බුදුරදුන්ගේ විචාරය කෙටියෙන් විස්තර කරන්න.**

* විවිධ දෘෂ්ටිවාද ඇසුරින් උපන් මෙම ප්‍රශ්න සසර දුක නිවීම පිණිස උපයෝගී නොවන බැවින් බුදුරදුන් ඒක එල්ලේම පිළිතුරු සපයා නැත.
* මෙම ප්‍රශ්න අර්ථ සහිත නොවේ.
* ආදි බ්‍රහ්මචර්යාව පිණිස හේතු නොවේ.
* නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, උපසමය පිණිස, අභිඥාව පිණිස, සම්බෝධිය පිණිස, නිර්වාණය පිණිස හේතු නොවේ.

එහෙයින් ඒවා, (අව්‍යාකෘත යැයි බුදුරදුන් විසින් වදාරණ ලදී.)

කරුණු 3

**කරුණු 01ට ලකුණු 02 බැගින් කරුණු 03ට ලකුණු 06යි**

## II කොටස

04.

(i) **සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ වෙසක් මස පුර තුදුස්වක දින රාත්‍රියෙහි දුටු සිහින පහ අතුරින් හතරක් ලියා දක්වන්න.**

1. පළමු සිහිනය

මහපොළොව යහනක් විය. හිමාලය පර්වතය තම සයනයෙහි කොට්ටය විය. එහි සැතපෙන බෝසතුන්ගේ වම් අත පෙරදිග මුහුදෙහි විය. අපරදිග මුහුදෙහි දකුණු අත විය. දකුණු දිග මුහුදෙහි දෙපා විහිදී තිබිණ.

2. දෙවැනි සිහිනය

බෝසතුන්ගේ නාභියෙන් රතු ඊතණ ගසක් පැන නැගී අහසපුරා දිග්ව පැතිර ගියේ ය.

3. තෙවැනි සිහිනය

කළුහිස් ඇති සුදු පණුවන් රාශියක් පාද මූලයෙන් නැගී දණහිස දක්වා වසා ගැනීමයි.

4. හතරවැනි සිහිනය

සිව්දිගින් පියඹා පැමිණි ඒ ඒ වර්ණයෙන් යුත් ලිහිණියන් සතර දෙනෙක බෝසතුන්ගේ පාමුල වැටී එකම සුදු වර්ණයෙන් යුක්ත වීම.

5. පස්වැනි සිහිනය

මහත් සේ කිළිටි මහා අසූචි පර්වතයක් මුදුනේ එහි නොතැවරී, නොගෑවී, බෝසතුන් සක්මන් කිරීමයි.

මෙම කරුණු අතරින් එකකි.

**(ලකුණු 04යි)**

(ii) **ඉහත සඳහන් කළ සිහින හතරෙහි අර්ථ වෙන වෙනම ඉදිරිපත් කරන්න.**

පළමු සිහිනයෙන් සියල්ල අභිබවා බෝසතුන් සම්බුදු පදවිය ලබන බවට පෙර නිමිත්තක් ලෙස අර්ථවත් වේ.

දෙවැනි සිහිනයෙන් ශ්‍රේෂ්ඨ වූ ආර්යෂ්ටාංගික මාර්ගය අවබෝධ කොට ගෙන එය ලොව පුරා දේශනා කරන්නේය යන අර්ථය වේ.

තෙවැනි සිහිනයෙන් බොහෝ උවසු උවැසියෝ බුදුන් සරණ යන්නෝය යන අර්ථය වේ.

සිව්වැනි සිහිනයෙන් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යන සිවු කුලයන්ගෙන් පැමිණෙන ජනයා බුදුරදුන් හමුවෙහි පැවිදිව එකම ආර්යශ්‍රාවකයන් බවට පත් වන්නේය යන අර්ථය වේ.

පස්වැනි සිහිනයෙන් සිවුපසයෙන් බොහෝ ලාභ ප්‍රයෝජන ලැබෙද්දී එහි නොඇලී නිරාමිස පිවිතුරු ජීවිතයක් ගත කිරීම අර්ථවත් වේ.

මෙයින් හතරකි.

**(ලකුණු 04යි)**

(iii) **සිද්ධාර්ථ බෝසතාණෝ වහන්සේ වැඩූ 'චතුරංග සමන්නාගත වීර්යය' කෙටියෙන් පදහන්න.**

1. සිරුරෙහි සම් ගැලවී විසිරී ගියත් බුදු වී මිස නොනැගිටිමි.
2. සිරුරෙහි නහර ගැලවී විසිරී ගියත් බුදු වී මිස නොනැගිටිමි.
3. සිරුරෙහි ඇටකටු ගැලවී විසිරී ගියත් බුදු වී මිස නොනැගිටිමි.
4. සිරුරෙහි මස්, ලේ විසිරී ගියත් බුදු වී මිස නොනැගිටිමි.

යන දැඩි වූ අධිෂ්ඨානය චතුරංග සමන්නාගත වීර්යයයි.

**මේ කරුණු අතරින් එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 04ට ලකුණු 04යි.**

**කෙටි විස්තරයක් සහිත වේ නම් ලකුණු 06යි.**

(iv) **සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීමෙහිලා සිත මෙහෙයවූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.**

* මාර යුද්ධයෙන් ජයගත් බෝසත්හු රාත්‍රිය ගෙවා පසුදින උදාවත්ම එහි පෙරයම් භාගයේ සර්වඥතාඥානය පිණිස සිත මෙහෙයවූහ.
* ආනාපානසතිය ඔස්සේ සිතවඩා ප්‍රථමධ්‍යානය උපදවා ගත්හ.
* ද්විතීයධ්‍යානය උපදවා ගත්හ.
* තෘතියධ්‍යානය උපදවා ගත්හ.
* චතුර්ථධ්‍යානය උපදවා ගත්හ.

අනතුරුව එසේ එකඟ වූ පිරිසිදු වූ කිලුටෙන් තොරව කෙලෙස් රහිත වූ මෘදු වූ ස්ථාවර වූ කර්මන්‍ය වූ නොසෙල්වන ස්වභාවයෙහි පිහිටි සිත පෙර විසූ කඳපිළිවෙළ සිහි කෙරෙන ඥාන දර්ශනය වෙත යොමු කෙරීණ.

අනතුරුව පුබ්බේනිවාසානුස්මෘති ඥානය නම් පළමු විද්‍යාව ද

චුතූපපාත ඥානය නම් දෙවැනි විද්‍යාව ද

ආසවක්ඛය ඥානය නම් තෙවැනි විද්‍යාව ද උපදවා ගත්හ,

අනතුරුව අර්හත් මාර්ගඥානය සමග සිවිපිළිසිඹියා, ෂඩ් අසාධාරණඥාන, චතුර්වෛසාරද්‍යඥාන, දසබලඥාන ආදී ඥාන විශේෂතා සාක්ෂාත් කරමින් සම්බුද්ධත්වය සාක්ෂාත් කළහ.

**එක් කරුණකට ලකුණු 02 බැගින් කරුණු 03ක් ඇසුරෙන්**

**කෙටි විස්තරයට ලකුණු 06යි.**

05.

(i) **සම්බුද්ධත්වයට පෙර බෝසතාණන් වහන්සේ පළවා හළ දසමරසෙන් අතුරින් <u>හතරක්</u> නම් කරන්න.**

කාමය, අරතිය, සාගිපාසාව, තෘෂ්ණාව, ථිනමිද්ධය, භය, විචිකිච්ඡාව, ගුණමකුබව හා දැඩිබව, ලාභ සත්කාර හා වැරදි මාර්ග වලින් ලබන යසස, තමන් උසස් කොට සලකමින් අනුන් පහත් කොට සැලකීම.

මෙයින් හතරකි.

(ලකුණු 0

(ii) **බුදුරජාණන් වහන්සේ සත්සතිය ගත කළ ස්ථාන අතුරින් <u>හතරක්</u> ලියා දක්වන්න.**

පළමු සතිය බෝධිමූලයෙහි, දෙවැනි සතිය අනිමිස ලෝචන පූජාව, තෙවැනි සතිය රුවන් සක්මන, සිව්වැනි සතිය රුවන්ගෙයි වැඩ සිටීම, පස්වැනි සතිය අජපාල නුගරුක මුල, සයවැනි සතිය මුචලින්ද නාගදරණය යට, සත්වන සතිය රාජායතන කිරිපලු නුගරුක මුල වැඩ සිටීම යනුයි.
මෙයින් හතරකි.

**(ලකුණු 04යි)**

(iii) **බුදුරදුන් හුහුංක ජාතික බ්‍රාහ්මණයාට දේශනා කළ, බ්‍රාහ්මණයකු බවට පත් කරන ධර්ම කෙටියෙන් පහදන්න.**

යමෙක් පව්දුරු කළේද අනුන් හෙළා දැකීම වශයෙන් හුහුංකාරී නොවූයේද කෙලෙස් කසටින් තොරවූයේ ද භාවනාවෙන් සංවර කළා වූ සිත් ඇත්තේ වේද සතර මග නුවණින් නිවන් කරා පැමිණියේ වේද මාර්ග බ්‍රහ්මචර්යය වැස නිම වූයේද ලෝකයෙහි කිසිම අරමුණක් රාග, ද්වේෂ, මෝහ, මාන, දෘෂ්ටි වශයෙන් නොගන්නේ ද හෙතෙම බ්‍රාහ්මණයෙකැයි කියන්නේ ය.

යෝ බ්‍රාහ්මණෝ බාහිත පාපධම්මො
නිහුහුංකො නික්කසාවො යතත්තෝ
වේදන්තගූ වුසිත බ්‍රහ්මචරියෝ
ධම්මෙන සෝ බ්‍රහ්මවාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිංචි ලෝකේ

ඉහත අර්ථය ඇසුරින් පැහැදිලි කොට තිබිය යුතුයි.

**එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 06ට ලකුණු 06යි.**

(iv) **බුදුරජාණන් වහන්සේ දෙවැනි සතිය ගත කළ ආකාරය දක්වා, එයින් ලෝකයා හට සපයන ආදර්ශය පැහැදිලි කරන්න.**

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමට සෙවන ලබාදුන් බෝධි වෘක්ෂයට ගෞරව කිරීමක් ලෙස සතියක් පුරා බෝධීන් වහන්සේ දෙස ඇසිපිය නොහෙළා බලා සිටීමෙන් අනිමිස ලෝචන පූජාවෙන් දෙවැනි සතිය ගත කළහ.
මෙයින් ලෝකයා හට සපයන ආදර්ශය වන්නේ කළගුණ සැලකීමේ කෘතඥතා ගුණය ප්‍රකට කරලීමයි.

**දෙවැනි සතිය ගතකළ ආකාරය දැක්වීමට ලකුණු 04යි.**

**ලෝකයාට සපයන ආදර්ශයට ලකුණු 02යි.**

**(04 + 02 = 06යි)**

06.

(i) **ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දී බුදුරදුන් විසින් දේශනා කරනු ලැබූ, පැවිද්දන් විසින් අත්හළ යුතු අන්ත <u>දෙක</u> නම් කොට, ඒවා එසේ හැඳින්වීමට හේතු දක්වන්න.**

1. කාම සුඛල්ලිකානුයෝගය - හීන වූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන්ට අයත් අනාර්ය වූ අනර්ථය පිණිස පවතින්නක් බැවිනි.
2. අත්තකිලමථානුයෝගය - දුක්ඛයට කාරණා වූ අනාර්ය වූ අනර්ථ සංහිත වූ බැවිනි.

**අන්ත දෙකට ලකුණු 02යි. එසේ හැඳින්වීමට හේතුන්ට ලකුණු 02යි.**

**(02 + 02 = 04යි)**

(ii) **'දුක්ඛ සමුදය ආර්ය සත්‍යය' කෙටියෙන් විස්තර කරන්න.**

නැවත ඉපදීම සිදු කරන, නන්දිරාගය හා එක්ව හටගන්නා, ඒ ඒ භවයෙහි ඇල්ම ඇති කරනා, යම් තෘෂ්ණාවක් වේ නම් එය දුක්ඛ සමුදය ආර්ය සත්‍යය යි. එකී තෘෂ්ණාව තෙවැදෑරුම් වේ.

1. පංචකාමයෙහි ඇලෙන සුළු කාම තණ්හාව
2. ශාශ්වත දෘෂ්ටිය හා එක්ව පැවති භව තණ්හාව
3. උච්ඡේද දෘෂ්ටිය හා එක්ව පැවති විභව තණ්හාව

මෙහි තෘෂ්ණාවේ ප්‍රභේද දක්වා නැතත් දුක්ඛ සමුදය ආර්ය සත්‍යය හඳුන්වා ඇත්නම් ලකුණු හිමි වේ.

**(ලකුණු 04යි)**

**(iii) ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දී චතුරාර්ය සත්‍යයේ එක් එක් සත්‍යය බෙදා ඇති කොටස් තුන නම් කර, ඒවා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.**

සත්‍ය ඥාන - චතුරාර්ය සත්‍ය දැන ගන්නා නුවණ යි.

කෘත්‍ය ඥාන - චතුරාර්ය සත්‍ය අවබෝධයේ දී ඒ ඒ සත්‍යයෙන් සිදුවන කටයුතු දැන ගන්නා නුවණ යි. දුක්ඛ සත්‍යයෙන් දුක දැන ගැනීමද සමුදය සත්‍යයෙන් දුකට හේතුව ද නිරෝධ සත්‍යයෙන් නිර්වාණය සාක්ෂාත් කිරීමද මාර්ග සත්‍යයෙන් මාර්ගය වැඩීමද දැන ගන්නා නුවණයි.

කෘත ඥාන - චතුරාර්ය සත්‍යය අවබෝධ කළ බවට පහළ වන නුවණයි. දුක්ඛය පරිඥානය, සමුදය ප්‍රහීණය, නිරෝධය සාක්ෂාත් කෘතය, මාර්ගය භාවිතය වශයෙනි.

**කොටස් තුනට ලකුණු 03ක් ද**

2 X 3

**කෙටි හැඳින්වීමට ලකුණු 03ක් ද වශයෙන් ලකුණු 06 යි.**

**(iv) බුදුරදුන් විසින් සාක්ෂාත් කරන ලද මධ්‍යම ප්‍රතිපදාව ගෙනහැර දක්වා, සංකීර්ණ සමාජයේ අවිවේකී ජීවිත ගත කරන ජනතාව වෙත ඉන් ලබා දෙන මාර්ගෝපදේශ පෙන්වා දෙන්න.**

මධ්‍යම ප්‍රතිපදාව නම් ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. එනම්,

සම්මා දිට්ඨි - නිවැරදි දැකීම

සම්මා සංකප්ප - නිවැරදි සංකල්පනාව

සම්මා වාචා - නිවැරදි වචනය

සම්මා කම්මන්ත - නිවැරදි කර්මාන්තය

සම්මා ආජීව - නිවැරදි දිවිපැවැත්ම

සම්මා වායාම - නිවැරදි උත්සාහය

සම්මා සති - නිවැරදි සිහිය

සම්මා සමාධි - නිවැරදි සමාධිය යනුයි.

සමාජය කෙතරම් සංකීර්ණ වුවත් අවිවේකී වුවත් නිවැරදි ජීවිතයක් ගත කිරීම ආත්ම සන්තෘප්තියටත් සමාජ සුභසෙතටත් හේතු වේ. එබැවින්,

* වැරදි දැකීමෙන් හා වැරදි සංකල්පනාවන්ගෙන් තොරව ක්‍රියාකළ යුතුය. මිථ්‍යාදෘෂ්ටිය හා මිථ්‍යා සංකල්පනාව මෙලොවටත් පරලොවටත් හානිකරය. සමාජයට අයහපතම උදාකරයි.
* මිථ්‍යා වචන, මිථ්‍යා කර්මාන්ත හා මිථ්‍යා ආජීවය මෙලොව හා පරලොවටත් හානිකරය. සමාජයටද අයහපතම උදාකරයි.
* වැරදි උත්සාහය, වැරදි ලෙස යොදවාගත් සිහිය හා සමාධිය මෙලොවට හා පරලොවට අයහපතට හේතු වේ, සමාජයටද හානි කරයි. එබැවින් නිවැරදි ජීවන දර්ශනයක් ලෙස මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම කවර සමාජයකට වුවද හිතකර වේ.

මේ ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුය.

**මධ්‍යම ප්‍රතිපදාව දැක්වීමට ලකුණු 04යි.**

**මාර්ගෝපදේශ සඳහා ලකුණු 02යි.**

## III කොටස

07.

(i) **බුදුරදුන්ගෙන් පිහිට ලද තැනැත්තන් <u>හතරදෙනකු</u> නම් කරන්න.**

ශකට පාළු වූ ගොවියා, කුඹුරක දමාගිය මුදල් පසුම්බිය නිසා පීඩාවට පත් වූ ගොවියා, කුමාරකාශ්‍යප මාතාව, පටාචාරාව, පූතිගත්තතිස්ස තෙරණුවෝ, සුන්දරික භාරද්වාජ බ්‍රාහ්මණ ආදීන්ගෙන් හතර දෙනෙකි. කිසාගෝතමී, සුනීත, සෝපාක

**(ලකුණු 04යි)**

(ii) **බුදුරදුන් විසින් හික්මවනු ලැබූ තැනැත්තන් <u>හතරදෙනකුගේ</u> නම් සඳහන් කරන්න.**

අංගුලිමාල, සූචිලෝම, ඛරලෝම, සච්චක, සභිය පිරිවැජියා, නාලාගිරි ඇතු ආදීන්ගෙන් හතර දෙනෙකි. ආලවක

**(ලකුණු 04යි)**

(iii) **ඉහත (ii) හි ඔබගේ පිළිතුරට අදාළව එම තැනැත්තන්ගෙන් <u>දෙදෙනකු</u> හික්මවනු ලැබූ ආකාරය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.**

අංගුලිමාල, සූචිලෝම, ඛරලෝම, සච්චක, සභිය පිරිවැජියා, නාලාගිරි ඇතු ආදීන් අතරින් දෙදෙනකු ගැන කෙටියෙන් විස්තර කොට තිබිය යුතුය. බුදුරදුන් විසින් ඔවුන් හික්මවූ අයුරු පෙන්වා තිබිය යුතුය.

**එක් උදාහරණයකට ලකුණු 03 බැගින් උදාහරණ දෙකකට ලකුණු 06යි.**

(iv) **බුදුසසුනේ ස්ථාවරත්වය සඳහා බුදුරදුන් විසින් අනුගමනය කරනු ලැබූ ක්‍රියාමාර්ග <u>දෙකක්</u> පිළිබඳව සාකච්ඡා කරන්න.**

* ✶ බුදු සසුනෙහි විනය ශික්ෂා පැනවීම
* ✶ ශාසනය ආරාමික සංස්ථාවක් බවට පත්වීම
* ✶ ආරාමික වත් හඳුන්වා දීම (ආචරිය - උපජ්ඣායක, සද්ධිවිහාරික, අන්තේවාසික) ශාසනික ධුර ලෙසද හැඳින්වේ.
* ✶ සුදුස්සන් විෂයෙහි තනතුරු ප්‍රදානය කිරීම

ආදී කරුණු අතරින් දෙකක් කෙටියෙන් විස්තර කොට තිබිය යුතුයි.

**එක් ක්‍රියාමාර්ගයක් ගැන වූ කෙටි විස්තරයට ලකුණු 03යි.**

**ක්‍රියාමාර්ග දෙකකට ලකුණු 06යි.**

08.

(i) **බුදුරදුන්ට ස්ථිර උපස්ථායකයකු පත්කර ගැනීමට පෙර වරින් වර බුද්ධෝපස්ථානයට පැමිණි භික්ෂූන් වහන්සේලා <u>හතර නමක්</u> නම් කරන්න.**

නාගිත හිමි, නාගසමාල හිමි, සුනක්ඛත්ත හිමි, සාගත හිමි, උපවාන හිමි, රාධ හිමි, මේඝිය හිමි, චුන්ද හිමි

මේ අතරින් හතර දෙනෙකි.

**(ලකුණු 04යි)**

(ii) **බුදුරදුන් විසින් දේශනා කරන ලද <u>සතර</u> සෘද්ධිපාද නම් කරන්න.**

ඡන්ද, චිත්ත, විරිය, විමංසා යන හතරයි.

**(ලකුණු 04යි)**

(iii) **බුද්ධ චරිතයේ අවසන් දින කිහිපය අතරතුරදී විශාලාමහනුවර කූටාගාර ශාලාවට වැඩම කළ බුදුරදහු ආනන්ද තෙරුන් ලවා භික්ෂු සංඝයා රැස් කරවා මෙතෙක් කමක් වහන්සේ**

**දෙසූ ධර්මය හකුළුවා දේශනා කළහ. එහිදී හකුළුවා දේශනා කරන ලද ධර්මය ලියා දක්වන්න.**

මහණෙනි, මා අවබෝධ කොටගෙන තොපට දෙසූ ධර්මය මැනවින් ඉගෙන, ලෝක සත්වයාගේ හිත සුව පිණිස, මුලු බුද්ධශාසනයේ චිරස්ථිතිය පිණිස, උත්සාහයෙන් කටයුතු කරන්න. තථාගතයන් වහන්සේ තව තුන් මසකින් පිරිනිවන් පාන සේක. සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළුය. නොපමාව කුසල් දහම් රැස් කිරීමෙහි යෙදෙන්න යන්නයි.

පාළි වාක්‍ය 3 **(එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු 06යි)**

(iv) **බුද්ධ චරිතයේ අවසන් දිනය කිහිපය ගත වූ ආකාරය පෙන්වා දී එයින් ශාස්තෘවරයකු ලෙස ලෝකයාට සපයන ආදර්ශ සාකච්ඡා කරන්න.**

* බුදුරදුන් ආනන්ද තෙරුන් අමතා බුදුවීමට පෙර දින සුජාතාව දුන් දානයත් පිරිනිවන් පානා දිනට පෙර දින චුන්දකර්මාර පුත්‍ර දුන් දානයත් සමාන ආනිසංස ඇති බව දේශනා කිරීම.
* හිරණ්‍යවතී නදියෙන් එතෙරව කුසිනාරා පුරයට වැඩම කිරීම හා මල්ල රජදරුවන්ගේ උපවර්තන සල් උයනෙහි සල් ගස් දෙකක් අතර ආසනයෙහි වැඩ හිඳීම.
* බොහෝ භික්ෂූන් හඬන්නට වීම, උපවාන තෙරුන් පවන් සැලීම.
* ආනන්ද තෙරුන් අමතා ආනන්දය, තථාගතයන්ගේ ඇවෑමෙන් සැදැහැවතුන් විසින් දැක බලා සංවේග උපදවා ගත යුතු ස්ථාන සතරක් ඇතැයි දේශනා කිරීම.
* භික්ෂු සංඝයා ස්ත්‍රීන් කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය දේශනා කිරීම.
* පිරිනිවන් පෑ පසු බුදු සිරුර කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය දේශනා කිරීම.
* ආනන්ද තෙරුන් කම්පාවෙන් යුක්ත ව හඬන්නට වීම.
* අනුකම්පාවෙන් ආනන්ද තෙරුන් කැඳවා ආනන්දය, ශෝක නොකරන්න සියලු ප්‍රියමනාප දෙයින් වෙන්වන්නට සිදුවන බවත්, හටගත් සියල්ල ක්ෂය වන බවත් සල් ඇතිව මා විසින් නොයෙක් වර ප්‍රකාශ කර තිබෙනවාදැයි කියා ආනන්දය, උත්සාහයෙන් දිරිවඩන්න යැයි අවවාද කිරීම.
* රජගහ, ශ්‍රාවස්ති, සාකේත, කොසඹෑ ආදී සුවිසල් නගර තිබිය දී කුඩා නගරයක පිරිනිවන් පාන්නේ ඇයි දැයි ඇසීම.
* මෙය කුඩා නගරයක් නොව මහා සුදර්ශන ඇතුළු සක්විති රජදරුවන්ගේ අග නගරයක් යැයි පෙන්වා දීම.

* බුදුරදුන් පිරිනිවන් පාන බව මල්ල රජදරුවන් වෙත දන්වා යැවීම.
* මල්ල රජදරුවන් පැමිණ ශෝක හරිතව බුදුරදුන්ට ගරු බුහුමන් දැක්වීම.
* කුසිනාරා වැසි සුභද්‍ර පිරිවැජියා බුදුරදුන් වෙත පැමිණීම හා ආනන්ද තෙරුන් ඔහු වළකාලීම.
* බුදුරදුන් ඔහුව කැඳවා ඔහුගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම හා බුදුරදුන්ගේ අවසන් ශ්‍රාවකයා ලෙස අප්‍රමාදීව කුසල් වඩා රහත් බව ලබා ගැනීම.
* බුද්ධ ශාසනයේ ධර්ම - විනය දෙක ශාස්තෘත්වයෙහිලා සලකා කටයුතු කරන ලෙස දේශනා කිරීම.
* මහණෙනි, ඔබ අමතමි. හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියලු සංස්කාර ධර්ම නැසෙන සුළුය. අප්‍රමාදව කුසල් දහම් වඩන්න යැයි අවසන් බුද්ධ වචනය දේශනා කිරීම.
* අනතුරුව ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථ ධ්‍යානය දක්වා පිළිවෙලින් වෙන වෙනම සමාපත්තීන්ට සම වැදීම. ඉන් නැගිට ආකාසානඤ්චායතන සමාපත්තියේ සිටට ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය දක්වා සමවැදී සමාපත්ති සුව වැඳීම. නැවත ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථ ධ්‍යානය දක්වා සමවැදී චතුර්ථ ධ්‍යානයෙන් නැගී පෙරදිගින් අරුණ නැගෙද්දී සියලු සංස්කාර ධර්ම අනිත්‍ය බව තහවුරු කරමින් නිරුපධිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑම.

ලෝකයාට සපයන ආදර්ශ

* ජීවිතයේ අන්තිම අවස්ථාවෙහි දී ද සුභද්‍ර පිරිවැජියාට පිහිට වීමෙන් පරාර්ථය වෙනුවෙන් කැපවිය යුතු බවට ලබා දෙන ආදර්ශය.
* කාලයෙන් උපරිම ප්‍රයෝජන ගත යුතු බව.
* ලෝකයේ යථාර්ථය පැහැදිලි කිරීමෙන් හා යථාර්ථයට මුහුණ දීමෙන් සියල්ලන්ට පොදු සනාතනික ධර්මතාවක් බව තේරුම් ගතයුතු බවට සපයන ආදර්ශය.
* ආනන්ද තෙරුන්ගේ ඇප උපස්ථාන ගැන සඳහන් කරමින් ඇගයීම හා ප්‍රශංසාව පළ කිරීමෙන්, කළගුණය හා කෘතවේදීත්වය පළකිරීමේ ආදර්ශය.
* ධර්ම - විනය ශාසනයේ ශාස්තෘත්වයෙහිලා කටයුතු කරන ලෙස අවවාද කිරීමෙන්, යම් සංස්ථාවක පැවැත්ම සඳහා සැලසුම් සකස්කළ යුතු බවට සපයන ආදර්ශය.
* පිරිනිවන් පෑම සඳහා උපවර්තන සල් උයන තෝරා ගැනීමෙන් ලොකු කුඩා භේදය හෝ ලාභ, කීර්ති ප්‍රශංසා ආදිය ඇති ස්ථාන හෝ සඳහා නොගෙන උපේක්ෂාවෙන්, යථාර්ථයට මුහුණ දීමේ ආදර්ශය.

මේ ආදී කරුණු ඇසුරින් ආදර්ශ පෙන්වා තිබිය යුතු යි.

**අවසන් දින කිහිපය ගත කළ ආකාරයට ලකුණු 04යි.**

**ලෝකයට සපයන ආදර්ශ සඳහා ලකුණු 02යි.**

**(04 + 02 = 06යි)**

09.

(i) **බුදුසසුනේ අග්‍රස්ථාන ලැබූ මහරහතන් වහන්සේලා දෙදෙනකු හා මහරහත් තෙරණින් වහන්සේලා දෙදෙනකු නම් කරන්න.**

සැරියුත්, මුගලන්, මහාකාශ්‍යප, ආනන්ද, සීවලී, රාහුල, මහාකච්චායන, පුණ්ණ මන්තානිපුත්ත, කුමාර කාශ්‍යප ආදී තෙරුන් වහන්සේලා අතරින් දෙනමක් ද

මහා ප්‍රජාපතීගෝතමී තෙරණිය, භද්දකච්චානා තෙරණිය, ඛේමා තෙරණිය, උප්පලවණ්ණා තෙරණිය, ධම්මදින්නා තෙරණිය, අම්බපාලි, පටාචාරා තෙරණිය ආදී තෙරණින් වහන්සේලා අතරින් දෙනමක්ද ලියා තිබිය යුතුය.

**(ලකුණු 04යි)**

(ii) **ඉහත (i) ට අදාළව ඔබ විසින් ලියා දක්වන ලද එම මහ තෙරුන් වහන්සේලා හා මහ තෙරණින් වහන්සේලා ලැබූ අග්‍රස්ථාන මොනවා දැයි සඳහන් කරන්න.**

* සැරියුත් තෙරුන් දකුණත් සව් හා ධම්මසේනාපති ලෙසද මහා ප්‍රාඥයන් අතර අගතනතුර ද
* මුගලන් තෙරුන් වමත් සව් ලෙස ද සෘද්ධිමතුන් අතරින් අගතනතුර ද
* මහාකාශ්‍යප තෙරුන් ධුතවාදී තෙරවරුන් අතරින් අගතනතුර ද
* ආනන්ද තෙරුන් ධර්ම භාණ්ඩාගාරික, බුදුරදුන්ගේ අග්‍ර උපස්ථායක, බහුශ්‍රැතයන් අතර අගතනතුර, සිහිකල්පනා ඇත්තවුන් අතර අගතනතුර, අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර අගතනතුර යන තනතුර
* සීවලී තෙරුන් බුදුසසුනේ ලාභීන් අතර අගතනතුර
* මහා කච්චායන තෙරුන් සංක්ෂිප්ත දේශනා විස්තර, විභාග වශයෙන් දේශනා කිරීමේ කුසලතාව ඇති අය අතරින් අගතනතුර ද
* පුණ්ණ මන්තානිපුත්ත තෙරුන් ධර්ම කථිකයන් අතරින් අගතනතුර ද
* කුමාර කාශ්‍යප තෙරුන් පිවිතුරු දහම් දෙසන්නන් අතරින් අගතනතුර ද පිරිනමන ලදී.
* මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය චිරරාත්‍රඥ භික්ෂුණීන් අතරින් අගතනතුර ද

* භද්දකච්චානා තෙරණිය අභිඥාලාභීන් අතරින් අග්‍රතනතුර ද
* ඛේමා තෙරණිය මහා ප්‍රඥා තෙරණිවරුන් අතරින් අග්‍රතනතුර ද
* උප්පලවණ්ණා තෙරණිය අග්‍රශ්‍රාවිකා තනතුර ද සෘද්ධිමත් භික්ෂුණීන් අතරින් අග්‍රතනතුර ද
* ධම්මදින්නා තෙරණිය ධර්ම කථික තෙරණිවරුන් අතරින් අග්‍රතනතුර ද
* පටාචාරා තෙරණිය විනයධර භික්ෂුණීන් අතරින් අග්‍රතනතුර ද ලැබුවාය.

ඉහත (i) ට අදාළව සපයන පිළිතුරට අනුගතව ඒ ඒ තෙරවරුන් හා තෙරණිවරුන්ගේ අග්‍රස්ථාන දක්වා තිබිය යුතුය.

**(ලකුණු 04යි)**

**(iii) මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ චරිතය පිළිබඳ ව කෙටියෙන් ලියා දක්වා. බුද්ධසසුනේ උන්නතියට උන්වහන්සේගෙන් සිදු වූ සේවාව අගය කරන්න.**

මගධරට තිත්ථගම කපිල නම් බ්‍රාහ්මණයාගේ එකම පුතු පිප්පලී නම් විය. පරපුරෙන් හිමිව තිබූ මහා ධනස්කන්ධයක් ඔහුට හිමිව තිබූ අතර කුල පරපුර රැක ගැනීමට සිටි එකම පුතු ද මොහු විය. එහෙත් ඔහු ගිහි ජීවිතයේ කාමභෝගී යස ඉසුරු හා සැප සම්පත් ගැන උනන්දුවක් නොදක්වා පැවිදි විය. ශාසනයෙහි ධූතාංග සම්පූර්ණ කොට රහත් බවට පත්විය. ශාසනයෙහි ධූතාංගධාරී තෙරුන් අතර අග්‍රතනතුර ද ලැබීය. බුදුරදුන්ට සමාන රූප විලාසයකින් යුක්ත උන්වහන්සේ මහාපුරුෂ ලක්ෂණවලින් යුක්තව ජීවත් වූ බවත්, බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුද්ධ ශරීරයට ආදාහන කටයුතු සංවිධානය කිරීමට ද උන්වහන්සේගේ පැමිණීම අවශ්‍ය වූ බවත්, උන්වහන්සේ වැඩම කොට අවසන් ගෞරව දැක්වීමෙන් පසු බුද්ධ ශරීරය ආදාහනය කළ බවත් සඳහන් වේ.

ශාසනයේ චිර පැවැත්ම වෙනුවෙන් පළමු ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය දැරීමෙන් ද ශාසනයේ භාරධාරිත්වය දැරීමෙන් ද ශාසන චිරස්ථිතිය උදෙසා කටයුතු කළේය.

මහා කාශ්‍යප තෙරුන්ගේ චරිතය කෙටියෙන් දක්වා තිබිය යුතුය.

බුද්ධසසුනේ උන්නතියට සිදුවූ සේවාව;

* පළමු ධර්ම සංගීතියේ ප්‍රධානත්වය දැරීම.
* ධර්ම - විනය දෙක සංග්‍රහ කිරීම.
* බුද්ධානුබුද්දක ශික්ෂාවන් පිළිබඳ සංවාදයේ දී බුදුරදුන් විසින් පනවන ලද සියලු ශික්ෂා නොකඩ කොට ආරක්ෂා කළ යුතු බවට තීරණය කිරීමට නායකත්වය දැරීම.
* භාණක පරපුර අතරින් සූත්‍ර පිටකයේ ධර්ම කොට්ඨාසයක් ආරක්ෂා කිරීමට නායකත්වය දැරීම.

* අභිධර්මය ආරක්ෂා කිරීමේ වගකීම දැරීම.

ආදී කරුණු ඇසුරින් පිළිතුර සකස් වී තිබිය යුතුයි.

**චරිතය ලියා දැක්වීමට ලකුණු 03යි.**

**උන්නතියට ක්‍රියා කිරීමට ලකුණු 03යි.**

**(03 + 03 = 06යි)**

(iv) **බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා භික්ෂු භික්ෂුණී උභය සංඝයා විසින් පිළිපැදිය යුතු බුදුන් වදාළ කරුණු <u>තුනක්</u> සාකච්ඡා කරන්න.**

* භික්ෂු භික්ෂුණී උභය සංඝයා විසින් පරියත්තිය ආරක්ෂා කිරීම.
* බුදුරදුන් වදාළ ශාසනික පටිපත්තිය ආරක්ෂා කිරීම.
* පටිවෙධ ශාසනය ආරක්ෂා කිරීම යන ත්‍රිවිධ ශාසනය ආරක්ෂා කිරීමට කැපවීම.
* ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය යන සතර සංවර ශීලයෙන් යුතුව කටයුතු කිරීම.
* ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පවත්වාගෙන යාම.
* පැවිදි - උපසම්පදා සංඝකර්ම සිදු කිරීම.
* පොහොය විනය කර්ම පවත්වාගෙන යෑම. (විනයො නාම සාසනස්ස ආයු)

මේ ආදී කරුණු තුනක් ඇසුරින් පිළිතුර සැකසී තිබිය යුතුයි.

**එක් කරුණකට ලකුණු 2 බැගින් කරුණු තුනට ලකුණු 06යි.**

10.

(i) **බුදුසසුනේ උන්නතියට ක්‍රියා කළ බුද්ධකාලීන උපාසක උපාසිකා පිරිසට අයත් රජවරුන් <u>දෙදෙනකු</u> හා බිසෝවරුන් <u>දෙදෙනකු</u> නම් කරන්න.**

මගධාධිපති බිම්බිසාර රජ, පසේනදී කොසොල් රජ, අජාසත් රජ ආදී රජවරුන් අතරින් දෙදෙනෙකු

ඛේමා බිසව, සුප්පවාස කෝලිය ධීතාව, කෝසල මල්ලිකා බිසව, වේදේහිකා බිසව, සාමාවතී බිසව ආදී බිසෝවරුන් අතරින් දෙදෙනකු නම් කොට තිබිය යුතුයි.

**(ලකුණු 04යි)**

(ii) **සැදැහැයෙන් බුදුසසුනට මෙහෙවර කළ බුද්ධකාලීන උපාසක පිරිසට අයත් සිටුවරුන් <u>දෙදෙනකු</u> හා උපාසිකා පිරිසට අයත් සිටු දියණිවරුන් <u>දෙදෙනකු</u> නම් කරන්න.**

අනේපිඬු සිටුතුමා (සුදත්ත), ධනංජය සිටුතුමා, චිත්ත ගහපති, උග්ග ගහපති, නකුලපිතා ගහපති ආදීන් අතරින් දෙදෙනකු ද

සුජාතා සිටු දියණිය, විශාඛා සිටු දියණිය, නකුලමාතාව, සුප්පියා උපාසිකාව, කාළී උපාසිකාව ආදීන් අතරින් දෙදෙනෙකු ද දක්වා තිබිය යුතු යි.

**(ලකුණු 04යි)**

(iii) **ඉහතින් ඔබ සඳහන් කළ උපාසකයකුගේ හා උපාසිකාවකගේ ශාසනික සේවා කෙටියෙන් සාකච්ඡා කරන්න.**

උපාසකයෙකුගේ හා උපාසිකාවකගේ චරිතය ගෙනහැර දැක්වීමට වඩා ඔවුන් ශාසනිකව සිදු කළ සේවාවන් පෙන්වා තිබිය යුතුයි.

**එක් චරිතයකට අදාළ සේවාවට ලකුණු 03යි.**

**චරිත දෙකකට අදාළ සේවාවන්ට ලකුණු06යි.**

(iv) **බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා වර්තමාන උපාසක උපාසිකාවන් විසින් පිළිපැදිය යුතු යැයි ඔබ යෝජනා කරන කරුණු කෙටියෙන් විස්තර කරන්න.**

* භික්ෂු සංඝයා ආරක්ෂා කර ගැනීම.
* ශාසනයේ පැවැත්ම උදෙසා කුළ දරුවන් සසුන්ගත කිරීම.
* ශාසනික පිළිවෙත් මැනවින් ආරක්ෂා කිරීමට අනුබල දීම.
* සිව්පසයෙන් භික්ෂු සංඝයාට උපස්ථාන කිරීම.
* වෙහෙර විහාර ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම.
* ශීලවන්ත - ගුණවන්ත භික්ෂූන් වහන්සේගේ ශාසනික ජිවිතයට අනුග්‍රහය දැක්වීම.
* මෛත්‍රී සහගත කායකර්ම හා වාග් කර්ම පැවැත්වීම.

ආදී කරුණු ඇසුරින් පිළිතුර ලියා තිබිය යුතුයි.

සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.

**(ලකුණු 06යි)**